# හත් දෙනෙක් බිලිගත්ත නරියා කන්දේ ඛේදවාචකය



**නුවරඑළිය හීතලයි. හැමදාම එහෙමයි. හිරුතුරුවම වැටෙන මල් තුහිනවලින් නුවරඑළිය පෙනඛිපින වෙනවා. කොළඹිදි ඇත අහසෙ පාවෙනවා පේන වලාකුළු නුවරඑළියෙදි බිමට බහිනවා. ඒ වලාකුළු හැමදාම උදේට මල්ගොමු අස්සෙ හුරතල් වෙනවා. ඇස්ටමේනියා, බටන් අප්‍රුර, කාණේෂන්, රෝස මල් යායට පිපෙනවා. වේසි මල්වලට අණක් ගුණක් නෑ, ඒවා යාම් තැනම. ඉඳහිට සැකෙ ලිලි මලක් දෙකක් පිපිලා. නුවරඑළිය ලස්සන වෙන්නෙ අප්‍රේල් මාසෙට. රොබෝරියා මල් පිපිලා ඉවර වෙන්නෙ රෝස වසන්තයෙ අග. ඊට පස්සෙයි අවුරුද්දත් අරගෙන වසන්තය එන්නෙ.**

හැම වසන්තයකම වගේ මේදා වසන්තයේදීත් නුවරඑළියේ මල් පිපුණා. හිං හිරිකඩ මල් තුහින මල් පෙති උඩ වැටුණම පෙනුණෙ රෝස පාට කම්මුලකට කඳුළු වැටිලා වගේ. අප්‍රේල් මාසෙ පටන් ගන්නකොටම වැටුණු මහ වැස්සෙන් බදුල්ලෙ බණ්ඩාරවෙළ පැත්තෙ කඳු කඩාගෙන වැටුණා. දිය ඇලිවල වතුර බොර වුණා. ඒත් මිනිස්සු බලාගෙන හිටියෙ නිදහසේ හුස්මක් ගන්න දවසක් එනකල්. දෙදාස් දහනවයෙ ඉඳලම මිනිස්සුන්ට නිදහසේ නුවරඑළි යන්න බැරි වුණා. දහනවයේ අප්‍රේල්වල පාස්කු බෝම්බෙන් එක්ක පපුවෙ හදුණු ගැස්ම කොහේද ඉඳලා කඩං පැන්න කොරෝනාවක් හින්දා ඉවරට ගුණයක් වුණා. ඊට පස්සෙ තෙල් ටිකක් ගහගන්න පෝලිංවෙල නැගෙනවා මිසක් මිනිස්සුන්ට නුවරඑළියක යන්න ලැබුණෙ නෑ. ඔය ඔක්කොම ඉවර වෙලා මේ මිනිස්සු යාන්තං නිදහසේ හුස්මක් ගත්තා විතරයි. මේ අප්‍රේල් මාසෙ නුවරඑළිය මිනිස්සුන්ගෙන් පිරුණා. ඒ මිනිස්සු ඇවිද්දා, කෑවා, බිව්වා, නැටුවා, දැගලුවා. ඒ අස්සෙ...

ඔව් මේ ලියන්න හදන්නෙ ඒ කතාව. අවුරුදු පහකට පස්සෙ ආයෙමත් අප්‍රේල් මාසෙ අන්තිම කාලෙ ඔබට හිත රිදෙන කතාවක් ලියන්න වුණාට සමාවෙන්න. මම හැම දාකම පත්තරකාරයෙක් විදියට හරි නවකතාකාරයෙක් විදියට හරි උත්සාහ කරන්නෙ ඔබව සතුටින් තියන්න. ඔබට සතුටු හිතෙන දේවල් කියන්න. ඒත් මේ වෙලාවෙ එහෙම නෑ. ලස්සන නුවරඑළියෙ තිබ්බ සතුට එක මොහොතකින් ඉවර වුණු විදිය මට ලියන්න වෙලා. මේක මේ දුක ගැන වේදනාව ගැන කඳුළු ගැන කියන මාසයක් නෙමෙයි. මේ සතුට ඉතිරෙන මාසයක්. ඒත් ඒ මාසෙ අපි කී වතාවක් අඬන්න ඇතිද?

එක වතාවක් කොටුවෙ බෝම්බෙන් මිනිස්සු එකසිය දහතුනක් මියගියා. ඊට පස්සෙ මීතොටමුල්ලෙ කුණු කන්ද මිනිස්සුන්ගෙ ඔළුව උඩට කඩාගෙන වැටුණා. ඊට පස්සෙ පාස්කු බෝම්බෙ පිපිරෙව්වා. මේ වතාවෙ තවත් මරණ ගොඩක් එක්ක අපිට අවුරුද්ද නිමා වෙනවා. මිනිස්සු ගෙවල් ඉස්සරහ හදපු මල් පැළවල් ගලවපු ගමන්ම සුදු කොඩි දාන්න වෙලා. මේ මරණ එකක් එකක් ගානෙ වෙන වෙනම විස්තර කරන්න මට බෑ. අපි පත්තරකාරයො තමයි. අපිටත් හිතක් පපුවක් තියෙනවා. රස්සාව වෙනුවෙන් මළමිනී කඳු අස්සෙ ඇවිදලා දැං මට හති. ඒ හැම වෙලාවකම මට දැනෙන්නෙ මේ මගෙ නෑදෑයො කියලා. අරණායක සාමසර කන්දෙ රොන්මඩ අස්සෙ වැළමිටෙන් පහළ අත් කෑල්ලක් හම්බුණාම මිනිස්සු දුවගෙන ආවා ඒ අපේ අම්මගෙ කියලා. සමහරු කිව්ව නෑ ඒ මගෙ වයිෆ් කියලා. සමහරු බැලුවා ඒ දුවගෙ ද කියලා. මගෙ හත්මුතු පරම්පරාවෙ කවුරුවත් සාමසර කන්දෙ නොහිටියත්, සත්තයි මටත් හිතුණා ඒ අත අල්ලලා බලන්න. මේ හැම වෙලාවකම එහෙමයි. අප්‍රේල් විසිඑක බෝම්බෙන් ඉරිතැලුණු කාත්තන්කුඩියෙ සියොන් පල්ලියෙ මළ සිරුරු කොටස් අස්සෙ ඇවිදින කොට අපිට හිරිකිත හිතුණෙ නෑ. ඒ මිනිස්සු කතා කරන හඬ හිනා වෙන හඬ මට ඇහුණා. අපි ආපුහු ගෙදර ආවෙ විශාල පසුතැවිල්ලක් එක්ක. මේ වතාවෙත් ඔබට මරණයේ වේදනාව ගැන ලියන්න වුණු එකට මට සමාවෙන්න.

නුවරඑළියෙ මීදුම් අහස දැන් තියෙන්නෙ සුදු කොඩි එල්ලලා. කඳු මුදුන් මළගෙදර යන්න ලෑස්ති වෙලා වෙන්න ඇති. මම ඔබට නොදන්න කතාවක් කියන්නම්. මේක ඇත්තටම කතා දෙකක්. ඒ දෙකම ඔබ කියවන්න පරිස්සමට. හිත තැලෙන තැන් රිදෙන තැන් දැක්කොත් පැනලා දුවන්න. එහෙමත් බැරි නම් කියවන එක නවත්තන්න. අවුරුදු එකොළහක් තිස්සෙ මම ලියන ඒවා කියවපු ඔබ මට එහෙම කළා කියලා මම තරහ වෙන්නෙ නෑ.

පළමු කතාව 2019 අප්‍රේල් මාසෙ 21. එදත් නරියා කන්දෙ රේස් එක තිබ්බ දවසක්. එදත් මේ වගේම මිනිස්සු ඇවිල්ලා හිටපු දවසක්. එදා ඒ වෙනකොට අපි හිටියෙ සාමකාමී රටක. යුද්ධය ඉවර වෙලා. බය හැක නැති මිනිස්සු හුස්ම ගත්තෙ නිදහසේ. එදා හිතාගන්න බැරි විදියට බෝම්බ පිපිරුවා. කොළඹ ගිනි ගන්න කොට ඒ රස්නෙ නරියාකන්දට දැනුණා. එදා රේස් එක අතර මඟ නතර කළා. එදා කොයි වෙලාවෙ බෝම්බයක් පුපුරයිද කියලා බයෙන් ගැහුනු මිනිස්සු ආගිය අතේ ගියා. රේස් එකේ වැඩකටයුතු පිළිවෙළකට ඉවර කරන්නවත් බැරි වුණා. සංවිධායකයන්ට කරකියාගන්න දෙයක් නැතිව ගියා. එදා රතු කොඩි දාලා නතර කරපු රේස් එක වෙනුවෙන් කොළ කොඩියක් වනන්න අවුරුදු පහක් ගියා. එදා රේස් එක නතර වුණු තැනින් ආයෙත් පටන් ගත්තෙ 2024 දී. 20, 21, 22, 23 හැම අවුරුද්දක්ම ඔහේ ගෙවිලා ගියා. 2024ත් රේස් එකට දවස් නියම වෙන්නෙ 21 වැනිදාටමයි. ඒත් මේ 21 වැනිදා මොකක් වෙයිද කියලා කාටවත් අලුතෙන් හිතන්න උවමනාවක් තිබුණෙ නෑ. බලාපොරොත්තු ගොඩක් එක්ක කෑම බීම හදාගෙන මේ මිනිස්සු රේස් එක බලන්න ආවා. වෙනදා නරියාකන්ද රේස් එක ලෑස්ති කරපු විදිය ගැන මිනිස්සුන්ට අසීමිත විශ්වාසයක් තියලා තිබ්බා. ඒ විශ්වාසය සියලු දෙනා විසින්ම බින්දා. පළමු දවසෙ රේස් එකක් කරනවා වගේ, පළමු වතාවට රේස් එකක් පදිනවා වගේ, පළමු වතාවට රේස් එකක් බලන්න ආවා වගේ දේවල් වෙලා තිබ්බෙ.

කොහොම වුණත් මේ තරගය නිමාවෙලා තියෙන්නේ මරණ හතකුත් එක්ක. ඇත්තටම තරගයක් නිමා වෙන්න ඕනේ කුසලානයක් එක්ක. ජයග්‍රහණයක් එක්ක. පදක්කම් එක්ක. ඔල්වරසන් එක්ක. අපිට අහන්න ලැබුණා මේ මරණ හතකින් කෙළවර වෙච්ච තරගය අවසානයේත් ඩී.ජේ. පාටියක් දැම්මා කියලා. අප්‍රසන්න නිසා අපි ඒ ගැන කතා නොකර ඉමු. කොහොම වුණත් මේ තරගය සම්බන්ධයෙන් මෝටර් රථය ධාවනය කරපු

**දූවිල්ලෙන් වැහුණු ධාවන පථය වැරදිද?**

**කහ කොඩිවලට වේගය ගැළපුණාද?**

**නරඹන්නෝ අනවශ්‍ය විදියට ආවද?**

**සංවිධායකයො තීන්දු ගත්තෙ නැද්ද?**

**ධාවකයො අතේ වැරද්ද තිබුණද?**



මහේෂ් කෝදාගොඩ කියන කතාව අපි ඇහුවා. මහේෂ්ලා කියන්නේ මේක රේස් ඩිරෙක්ටර් විසින් මීට කලින් නවත්තන්න තිබුණු තරගයක් කියලා. කහ කොඩිය වනපු පමණින් වාහනය නවත්තන්න බැහැ කියලා ඔහු කියනවා. එතකොට මේ වාහනය වේගය පාලනය කරගෙන නැවත්වීමට සූදානම් වීම, එහෙම නැත්නම් අවදානමක් ඇති බව තමයි කහ කොඩියෙන් දැනුම් දෙන්නේ. නමුත් කහ කොඩිය නිසි වෙලාවේ වැනුවද? කහ කොඩිය වනනකොට මෝටර් රථ තරගයක් සඳහා මේ ධාවන පථය සුදුසු මට්ටමින් තිබුණද? ඒ වගේම රතු කොඩිය වනන්න පරක්කු වුණාද? රතු කොඩිය වනපු ගමන් තරගය නවත්වන්න ඕනේ. එහෙම නැතුව රතු කොඩිය නොදැක තරගය නැවැත්වීමේ අයිතියක් නෑ තරගකරුවන්ට. මේ සම්බන්ධයෙන් විවිධ කාරණා විවිධ පාර්ශ්වවලට එල්ල වෙනවා.

මේ ලිපිය ලියන මොහොත වෙනකොටත් මෝටර් රථ ධාවකයන් දෙදෙනෙක් අත්අඩංගුවට පත්වෙලා තියෙන්නේ. ඔවුන් නිසයි මේ රිය අනතුර සිද්ධ වුණේ කියන එක මූලිකව පේන කාරණයක්. හැබැයි මේක පිටිපස්සේ තියෙන බොහෝ කාරණා පැහැදිලි කරගත යුතුයි. නරියාකන්ද ධාවන පථය සූදානම් කරලා තිබුණු විදිය නිවැරැදිද? නිවැරැදි ආකාරයෙන් පස් බැම් යොදලා, නරඹන්නන්ට කිට්ටු වෙන්න බැරි පරිසරයක් නිර්මාණය කරලා, ආරක්ෂාව පිළිබඳ ඔවුන්ව නිසි ආකාරයෙන් දැනුවත් කරලා තිබුණද? ටිකට් එක පිටුපස 'මාරාන්තිකයි' කියලා ටයිප් කරන එක නෙවෙයි. ලියුම්කරු පත්තරකාරයෙක් වුණාට රේස් බලන හැටි දන්නේ නෑ. කොච්චර පරතරයකින් ඉන්න ඕනෙද, අවදානම් තැන් මොනවද, බලන්න ඕනේ තැන් මොනවද කියලා මම පුද්ගලිකව දන්නේ නෑ. මම වගේ සාමාන්‍ය මිනිස්සු ලක්ෂ ගානක් ලංකාවේ ඉන්නවා. රේස් ගැන දන්න අයට රේස් එකෙන් ආරක්ෂා වෙන්න පුළුවන්. ඒ වගේම මේ ධාවන පථය ගැන අපි බොහෝ කමෙන්ට්ස් දැක්කා. සාමාන්‍යයෙන් මේ වගේ දූවිලි විහිදෙන ධාවන පථයකට හැම රේස් එකකින්ම පස්සෙ වතුර ඉසින්න ඕනේ කියලා. නමුත් මේ රේස් එකේ වතුර ඉහලා තිබුණේ නෑ. අපි දන්නවා, අපිට පේනවා දූවිල්ල ඇවිස්සෙන හැටි. ඒක තරගයක ජයග්‍රාහකයා තරගය ඉවර වෙලා තවත් වටයක් පදිනවා. ඒ කියන්නේ ඔහු මේ තරගය අවසාන කිරීමේ කොඩිය දැකලා නෑ. මේ සියලු දෙනාම පළපුරුදු තරගකරුවන්. නමුත් මේ තරගය සූදානම් කරද්දී නිවැරැදිව මේ ස්ථානවලට වතුර ඉහලා මේක හරියට කළා නම් මේ තරගය මීට වඩා සුන්දර නිමාවකින් කෙළවර කරන්න තිබුණා. නමුත් ඒක සිද්ධ වුණේ නෑ. ඒ වගේම මේ ධාවන පථයට එන මෝටර් රථවලට අපි පැහැදිලිව දන්න කාරණයක් තමයි කොළ, කහ සහ රතු පැහැයෙන් කොඩි තුනක් තියෙනවා. කොළ කොඩිය වනනවා කියලා කියන්නේ තරගය සාමාන්‍ය පරිදි පවත්වන්න පුළුවන්. කොළ කොඩියක් වනනවා කියලා කියන්නේ තරගයට අවශ්‍ය කරන සාමාන්‍ය පරිසරය ඒ තරග භූමියේ තියෙනවා කියන එක. නමුත් එහෙම තත්ත්වයක් නැතුව තියෙද්දීත් කොළ කොඩියේ තත්ත්වය තමයි සාමාන්‍ය මට්ටමේ තියෙන්නේ. එක තරගයක මෝටර් රථ 4ක් පෙරළෙනවා. ඊට පස්සේ උපුල්වන් සේරසිංහගේ මෝටර් රථය සහ තවත් මෝටර් රථයක් ට්‍රැක් එකේ පෙරළිලා තියෙනවා. එහෙම තියෙද්දීත් තරගය පැවැත්වෙනවා. එහෙම තරගය පැවැත්වෙද්දී තමයි මහේෂ් කෝදාගොඩගේ සහ තවත් වාහන දෙකක් අනතුරට ලක්වෙන්නේ. උපුල්වන් සේරසිංහගේ රථය පෙරළිලා තියෙද්දීත් සාමාන්‍ය පරිදි රේස් එක පැවැත්වෙනවා. ඒ වගේම මේ මෝටර් රථ පෙරළිලා තියෙන බවක්වත්, වංගුවක් පිළිබඳ අවබෝධයක්වත් නිසි ආකාරයෙන් ලැබෙන්නේ නෑ තරගකරුවන්ට. තරගකරුවන්ට මේ වෙලාවේ මේකෙන් මෙහෙම ගැලවෙන්න බැරි හේතුව තමයි ඔවුන් දැනගන්න ඕනේ තමන්ට නිසි ආකාරව ධාවන පථය පේන්නේ නැත්නම් තරගයේ යෙදෙනකොට පරිස්සම් වෙන්න. ඒ ගැන ඔවුන් ආරක්ෂා වුණාද, නිසි පියවර ගත්තද, ඒ වගේම ජයග්‍රහණය විතරක් නෙවෙයි තමන් බලාපොරොත්තු විය යුත්තේ කියන එක ගැන ඔවුන් කල්පනා කරන්න ඕනේ. ඒකට හේතුව මේ තරගයේදී එක චෝදනාවක් එල්ල වෙනවා තරගකරුවන්ට ඔවුන් කහ කොඩිය තියෙද්දීත් වේගය අඩු කළේ නෑ කියලා. ඒකට මෝටර් රථ ධාවකයන්ගේ උත්තරය තමයි කහ කොඩියක් දැක්ක පමණින් අපිට එක පාරටම බ්‍රේක් ගහලා වාහනේ නවත්තගන්න බෑ කියන එක. ඒ වගේම කහ කොඩිය වනන්න ඕනේ මීටර් 100ක් 200ක් ඈතින් පේන්න. ඒ වගේම මෙතැන තියෙන ප්‍රශ්නෙ තමයි කහ කොඩිය පේනවද කියන එක. මොකද දූවිල්ලෙන් වැහිච්ච තරග බිමක අපිට මේ වීඩියෝවල පේනවා අනතුරට පත්වෙච්ච ස්ථානයේ අනතුරක් සිදුවුණා කියලාවත් පේන්නේ නෑ. ඒ තරමට දූවිලි විහිදිලා තියෙන්නේ. මේ අනතුරෙන් කෝන මාස්ටර්ලා කිහිප දෙනකුත් මියයනවා. කෝන මාස්ටර් කියන්නේ රථය ධාවනය කරන භූමියේ ඉන්න කොඩිය වැනීමේ රාජකාරිය කරන අය. අපි දැක්කා එක තැනකදී ඉතා කනගාටුදායක සිදුවීමක්. මේ සම්බන්ධයෙන් මහෙස්ත්‍රාත් පරීක්ෂණය සිදුවූ අවස්ථාවේ මෙතැන හිටපු අය කවුද ඉන්නේ කියලා අහපුවාම ඔවුන්ට උත්තරයක් නෑ. මොකද ඔවුන් සියලු දෙනාම මියගිහිල්ලා. මෙහෙම රේස් එකක් කෙළවර වෙනවා 2019 අප්‍රේල් මාසේ 21 වැනිදා කොඩිය වනපු තැනින්ම. ඒ කියන්නේ 2019 අප්‍රේල් 21 වැනිදා රතු කොඩි වනලා තරගය නවත්වනවා. ඒ වගේම 2024දීත් ඒ විදියටම තරගය අතරමගදී නවත්වන්න සිද්ධ වෙනවා. හත් දෙනෙක්ගේ මරණත් එක්ක. මේ මරණ ගැන එකින් එක විස්තර කරන්න අවශ්‍ය නෑ. කනගාටුවට කරුණ වෙන්නේ පුංචි ගෙදරක හිටපු පුංචි දියණියක් මහ රේස් එකක් බලන්න සීයත් එක්ක ගිහිල්ලා ලොකු මාමලා රේස් පදින දිහා බලාගෙන ඉඳලා තමන්ට නැති මෝටර් රථය අනෙක් අය පදින දිහා බලාගෙන ඉන්නකොට කඩාගෙන වැදුණු මෝටර් රථයක් ඒ පුංචි කැකුලියගේ ජීවිතය අරගෙන යනවා. මේ ජීවිත පරිස්සම් කරන්න බැරි නම් ආයේ මෝටර් රථ රේස් තියන්න එපා. ධාවන පථවල මියගිය පළමුවැනියා දෙවැනියා නෙවෙයි. ආනන්ද වෙඩිසිංහ මියයනවා. මේ වගේම තවත් එක තරගකරුවෙක් ලංකාවේ ප්‍රසිද්ධ ධාවකයෙක්. ඔහු මුළු රටම දන්න කෙනෙක්. නමුත් ඔහු අද වෙද්දී ජීවතුන් අතර නෑ. මේ විදියට මරණ එකක් දෙකක් තුනක් හතරක් පහක් සිද්ධ වෙනකොටවත් අපි නිසි ආකාරව පියවරක් නොගන්නවා නම්.

ඩිල්ෂාන් බණ්ඩාරනායක මිනි කූපර් රථය අනතුරට පත්වෙලා මේ විදියටම මියයනවා. ඒත් ඔහුගේ මරණය පිළිබඳ වාර්තාව පළවෙන්නේ 2008 අප්‍රේල් මාසේ 21 වැනිදා. මේ විදියටම එදත් ඔහුව රෝහලට රැගෙන යන්නවත් පහසුකම් නොතිබුණු බව අද සමහර තැන්වලදී වාර්තා වෙනවා. එක පාරක් දෙපාරක් තුන්පාරක් හතරපාරක් මේ විදියේ දේවල් සිද්ධ වෙනකොට ඇයි අපිට බැරි මේවාට නිසි නීති පනවන්න? මේවාට නිසි පියවර ගන්න? දවසක් දෙකක් කාව හරි අල්ලගෙන ඇවිල්ලා කූඩුවේ දාලා ප්‍රශ්න විසඳන එක නෙවෙයි විය යුත්තේ. ඒ නිසා කනගාටුයි මේ සම්බන්ධයෙන් එකින් එක විස්තර කරනවාට වඩා මම හිතන්නේ අවශ්‍ය වෙන්නේ මේ කාරණය නිසි ආකාරව පැහැදිලි කරගන්න එක.

මේ අනතුරෙන් පස්සේ අපි ගාව ඉතුරු වෙච්ච ප්‍රශ්න ටික මෙන්න මේ ටික. මේවාට උත්තර දෙන්න ඕනේ විවිධ පාර්ශ්ව. මෝටර් රථ තරගාවලියක් සංවිධාන කරද්දී ඒ තරගාවලිය සම්බන්ධයෙන් ගතයුතු අවම ආරක්ෂක ක්‍රියාමාර්ගවත් අරගෙන තිබෙනවාද යන්න පිළිබඳ සැලකිලිමත් වෙන ආයතනයක් හෝ කණ්ඩායමක් ශ්‍රී ලංකාවේ එහෙම නැත්නම් ලෝකයේ ඉන්නවද? මෝටර් රථ තරගාවලියක් සම්බන්ධව අදාළ ධාවන පථය සකස් කරන්න තියෙන නිවැරැදි ක්‍රමවේදයක් තියෙනවද? ආරක්ෂක ක්‍රියාමාර්ග සම්බන්ධව ජාත්‍යන්තර වශයෙන් පිළිඅරගත්ත නිර්නායක තියෙනවද? එහෙම තියෙනවා නම් ඒවා මේ අය විසින් ක්‍රියාත්මක කරලා තියෙනවද? ආරක්ෂක බැරියර් එහෙම නැත්නම් නරඹන්නන් සහ ධාවන පථය අතර යොදන ආරක්ෂක වැටවල් හෝ ටයර් එහෙම නැත්නම් වෙනත් ආකාරයකින් පස් කඳු නිසි ආකාරව යොදාගැනීමක් මේ තරගාවලියේදී සිදුවෙලා තියෙනවද? එහෙම සිද්ධ වෙලා නැත්නම් ඒ නැති වීම සම්බන්ධව වගකීම බාරගත යුත්තේ කුමන පාර්ශ්වයක්ද? මෝටර් රථ තරගාවලියකට තරගකරුවෙක් ඉදිරිපත් වෙනකොට ඒ තරගකරුවාට වගකීමක් නැද්ද ධාවන පථය සම්බන්ධව ගැටලුවක් තියෙනවා නම් ඒ පිළිබඳ දැනුවත් කරන්න?

ඒ වගේම ධාවන පථයේ දූවිලි සහිත බව පේනවා නම් තරගකරුවන්ට තරගයට ඉදිරිපත් නොවී ඉන්න හෝ තරගයේ අනතුරුදායක බව දැනුවත් කරන්න වගකීමක් තියෙනවද? ධාවන පථය දූවිලි සහිතයි, ධාවනය කරන්න බෑ කියන එක දන්නවා නම් තරගකරුවාගේ වේගය අඩුකළ යුතුද? ධාවන පථය දූවිලි සහිත බව පෙනෙද්දිත් කහ කොඩි දාලා තියෙද්දිත් තරගකරුවන් පැයට කිලෝමීටර් 160ක වේගයෙන් වාහන ධාවනය කළ යුතුද? ඒ වගේම තරගකරුවාට මාර්ගය නොපෙනෙනවා නම් කහ කොඩි හෝ රතු කොඩි නොදැම්මත් ඔහු මොකක්ද කරන්න ඕනේ? එකක් ඔහුගේ ජීවිතය පිළිබඳ සහ නරඹන්නන්ගේ ජීවිත පිළිබඳ අනාරක්ෂිත තත්ත්වය ගැන සැලකිලිමත් වීමට තරගකරුවාට වගකීමක් නැද්ද? තරගකරුවන් තරගයකට ඉදිරිපත් වීමේදී අදාළ නිර්නායක පිළිබඳ සොයා බලන්නේ නැද්ද? නරඹන්නන් තරගය නරඹන්න එනකොට ඒ අයව දැනුවත් කිරීමේ නිසි වැඩපිළිවෙළක් තියෙනවද? අපි දැක්කා මේ ටිකට් එක පිටුපස ඉංග්‍රීසි භාෂාවෙන් යම් යම් දේවල් ටිකක් මුද්‍රණය කරලා තියෙනවා. ඇත්තටම මේ ආපු සියලු දෙනා ඉංග්‍රීසි භාෂාව දන්නවද? ඩයරබා වත්තේ මේ භාෂාව කියවාගන්න පුළුවන්ද? තරගාවලිය නරඹන්න එන පිරිස ප්‍රමාණය යම් සීමාව ඉක්මවා යනවා නම් ඒ සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියාමාර්ගය ගැන දැනුවත්ද? අපි දකිනවා මේ සම්බන්ධව නරඹන්නන් දිගින් දිගටම ප්‍රශ්න කරනවා වෙනදා විනාඩි කීපයෙන් කීපයට නරඹන්නන්ව දැනුවත් කරනවා, ඔවුන් ඒ ස්ථානයෙන් ඉවත් කරනවා නමුත් මේ වතාවේ එහෙම දෙයක් වුණේ නෑ කියලා.

ඒ වගේම අපි දැක්කා චෝදනාවක් තියෙනවා වතුර යොදලා මේක හරියට තරගයෙන් තරගයට සකස් කළේ නෑ කියලා. එතකොට නරඹන්නන්ට වගකීමක් තියෙනවාද මේ ප්‍රේක්ෂකාගාරයේ බැම්ම ගාවට එන්නේ නැතුව යම් තැනකින් නතර වෙන්න? එතකොට මේ සියල්ලම ප්‍රශ්න. මේ ප්‍රශ්නවලට දැන් අපි උත්තර හොයන්න කලබල වෙන්නේ මේ අනතුරක් සිදුවීම හේතුවෙන්. අනතුර සම්බන්ධයෙන් වැරැදිකාර පාර්ශ්ව විශාල ප්‍රමාණයක් ඉන්නවා. ඒක අපි හොඳාකාරවම දන්නවා. තරග සංවිධායකයන් උත්සාහ කරනවා නම් මෝටර් රථ ධාවකයන්ට හෝ නරඹන්නන්ට චෝදනා කරලා මේකෙන් බේරෙන්න කිසිසේත්ම ඔවුන්ට හැකියාවක් නෑ. ඔවුන්ට තියෙන චෝදනා මොනවද?

01. ධාවන පථය නිසි ලෙස සකස් නොකිරීම. ඔවුන් ධාවන පථය නිසි ලෙස සකස් කරලා නෑ වගේම ධාවන පථයට යොදාගත යුතු නිවැරැදි ආරක්ෂක බැම් යොදලා නෑ. ඒ වගේම ආරක්ෂක බැම්වල වාහනයක් හැපුණොත් ඒ වාහනය එළියට විසිවෙන ආකාරයට බැම් සකස් කිරීම බරපතළ වරදක්. වෙනදා සිදුවෙන්නේ ධාවන පථය තුළටයි වාහනය වැටෙන්නේ. ඒ නිසා මේ ආකාරයෙන් ධාවන පථය සකස් කිරීම පිළිබඳ ප්‍රශ්නයක් තියෙනවා.



ජීවන පසන් තිළිණ

02. ධාවන පථයේ දැඩි දූවිලි සහිත බවක් තියෙන බව පෙනි පෙනිත් වෙනදා යෙදූ උපක්‍රමයක් වෙච්ච වතුර යෙදීම මේ වතාවේ සිදු නොකිරීම ඔවුන් සිදුකළ තවත් වරදක්.

03. ඒ වගේම අනතුරු කීපයක් වෙලා තියෙද්දීත් කහ කොඩි දාලා තරගය ස්ලෝ කරන්න ඔවුන් පියවර ගන්න පරක්කු වීම ඉතා බරපතළ ප්‍රශ්නයක්. අපි දන්නවා මේ තරගයේදී උපුල්වන් සේරසිංහගේ සහ තවත් තරගකරුවකුගේ වාහන දෙකම ට්‍රැක් එක උඩ පෙරළිලා තියෙද්දී තරගය පැවැත්වුණා. එතකොට ඇයි ඔවුන් තරගය නවත්වන්න මේ තරම් පරක්කු වුණේ? ඇත්තටම කහ කොඩි වනන අය ඉන්න ඕනේ කොතැනද? කහ කොඩි වනන අය සම්බන්ධයෙන් අපි දන්නවා කහ කොඩි වනපු හතර දෙනෙක් මේ වෙද්දී ජීවතුන් අතර නෑ. කෝන මාස්ටර්ලත් ඇතුළුව. මේකෙදී එකක් තමයි තරගකරුවන්ගේ ආරක්ෂාව සහ තරගයේ යෙදෙන අනෙක් නිලධාරීන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් සැලකිලිමත් විය යුතුයි. ඒක වෙලා තිබුණේ නෑ. ඒ වගේම ප්‍රේක්ෂකයන් නිවැරැදිව ඉන්න ඕනේ තැන ප්‍රේක්ෂකයන්ට තීරණය කරන්න දෙන්නේ නැතුව තරග සංවිධායකයන් තීරණය කළ යුතුයි. ඒ සඳහා ආරක්ෂක බැම් යොදලා කරන්න ඕනේ. ඒ වගේම අපි දන්නවා මේකට හමුදාව සම්බන්ධයි. ඔවුන්ට පුළුවන්කම තිබුණා නිලධාරීන් යොදලා නරඹන්නන්ව නිසි ලෙස ස්ථානගත කරන්න. එහෙම දෙයක් කරලා තිබුණේ නෑ. ඒවා වැරැදියි.

ඒ වගේම මෝටර් රථ ධාවකයන්ට තියෙන චෝදනාව තමයි කහ කොඩි දාලා තියෙද්දීත් ඔවුන් වේගයෙන් රථ ධාවනය කිරීම. මොකද මේ තරගයේ පිටිපස්සේ හිටපු තරගකරුවන්ට තමයි මේ චෝදනාව එල්ල වෙන්නේ. කිහිප දෙනෙක් අත්අඩංගුවට පත්වෙලා තියෙනවා මේ වෙද්දී. නොසැලකිලිමත් රිය ධාවනයක් සිද්ධ වුණාද පිටියේ කියන එක ගැන හොයා බැලිය යුතුයි. අපිට පේන විදියට ඇත්තටම ඔවුන් නොසැලකිලිමත්ව ධාවනය කරනවා. මහේෂ් කෝදාගොඩගේ වාහනය පෙරළුණාට පස්සෙයි ඊළඟ වාහනය ඇවිල්ලා හැප්පෙන්නේ. එතකොට ඔහු දන්නවා කහ කොඩියක් දාලා තියෙන්නේ කියලා. කහ කොඩියක් දාලා තියෙනවා නම් ඔහු කළ යුත්තේ තමන්ගේ වාහනය පාලනය කරගත හැකි වේගයකින් ධාවනය කිරීම.

කහ කොඩියක් දාලා තියෙද්දී වාහනය පාලනය කරගත නොහැකි තත්ත්වයට පත්වෙනවා කියන්නේ ඔහු කරලා තියෙන්නේ වැරැද්දක්. අපිට පේනවා කහ කොඩිය වනනවා. කහ කොඩිය ඔහුටත් පේනවා. අපිට පේනවා වීඩියෝවල ඔහුට සැලකිය යුතු දුරක් තියෙනවා. අපි දන්නවා පැයට කිලෝමීටර් 160ක විතර වේගයෙන් යන වාහනයක් වුණත් මීටර් 100ක් 200ක් ඇතුළත නවත්තගන්න බැරි වුණාට වේගය අඩුකරන්න පුළුවන්කම තියෙනවා. ඔහු වේගය අඩු කළා නම් මේක වෙන්නේ මෙහෙම නෙවෙයි. ඔහු වේගය අඩු කළේ නැහැ සහ ඔහුගේ වාහනය ට්‍රැක් එකෙන් එළියට යනවා වගේ එකක් අපිට පේනවා.



# ඉන්දියාව ආයෙත් මෝදිටද? නැතිනම් ගාන්ධිලාටද?

**ශ්‍රී ලංකාවේ නම් මහ මැතිවරණයක් පැවැත්වෙන්නේ එක් දිනයක් හෝ දින දෙකක් ඇතුළතදිය. එනම් එක් දිනක් ඡන්ද විමසීමටත්, තවත් දිනයක් ඡන්ද ගණන් කිරීමට සහ ප්‍රතිඵල ප්‍රකාශයට පත්කිරීමටත් භාවිත කරනු ලබයි. ලෝකයේ බොහෝ රටවල පැවැත්වෙන විවිධාකාරයේ මැතිවරණයන් සඳහා මේ ආකාරයේ විවිධ කාලවකවානු අදාළ කරගනු ලබයි. එම කාලයන් නිර්ණය කරනු ලබන්නේ එම රටවල විශාලත්වය සහ ජනගහනයට අනුවය. එනම් මේ ආකාරයට ලොව විශාලතම මහ මැතිවරණය පවත්වනු ලබන රට කුමක්ද? ඒ සඳහා කුමන කාලයක් ගතවනු ලබන්නේද? මෙතෙක් ලෝක වාර්තා සහ දත්තවලට අනුව එම සුවිශාලතම මහ මැතිවරණය පවත්වන රට වන්නේ අපගේ ශ්‍රී ලංකාවට යාබද දේශය වන ඉන්දියාවය. ලෝක දේශපාලනික විශ්ලේෂණයන්ට අනුව මෙලෙස ඉන්දියාවේ පැවැත්වෙන මහ මැතිවරණය සඳහා හරියටම මාස එකහමාරක (දින 44ක) කාලයක් ගතවන අතර, මෙය ලෝකයේ විශාලතම ප්‍රජාතන්ත්‍රවාදී මැතිවරණය ලෙස සැලකෙයි. මේ දිනවල ඉන්දියාවේ 2024 මහ මැතිවරණය අරඹා ඇත්තේ මේ ආකාරයටය.**

ඉන්දියාව යනු අද ලෝකයේ වැඩිම ජනගහනය සිටින රට බවට වාර්තා වෙයි. මුලින් එහි අංක එකට චීනය තිබුණද මෙයට වසර දෙකකට පමණ ඉහතදී එම වාර්තාව බිඳදැමීමට ඉන්දියාව සමත් විය. එනම් මේ වන විට ඉන්දියාවේ සමස්ත ජනගහනය කෝටි 142ක් බව වාර්තා වන අතර, දෙවැනි ස්ථානයට පත් චීනයේ ජනගහනය එම ප්‍රමාණයට වඩා මිලියන දෙක තුනක් පමණ අඩුය. ආසියාවේ මහා බලවතා ලෙස සැලකෙන්නේ චීනයයි. ඉන් පසුව දෙවැනි ස්ථානය ගන්නේ ඉන්දියාවය. මෙලෙස ලොව විශාලතම ජනගහනය සිටින ඉන්දියාවේ මැතිවරණ පැවැත්වීම යනු මහා විශාල කාරියකි. එනම් එම දැවැන්ත මෙහෙවර සඳහා වැයවන මහා ධනස්කන්ධයද අසීමිතය. එහිදී රාජ්‍ය පාර්ශ්වයෙන් වැයවන ධනයට අමතරව එක් එක් මැතිවරණ අපේක්ෂකයන් විසින් වැයකරනු ලබන ධනයද විශාලය. එසේම ඉන්දියාවේ මැතිවරණයක් පැවැත්වීම යනු දින සති හා මාස ගණන්ද ගතවන පුළුල් කාර්යයකි. එහිදී ඉන්දියාවේ මහ මැතිවරණය නොහොත් 'ලෝක් සභා මැතිවරණය' පැවැත්වීම යනු වදනින් පවා විස්තර කර නිමාවක් නොදකින කතාවකි. එනම් මෙයට යම් කලකට පෙර සිට මෙම මහ මැතිවරණයේ වගතුග මාධ්‍ය වෙතින් හෙළිදරව් කර තිබිණි. මෙම විස්තරවලට අනුව 2024 ඉන්දීය මහ මැතිවරණය 2024 අප්‍රේල් 19 වැනිදා ආරම්භ වුණු අතර, 2024 ජුනි 01 දා නිමාවට පත්වෙයි. මෙම ඡන්ද විමසීම අදියර 07කින් දින 44ක් පුරා පැවැත්වෙන අතර, ඉන්දීය පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් 543ක් තෝරාගැනීම සිදුකෙරෙයි. මෙම මහා සටනේ අවසාන ප්‍රතිඵල නිකුත් කරනු ලබන්නේ 2024 ජුනි 04 වැනිදාය. නව රජයක් පිහිටුවීම සඳහා ආසන 272ක බහුතරයක් අවශ්‍ය වෙයි. මිලියන 960ක ජනතාවක් ඡන්දය දීමට සුදුසුකම් ලබා ඇත.

මෙවර 2024 ඉන්දීය මහ මැතිවරණය (ලෝක් සභා මැතිවරණය) අදියර 07කින් පැවැත්වෙන අතර, පළමු අදියර අප්‍රේල් 19 ඇරැඹි අතර, අප්‍රේල් 26 වැනිදා දෙවැනි අදියරත්, මැයි 07 දා තෙවැනි අදියරත්, මැයි 13 වැනිදා සිවුවැනි අදියරත්, මැයි 20 වැනිදා පස්වැනි අදියරත්, මැයි 25 වැනිදා සයවැනි අදියරත්, ජුනි 01 වැනිදා හත්වැනි අදියරත් පැවැත්වෙන බව ඉන්දීය මැතිවරණ කොමිසම නිකුත් කර ඇති නිවේදනයක සඳහන් වෙයි. මෙම අදියර 07 අවසාන වීමත් සමග ඡන්ද විමසීම අවසන් වන අතර, ඡන්ද ගණන් කිරීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම ජුනි 04 දා සිදුකෙරෙනු ඇත. මෙසේ පසුගිය අප්‍රේල් 19 වැනිදා ඇරැඹි මහ මැතිවරණය සඳහා ඡන්ද ප්‍රකාශ කිරීමේ මධ්‍යස්ථාන මිලියනයක් ඉන්දියාව පුරා පිහිටුවා ඇත.

## තීන්දුව ළඟ ළඟම එනවා...

**පුද්ගලයන් කෝටි 142ක් සිටින ඉන්දියාව යනු ලෝකයේ වැඩිම ජනගහනය සිටින රට ලෙස වාර්තා වෙයි. මේ අනුව 2024 ඉන්දීය මහ මැතිවරණය සඳහා නූතන තාක්ෂණික මැතිවරණ ක්‍රම භාවිත කර ඇති බවද පැවැසෙයි. එනම් ඩිජිටල් ක්‍රමයට ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා ඉලෙක්ට්‍රොනික් ඡන්ද යන්ත්‍ර මිලියන ගණනක් භාවිත කිරීමට ඉන්දීය රජය කටයුතු කර ඇත. මෙම ක්‍රමය මගින් පහසුවෙන් සහ ඉතා නිවැරැදි ලෙස ඡන්ද ගණනය කිරීම සිදුකෙරෙයි. ඒ අනුව මිලියන 969ක ජනතාව තම ඡන්දය මේ වන විට ප්‍රකාශ කරමින් සිටියි. මෙම මහ මැතිවරණ සංග්‍රාමයේ අවසන් ජවනිකාව දක්නට හැකි වන්නේ ඉදිරි 2024 ජුනි 04 වැනිදාටය.**

## ලංකාවත් ලෑස්තිවෙලා ඉන්නේ...

මේවායෙහි මැතිවරණ නිලධාරීන් මිලියන 15ක් පමණ මේ වන විට සේවයෙහි නියුක්තව සිටියි. මේ ආකාරයට බලන විට මෙම සුවිශාල මැතිවරණ ක්‍රියාදාමය මැතිවරණ යුද්ධයක ස්වරූපයක් ගෙන ඇත. මේ දිනවල ඉන්දියාව තුළ මෙම මහා මෙහෙයුමේ විවිධ දසුන් රාශියක් දැකගන්නට ඇත.

දැනට පසුගිය මහ මැතිවරණ දෙකකදීම ඉන්දියාවේ පාලන බලය හිමිවූයේ වත්මන් ඉන්දීය අගමැති නරේන්ද්‍ර මෝදිගේ නායකත්වයෙන් යුත් භාරතීය ජනතා පක්ෂය (Bharatiya Janata Party) නොහොත් BJP නමැති කෙටි වදනින් හඳුන්වන පක්ෂයටය. මෙම පක්ෂය මේ වනවිට ඉන්දියාවේ අතිවිශාලතම පක්ෂය මෙන්ම ප්‍රබලතම පක්ෂය ලෙසද සැලකෙයි. එහෙත් ඉන්දියාවේ අනෙකුත් සමහර පක්ෂ තරම් විශාල දේශපාලන ඉතිහාසයක් නැති මේ පක්ෂය ආරම්භ කර තවම ගතවී ඇත්තේ වසර 44ක් වැනි කාලයකි. එනම් 1980 අප්‍රේල් 06 වැනිදා මෙම දේශපාලන පක්ෂය ආරම්භ කර ඇත්තේ ඉන්දියාවේ තෙවරක් අගමැති ධුරය දැරූ ප්‍රකට දේශපාලනඥයකු වන අටාල් බිහාරි වජ්පායි (Atal Bihari Vajpayee) විසිනි. ඔහු 2018 වසරේදී 93 හැවිරිදි වියේදී මියගියේය. වර්තමානයේදී මෙම පක්ෂයේ නායකත්වය දරන්නේ දැනට 73 වැනි වියෙහි පසුවන වත්මන් ඉන්දීය අගමැති නරේන්ද්‍ර මෝදිය. ඔහුගේ නායකත්වය යටතේ පසුගිය ඉන්දීය මහ මැතිවරණ දෙකෙන්ම ඉතා විශිෂ්ට ලෙස ජයග්‍රහණය කරනු ලැබුවේය. එම අවසාන මහ මැතිවරණය වූයේ 2019 මැතිවරණයයි. එහිදී භාරතීය ජනතා පක්ෂය විසින් ආසන 303ක් දිනාගත් අතර, එය මුළුමහත් ඡන්ද ප්‍රතිශතයෙන් 37.36%ක ප්‍රමාණයකි. එවිට මෙම ජයග්‍රහණයට අමතරව තවත් සන්ධානගත පක්ෂ කිහිපයක් එකට එක්වී තවත් ආසන 50ක එකතුවක් සාදාගෙන භාරතීය ජනතා පක්ෂයට එක්විය. ඒ අනුව එම සන්ධානයට පාර්ලිමේන්තුවේ (ලෝක් සභාවේ) ආසන 353ක අතිබහුතර බලය හිමියි. 2019 මහ මැතිවරණයේදී ඉන්දියාවේ දැනට සිටින දෙවැනි ප්‍රබල පක්ෂය ලෙස සැලකෙන ඉන්දීය ජාතික කොංග්‍රස් (Indian National Congress) පක්ෂයට ලබාගැනීමට හැකිවූයේ ආසන 52ක් පමණක් විය. එහෙයින් එම පක්ෂය අන්ත පරාජයකට පත්විය. මෙම පක්ෂයේ වත්මන් නායකත්වය දරන්නේ ඉන්දියාවේ හිටපු ප්‍රකට අගමැතිවරයකු වන රජීව් ගාන්ධිගේ බිරිය වන සෝනියා ගාන්ධිය. ඉන්දීය ජාතික කොංග්‍රස් පක්ෂය යනු ඉන්දියාවේ තිබෙන පැරැණිතම දේශපාලන පක්ෂය වන අතර, දැනට එයට වසර 138ක ඉතිහාසයක් ඇත. එය ආරම්භ කර ඇත්තේ 1885 දෙසැම්බර් 28 වැනිදාය. එතරම් අතිශය පැරැණි ඉතිහාසයක් තිබුණද වර්තමානයේ එම පක්ෂයේ ජනප්‍රියත්වය ගිලිහී ඇත.



ප්‍රියන්ත හෙට්ටිගේ

දැන් එසේනම් මෙවැනි වටපිටාවක් තිබියදී ඉන්දියාවේ වත්මන් අගමැති නරේන්ද්‍ර මෝදිගේ ජනප්‍රියත්වය කුමක්ද? එය මේ වන විට බොහෝ දේශපාලන විශ්ලේෂකයන් අවධානයට යොමුකරන හේතු සාධකයකි. නරේන්ද්‍ර මෝදි අගමැතිවරයා මේ වනවිට නොකඩවා වසර 10ක් අගමැති ධුරයේ රැඳී සිටියි. ඔහු අගමැති ධුරයට පත්වන්නේ 2014 මැයි 26 වැනිදාය. අගමැති ධුරය හිමිවන්නේ වසර 05ක කාලසීමාවක් උදෙසාය. ඉන්දියාවේ ජනාධිපතිවරයකු සිටියද එරට ප්‍රබල රාජ්‍ය නායක තනතුරවන්නේ අගමැති ධුරයයි. මේ අනුව දැනට පැවැත්වෙන 2024 මහ මැතිවරණයද නරේන්ද්‍ර මෝදිගේ පක්ෂය විසින් දිනාගතහොත් ඔහු තෙවැනි වාරයකටද නැවත අගමැති ධුරයට පත්වෙයි. එනම් එවිට තවත් වසර 05ක් සඳහා එම තනතුර ඔහුට හිමිවෙයි. මුලින් ගුජරාට් ප්‍රාන්තයේ මහ ඇමැති ධුරයට තේරී පත්වූ නරේන්ද්‍ර මෝදි ඉන් පසුව ලෝක් සභාවේ පාර්ලිමේන්තු ධුරයකට පත්වෙයි. 1995 වසරේ සිට දේශපාලනයට පිවිසෙන ඔහු දැනට වසර 50කට ආසන්න කාලයක් දේශපාලනයෙහි නිරතව සිටියි. ඉන්දියාවේ ඉතිහාසයේ දැනට වඩාත්ම දීර්ඝ කාලයක් අගමැති ධුරය දැරූ අගමැතිවරයා වන්නේ ජවහර්ලාල් නේරු මැතිතුමාය. ඔහු වසර 16කුත් දින 286ක් එම තනතුර දරා ඇත. මෙවර 2024 මහ මැතිවරණයෙන්ද වත්මන් අගමැති නරේන්ද්‍ර මෝදි ජයග්‍රහණය කළහොත් ඔහුට තවත් වසර 05ක බලයක් හිමිවනු ඇතිය. එවිට ඔහුගේ අගමැති ධුර කාලය වසර 15ක් දක්වා දීර්ඝ වනු ඇත. නරේන්ද්‍ර මෝදි අගමැතිවරයා පසුගිය කාලය තුළ ඉන්දියාවේ පොදු ජනතාව අතර මහත් සේ ජනප්‍රියත්වයට පත්ව සිටින දේශපාලකයකු වෙයි. මෙවැනි වටපිටාවකදී බොහෝ දේශපාලනික විශ්ලේෂකයන් ප්‍රකාශ කරන්නේ මෙවර මහ මැතිවරණයද ඔහු ඉතා පහසුවෙන් ජයගනු ඇති බවය.

2024 ඉන්දීය මහ මැතිවරණයේදී පාලක භාරතීය ජනතා පක්ෂයට ප්‍රධානතම අභියෝගය පැමිණෙන්නේ විශාලතම විරුද්ධ පක්ෂය වන ඉන්දීය ජාතික කොංග්‍රසයෙනි. එම පක්ෂය ප්‍රමුඛ තවත් දේශපාලන පක්ෂ 24ක් එකට එක්ව මේ වන විට ඉන්දීය ජාතික සංවර්ධනමය සන්ධානය (Indian National Developmental Alliance) නමින් සන්ධානයක් ගොඩනගාගෙන ඇත. මෙම කණ්ඩායමේ ප්‍රධාන දේශපාලනඥයන් අතරට ඉන්දීය කොංග්‍රස් පක්ෂයේ නායක හිටපු අගමැති රජීව් ගාන්ධිගේ බිරිය සෝනියා ගාන්ධි සහ එම යුවළගේ දරුවන් වන රාහුල් ගාන්ධි සහ ප්‍රියංකා ගාන්ධිද ඇතුළත් වෙයි. ඉන්දීය කොංග්‍රස් පක්ෂය යනු ගාන්ධි පරපුරේ දේශපාලනය ප්‍රකට කළ පක්ෂයක් වශයෙන් ප්‍රකට වන අතර, වර්තමානයේදී ඉන්දීය ජනතාව එම පවුලේ දේශපාලනය ප්‍රතික්ෂේප කරන ලදී. එම පක්ෂය පසුගිය සමයේ බොහෝ මැතිවරණ පරාජයට පත්වුණේ එම හේතු සාධක මතය. මේ අනුව භාරතීය ජනතා පක්ෂය ජනතාව අතර ප්‍රකටත්වයට පත්විය.

ඉන්දීය අගමැති නරේන්ද්‍ර මෝදිගේ වත්මන් රාජ්‍ය පාලනය යටතේ ගෝලීය වශයෙන් ඉන්දියාවේ ස්ථාවරත්වය ඉහළ ගොස් ඇතැයි විශ්ලේෂකයන් ප්‍රකාශ කරයි. ඔහු බොහෝ අවස්ථාවලදී ඉන්දීය දුප්පත් ජනතාවට සහන රැසක් ලබාදුන් පාලකයකු වශයෙන් ප්‍රකටය. ඔහු පසුගිය කාලයේ ඉන්දියාවේ අධික ලෙස දුගී බවින් පෙළෙන මිලියන 800ක ජනතාවකට නොමිලේ ධාන්‍ය වර්ග ලබාදුන් අතර, අඩු ආදායම්ලාභී පවුල්වල කාන්තාවන්ට ඉන්දීය රුපියල් 1,250ක මාසික දීමනාවක්ද ලබාදුන්නේය. එසේම දුගී පවුල්වල දරුවන් සඳහාද නොමිලයේ බොහෝ වරප්‍රසාදයන් ලබාදී ඇත. නරේන්ද්‍ර මෝදි අගමැතිවරයාගේ ක්‍රියාකලාපය අධ්‍යයනය කිරීමේදී ශ්‍රී ලංකාවට පවා එය අමතක කළ නොහැකි තත්ත්වයක් පෙන්නුම් කරයි. එනම් පසුගිය කොවිඩ් සමයේදී සහ දරුණු ආර්ථික අර්බුද සමයේදී ශ්‍රී ලංකාව අන්ත අසරණ තත්ත්වයට පත්වූ අතර, එම ආර්ථික අවදානමෙන් ගොඩ ඒමට ප්‍රධාන වශයෙන්ම උදව් කළ රට වූයේ ඉන්දියාවය. එම සමයේදී ඉන්දියාව විසින් ශ්‍රී ලංකාවට ඇමෙරිකානු ඩොලර් බිලියන 05කට අධික මූල්‍ය ආධාර සහ ණය ආධාර ලබාදී තිබිණි. නරේන්ද්‍ර මෝදි අගමැතිවරයාගේ පූර්ණ නියෝගයන් මත එම ආධාර ලබාදුන්නේය. එහෙයින් ඔහු ශ්‍රී ලංකාවේ සැබෑ මිත්‍රයකු ලෙස බොහෝ පාර්ශ්ව විසින් හඳුන්වා දුන්නේය. අපට ඉන්දියානු දේශපාලනඥයන්ට මහත් සේ ආවඩන්නට අවශ්‍ය නැත. සිදුකළේ යම් සත්‍යයක් පැහැදිලි කිරීම පමණි.

---

## මහා ප්‍රහාරයට...

PAGE - 05

පාදක වූ පුළුල් කුමන්ත්‍රණයක් පිළිබඳ කරුණු සඟවා සිටීමට කටයුතු කිරීම ඇත්තෙන්ම කනගාටුදායකය.

ජනාධිපති කොමිෂන් සභා වාර්තාවේ සඳහන් වන පරිදි මේ ප්‍රහාරය ගැන දැනගෙන සිටියදීත් එය වැළැක්වීමට කටයුතු නොකළ දේශපාලනික හා ආරක්ෂක අංශවල නිලධාරීන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කරන ලෙස නීතිපති තුමාට නිර්දේශ කර ඇතත්, එතුමා මේ වනතුරුත් ඒ ගැන මුනිවත රැකීම අපි තරයේ හෙළා දකිමු. මේ අසාධාරණ පක්ෂග්‍රාහීභාවය මේ රට තුළ නීතියේ ස්වාධීනත්වයට කරන දරුණු පරිභවයක් බව කිව යුතුය.

ශ්‍රී ලංකාව තුළ අපට සාධාරණයක් ඉටු කරගැනීමට දිගින් දිගටම අප කළ ඉල්ලීම් පසුගිය රජයද, දැන් පවතින රජයද තුට්ටුවකටවත් ගණන් නොගැනීම නිසාද, ඇති සියලු මං වසාදමා තිබීමෙන්ද අපට මේ භයානක සිද්ධියේ සත්‍ය පසුබිම සොයාගැනීමට නොහැකි වී ඇත. අප එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමසාරිස් කාර්යාලය වෙත අපේ මේ ඉල්ලීම ඉදිරිපත් කළේ අපට වෙන විකල්පයක් නොතිබූ නිසාය. එලෙසම ශුද්ධෝත්තම ෆ්‍රැන්සිස් පාප්වහන්සේ වෙතද, අද ලෝකයේ විවිධ ප්‍රදේශවල කතෝලික සභාව මෙහෙයවන කාදිනල් හිමිපාණන් වෙතද මෙම දුක්ගැනවිල්ල යොමුකරන්නට සිදුවූ බව සඳහන් කර සිටිමි. මෙය ජාත්‍යන්තර තලයට ගෙන යන්නේ කතෝලික ජනතාව අප රටට ආදරය නොකරන නිසා නොව අපට සිදුවූ මේ මහා විනාශය පිළිබඳ සත්‍යය සොයාගැනීමට අපට වෙන විකල්ප මාර්ගයක් නොමැති වීම නිසාය.

පාස්කු ප්‍රහාරය සිදුවූ මොහොතේ නීතිපති ධුරය දැරූ දප්පුල ද ලිවේරා මහතා 2021 මැයි 17 වැනි දින 'නිවුස් ෆස්ට්' මාධ්‍යවේදී සුල්ෆික් ෆර්සාන්ට දැන්වූ ආකාරයට මේ ප්‍රහාරය පිටුපස තිබූ මහා කුමන්ත්‍රණය කුමක්දැයි සොයා බලන්නේ නැත්තේ ඇයිදැයි අප රජයෙන් අසා සිටිමු. හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා තමන් ජනාධිපති ධුරයෙන් ඉවත් කිරීමට ක්‍රියා කළ බලවේග පිළිබඳ ලියන ලද කෘතියක කතෝලික සභාවද මෙම අරගලය පිටුපස ප්‍රධාන බලවේගයක් වූ බවට චෝදනා කිරීම අසාධාරණ දෙයක් බව මෙහිදී සඳහන් කළ යුතුමය. ඒ මහතා ජනාධිපති ධුරයට ඉල්ලුම් කළ මොහොතේදී ඔහුම අපට දුන් පොරොන්දු මත පදනම්ව ඔහු පිළිබඳ අප තුළ යම් බලාපොරොත්තුවක් ඇතිවූ බව සත්‍යයකි. මෙහිදී ඒ පිළිබඳ අපට ඍජු වශයෙන් හා ප්‍රසිද්ධවද ඔහු ලබා දුන් පොරොන්දු බලපෑ බව නොරහසකි. කෙසේ වෙතත් බලයට පැමිණි පසු ඒ සියල්ල අමතක කරදැමීම හා පාස්කු ප්‍රහාරයට අදාළ විමර්ශන සඟවා තැබීමට ඍජුවම කටයුතු කිරීම තුළ ඔහු පිළිබඳ අප තුළ තිබූ විශ්වාසය සහමුලින්ම බිඳවැටුණු බව ප්‍රකාශ කළ යුතුමය.

එදා ගාලුමුවදොර පිටියේ පැවැති ජන අරගලයට කතෝලික පියතුමන්, පැවිදි සොහොයුරු සොහොයුරියන් සම්බන්ධ වූ බව සත්‍යයකි. එහෙත් ඒ මහතා අමතක කරන්නේ එම අරගලයට සම්බන්ධ වූයේ කතෝලික ජනතාව පමණක් නොව බෞද්ධ, හින්දු, මුස්ලිම් හින්දු ජනකොටස් බවය. එදා ගාලුමුවදොර පිටියට පැමිණි බෞද්ධ භික්ෂූන්වහන්සේ, මවුලවිතුමන්ලා, හින්දු පූජකතුමන්ලා පිළිබඳවද අද ඒ මහතා කතා නොකිරීම ප්‍රහේලිකාවකි. ශ්‍රී ලංකාවේ ආර්ථිකය මෙන්ම ප්‍රජාතන්ත්‍රවාදී පිළිවෙත්ද එදා කඩාවැටුණු නිසා ජන අරගලය ඇතිවූ බව රහසක් නොවේ. එලෙසම ඒ මහතාගේ පාලනය යටතේ ගන්නා ලද ඇතැම් තීන්දු තීරණයන් තුළ ශ්‍රී ලංකාවේ ආර්ථිකය කඩාවැටීම සිදුවූ බව අමුතුවෙන් කිවයුතු නොවේ. ජන අරගලය ආරම්භ වූයේ කිලෝමීටර් ගණන් දිග පෝලිම්වල ඉන්ධන, භූමිතෙල් හා ගෑස් වැනි අත්‍යාවශ්‍ය දේ ලබාගැනීමට දින ගණනාවක් සිටීමට රටේ මහජනතාවට සිදුවූ නිසාත්, ශ්‍රී ලංකාවේ ආර්ථිකයට ඉතා කිට්ටුවෙන් සම්බන්ධ ගොවිතැන පිළිබඳ එතුමා ගත් යම් තීරණයන් නිසා එම ක්ෂේත්‍රය සහමුලින්ම වාගේ කඩාකප්පල් වීම නිසාත්, තමන් වටා සිටි ඇතැම් පිරිස්වල නොමග යැවීමට එතුමා යටත් වීම නිසාත් මේ රට තුළ සියලු ජාතීන් හා ආගමිකයන් එක්සත් කරමින් සැබෑ ප්‍රජාතන්ත්‍රවාදී රාමුවක් තුළ රට ගෙනයන්නට එතුමා කටයුතු නොකිරීම නිසාත් ඇතිවූ පිළිකුල්සහගත තත්ත්වය නිසාය. ඒ අරගලයට කතෝලික අපි සම්බන්ධ වූවා නම් එසේ වූයේ වෙනත් ජාතීන් හා ආගමිකයන් සමග අප රට වෙනුවෙන් අප තුළ තිබූ ජාතිමාමක හැඟීම නිසාය.

දැන් අප රටට සිදුවී ඇත්තේ මහත් විනාශයකි. අද ශ්‍රී ලංකාව තුළ පුදුමාකාරයේ පාලන තන්ත්‍රයක් බිහිවී ඇත. පාරම්පරිකව වාමාංශික සමාජවාදී අදහස් දැරූ කණ්ඩායමක් ඒ මගින් බලයට පැමිණ පාරම්පරිකව බටහිර ගැති ආකල්ප හා නිදහස් වෙළෙඳ පිළිවෙත වැලඳගත් කණ්ඩායමක් සමග එකට හවුල්වී ජනතාවගේ බඩගින්න දුක වේදනා ගැන කිසිදු තැකීමක් නොමැතිව මේ රටේ සම්පත් විදේශීය සමාගම්වලට සහ ආයතනවලට විකුණන්නට පිඹුරුපත් සකස් කරමින් මේ රට අවට රටක කොටසක් යැයි කියන්නට තරම් ධෛර්යවත් වෙමින් අපේ ස්වාධීනත්වය හා ස්වෛරීභාවය පාවාදෙන ආකාරයේ තීරණ ගනිමින් වම සහ දකුණ එකට එකතුවූ දෙපත් නයකු මෙන් මේ රට පාවාදෙමින් මේ පාලන තන්ත්‍රණය ක්‍රියාත්මක වෙමින් පවතී. අධික ණය බර නිසාද දරාගත නොහැකි බදු ගෙවීමට සිදුවීම නිසාද රටේ බහුතර ජනතාව අන්ත දුප්පත්කමින් පීඩා විඳින අතර, ඉතා සුළු වූ පොහොසතුන් පිරිසකට මෙන්ම විදේශීය සමාගම්වලටද රටේ සම්පත් අයත් වීම දිගින් දිගටම සිදුවෙමින් පවතී. එලෙසම හතු පිපෙන්නාක් මෙන් රටේ ප්‍රජාතන්ත්‍රවාදී ගමන් මග ඒකාධිපතිවාදයක් වෙත මෙහෙයවන්නට විවිධ ආඥා පනත් ඉදිරිපත් කරමින් තමන්ට ලැබුණු ජන වරම අමතක කර ඊට ප්‍රතිවිරුද්ධ දේ රට තුළ ජනිත කරවන්නට ඔවුන් ක්‍රියාත්මක වෙමින් සිටියි. ඒ සියල්ල අමතක කර දමා පවතින මෙම තත්ත්වයට හේතුව කතෝලික සභාව යැයි යම්කිසි කෙනකු ප්‍රකාශ කළහොත් අපට නම් ඔහු සිහි විකල් වූ කෙනකු මිස පියවි මනසකින් කතා කරන්නකු නොවේ.

ශ්‍රී ලංකාවේ කතෝලික සභාව කවදත් මේ රටට ආදරය කරන, ජනතාවකින් හා නායකත්වයකින් හොබවනු ලැබීය. මේ වන විට ශ්‍රී ලංකාව තුළ අපගේ ජන වන්දනාවද සභාවේ ක්‍රියාකාරකම්ද, සභාවේ චින්තනයද ජාතික වටිනාකම්වලින් සහ ජාතික උරුමයන් තුළින් සකස් වී ඇත. අපේ රට තුළ අපි අපගේ වත්පිළිවෙත්වලදී භාවිත කරන්නේ සිංහල සහ දෙමළ භාෂාය. ඒවා අප මවු භාෂාවන්ය. අප කතෝලිකයන් බොහෝ දෙනකු වෙනත් ආගමිකයන් සමග ආවාහ විවාහ වී සිටීම තුළ අද කතෝලික බෞද්ධ හින්දු සහ මුස්ලිම් අප අතර වෙනස්කම් බොහෝ දුරට හීන වී ඇත. සියල්ලන්ටම අප සලකන්නේ එක හා සමානවය. විශේෂයෙන්ම මේ රට තුළ පවතින බෞද්ධ සංස්කෘතිය අපි අගය කොට සලකමු.

ඒ තුළින් අප සමාජයට උරුම වී ඇති ආකල්ප, ගති පැවැතුම් සිරිත් විරිත් කතෝලික අපද වැලඳගෙන ඇත්තෙමු. ඒ නිසා කතෝලික සභාව ශ්‍රී ලංකාව තුළ වෙනම අනන්‍යතාවකින් යුක්තව සිටින දේශපාලන බලවේගයක් ලෙස හුවාදැක්වීම වරදකි. අපට දේශපාලන පක්ෂ නැත. අප ජාතික ප්‍රවාහයේ දේශපාලන පක්ෂ සමග බැඳී සිටිමු. වෙනත් ආගමිකයන් මෙන් අප ක්‍රිස්තියානි ආගම පදනම් කරගත් දේශපාලන පක්ෂ බිහි නොකළෙමු. මේ සියල්ලෙන් මා අදහස් කරන්නේ මෙවැනි චෝදනා ඉදිරිපත් කරනු වෙනුවට තමන්ගේ හෘදසාක්ෂිය හොඳින් පරීක්ෂා කර බලා සිදුවූ සියල්ල සත්‍යවාදීව විමර්ශනය කරන්නට එවැනි ආකල්ප දරන සියලු දෙනා කටයුතු කළ යුතු බවය. ඒ තුළින් ශ්‍රී ලංකාවාසී අප සැමට මේ රජය හෝ ඉදිරියට පැමිණෙන රජයක් විසින් හෝ කළ යුතු වන පළමු පෙළේ වගකීම වන්නේ මේ රටේ නූතන ඉතිහාසය තවත් පැත්තකට යොමුකළ පාස්කු ප්‍රහාරය සහ එහි පිටුපස ඇති සත්‍යය සොයාගන්නට අවශ්‍ය ස්වාධීන ව්‍යුහයන් සකස් කරමින් කටයුතු කිරීමයි. එසේ නොකළහොත් ඉදිරියටද මෙය මේ රටේ කීර්තිනාමයට කැළැලක් වන බව සඳහන් කළ යුතුමය.

මේ රට තුළ පසුගිය දශක තුන හතරේදී බොහෝ දරුණු ලෙස නීතිය අවනීතිය බවට පත්වීම, උසාවියට පවා පරිභව කිරීමට දේශපාලකයන් කටයුතු කිරීම, සත්‍යය වසං කිරීමට විවිධ ආකාරයේ ක්‍රියා සහ අකටයුතුකම්වල නිරත වීම හා ඉතා දරුණු ලෙස දූෂණයට රට යොමුකිරීම මේ රට විනාශය කරා යොමු කළෝය. නිදහස ලබා වසර 76ක් ගෙවෙන කල අප රට මෙලෙස ඉතා අවිනිශ්චිතව හා වහල් බවේ ගමන් මගකට යොමුවී ඇත්තේ අප රට පාලනය කළ දේශපාලන නායකත්වය නිසා බව පැහැදිලිවම කිව යුතුය. ඒ නිසා ඒ ප්‍රශ්නවලට මුහුණ දෙනු වෙනුවට මේ සියල්ල වසං කිරීමට ගෝනි බිල්ලකු කතෝලිකයන් තුළ දැකීමට හිටපු ජනාධිපතිතුමා උත්සාහ කිරීම අප ප්‍රතික්ෂේප කරමු.

තමන්ගේ නොහැකියාවට පිළිතුරු සෙවිය යුත්තේ තමාගේම හෘදයසාක්ෂිය තුළ මිස අන්‍යයන්ට ඇඟිල්ල දිගුකිරීම තුළ නොවේ. ඒ නිසා තමන්ගේ නොහැකියාවට තමන් පිළිතුරු සෙවීමට කටයුතු කරන්නේ නම් එය වඩාත් සුදුසුය. අදත් මේ අවස්ථාවේදී මා ඉල්ලා සිටින්නේ මේ ම්ලේච්ඡ පාස්කු ප්‍රහාරය පිටුපස ඇති සියලු කරුණු සොයා බලන්නට ස්වාධීන වූද, සාධාරණ වූද, සත්‍යවාදී වූද විමර්ශනයක් ආරම්භ කරන ලෙසයි. එසේ නොකර සත්‍ය වසං කරමින් අනුන්ට ඇඟිල්ල දිගුකිරීම පමණක් තුළින් මේ රට සුව කරන්නට කිසි කෙනකුට නොහැකි යැයි මගේ විශ්වාසයයි. එදා සිට මේ රට තුළ සිදුවූ මිනීමැරුම්, අතුරුදන් වීම්, කුමන්ත්‍රණ හා විනාශකාරී ලේ හැලීම් පිළිබඳ විමර්ශන කිසිවක් සිදු නොවීම තුළ අප රට පත්ව ඇති තත්ත්වයද රට පාලනය කරන නායකයන් තමන් අතර සියලු බලතල අත්පත් කරගැනීමට උත්සාහ කිරීම තුළද ඒ සඳහා ඒකාධිපති වියරුවෙන් හැසිරීම තුළද අප රට අප ආදර මවුබිම දූෂිත සමාජ රටාවක් තුළ සිරවී ඇත. එබැවින් මේ අවස්ථාවේදී අපට අවශ්‍ය වන්නේ මුළු රටේම ජනතාවගේ සිත් හැදීමකි. අප අදහන උතුම් වූ ධර්මයන් තුළ පිහිටා සිට කටයුතු කිරීමට අප රටේ නායකත්වයද, අප රටේ ජනතාවද ක්‍රියා කරන්නේ නම් අප රට ඉදිරියට ගෙන යා හැක. තමන් අදහන ආගමේ වත්පිළිවෙත්වලට පමණක් සහභාගි වෙමින් ඊට ප්‍රතිවිරුද්ධ ලෙස සමාජ ජීවිතය තුළ හැසිරීම නිසා මේ නායකයන් රඟදක්වන නාටකය දැන් හමාර කළ යුතු යැයි මම සිතමි. සත්‍යය හා යුක්තිය කිසිදා යටගැසිය නොහැක. එය දිය යට තදකර තබන්නට උත්සාහ කරන රබර් බෝලයකට සමාන කළ හැක. අප එම සත්‍යය හා යුක්තිය ලැබෙනතුරු සත්‍යයේද පරමේශ්වරයාණන් වූ දෙවි සමිඳුන්ට කන්නලව් කරමු. එලෙසම පාස්කු ප්‍රහාරයෙන් මියගිය සියලු දෙනා වෙනුවෙන් අපගේ ශෝකය නැවතත් පළකර සිටින අතර, ඔවුන්ට ස්වර්ගීය සහ නිවන් සම්පත් ලැබේවා යැයි කරන ප්‍රාර්ථනාවද, තුවාල වූ හා අසරණ වූ අයට ඉක්මනින් සුවය ලැබෙන ලෙස කරන යාච්ඥාවද ඉදිරිපත් කරමින් මා නවතිමි.



# මහින්දටත් වුණේ අහමඩි නෙජාඩ්ට වෙච්ච දේමද?

පළමුවෙන්ම උමාඔය ව්‍යාපෘතිය පටන් ගත්තේ 1959 United States Operations Mission සහ Canadian hunting survey corporation හි අධ්‍යයනයකින් පසුවය. අරමුදල් ප්‍රශ්නයක් නිසා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම නතර විය. ඇමෙරිකාව සහ කැනඩාවේ අධ්‍යයනයකින් පටන්ගත් උමාඔය ව්‍යාපෘතියට අරමුදල් සපයන්න ඉරානය තීරණය කළේ මහින්ද රාජපක්ෂගේ ඉල්ලීමකට අනුවය. උමාඔය ව්‍යාපෘතියට අරමුදල් දෙන්න ඉරානය තීරණය කළේ 2008 ඉරාන ජනාධිපති අහමඩි නෙජාඩ්ය. දැඩි ඇමෙරිකානු විරෝධියකු වූ අහමඩි නෙජාඩ් මහින්දට කැමැති වූයේ මහින්දගේ බටහිර විරෝධී ස්ථාවරය නිසාය. එල්.ටී.ටී.ඊ.යට එරෙහි යුද්ධය අවසන් කරන්න මහින්දගේ ආණ්ඩුව අවි ආයුධ මිලට ගන්න රටවල් හොයද්දී ඉරානය මහින්දගේ ආණ්ඩුවට පිහිට විය. ඒ වගේම මහින්දගේ ආණ්ඩුව ඉරානයෙන් ණය ඉල්ලා සිටි අතර ඒ ණය දීමටද අහමඩි නෙජාඩ් එකඟ විය. මහින්දගේ ආණ්ඩුව උමාඔය ව්‍යාපෘතියට අරමුදල් ලබාගන්න අහමඩි නෙජාඩ් එකඟ කරගත්තේ මේ කාලයේදීය. අහමඩි නෙජාඩ් 2008 ලංකාවට එන්නේ උමාඔය ව්‍යාපෘතියට මුල්ගල තබන්නටය.

අහමඩි නෙජාඩ්ගේ ලංකා සංචාරයේදී මෙරට මාධ්‍ය මහින්ද සහ අහමඩි නෙජාඩ්ට අතර සමානකම් පෙන්වමින් දෙදෙනාම ඇමෙරිකානු ආධිපත්‍යයට එරෙහිව සටන් කරන්නන් ලෙස පෙන්විය.

මහින්ද 2015 ජනාධිපතිවරණයෙන් පරාජය වීමට පෙර අහමඩි නෙජාඩ්ට 2013දී සිය ජනාධිපති නිල කාලය අවසන් කිරීමට සිදුවිය. 2017දී ඔහු යළිත් වතාවක් ඉරාන ජනාධිපති ධුරයට තරග කරන්න සූදානම් බව ප්‍රකාශයට පත් කළේය. එහෙත් ඉරානයේ සුප්‍රිම් ලීඩර් අහමඩි නෙජාඩ් ජනාධිපති තරගයට නුසුදුස්සෙක් බව තීරණය කළේය. යළිත් 2021 ජනාධිපතිවරණයේදී අහමඩි නෙජාඩ් ජනාධිපතිවරණයට තරග කරන්න සූදානම් විය. ඒ වෙලාවේත් ඉරානයේ උත්තරීතර නායකයා ඔහුව නුසුදුස්සෙක් කළේය. උත්තරීතර නායකයාට ඕනෑ වුණේ වත්මන් ඉරාන ජනාධිපති ඊබ්‍රාහිම් රයිසිව ජනාධිපති ධුරයට ගෙන එන්නටය. ඔහු 2017ත් ඔහුව ගෙන එන්න උත්සාහ කළේය. එය අසාර්ථක විය. ඒත් 2021 ඔහුගේ උත්සාහය සාර්ථක විය. රයිසි ජනාධිපති විය. මේ දිනවල අහමඩි නෙජාඩ්, රයිසිගේ පාලනය දැඩි ලෙස විවේචනය කරමින් සිටී.

තමා විසින් මුල්ගල තබන ලද උමාඔය ව්‍යාපෘතිය රයිසි විවෘත කරන ආකාරය අහමඩි නෙජාඩ් බලා ඉන්නවා වගේ තමා විසින් අරමුදල් ලබාගෙන පටන්ගත් ව්‍යාපෘතිය ජනාධිපති රනිල් විවෘත කරනවා බලා සිටින්නට මහින්දට සිදුව තිබේ. ඉරානයේ උත්තරීතර නායකයාගේ නායකත්වයෙන් යුත් දේශපාලන ආකෘතිය නිසා අහමඩි නෙජාඩ්ට රයිසිට එරෙහිව නැගීසිටිය නොහැකිය. රනිල්ව ජනාධිපති කළේ මහින්දලා නිසා මහින්දටද රනිල්ට විරුද්ධව නැගී සිටිය නොහැකිය.

හැබැයි අහමඩි නෙජාඩ් ලංකාවට ඇවිත් උමාඔයට මුල්ගල තිබ්බ අවස්ථාව මෙන්ම අද ඉරාන ජනාධිපති පැමිණ උමාඔය විවෘත කරන අවස්ථාවද ඇමෙරිකාව බලා ඉන්නේ කැමැත්තකින් නොවේ. මේ බව ඇමෙරිකානු විරෝධී ප්‍රතිපත්තියක සිටි මහින්දද තේරුම් ගෙන සිටියේය. ඔහු ඇමෙරිකාව ඉරානයට පනවා ඇති සම්බාධකවලට බිය වී ඉරානයෙන් තෙල් මිලදී ගැනීම අඩු කළේය. ජනාධිපති රනිල්ද ඉරාන ජනාධිපතිගේ සංචාරය අතරතුර ඇමෙරිකානු හමුදා සහ ලංකා හමුදා අතර ඒකාබද්ධ නාවික අභ්‍යාසයක් කිරීමට අවසර දී තිබේ.

ජනාධිපති රනිල් ඇමෙරිකාව බැලන්ස් කිරීමට එසේ කළත් ඉරාන ජනාධිපතිගේ සංචාරය පිළිබඳ ඊශ්‍රායල් ස්ථාවරය කුමක්දැයි දන්නේ නැත. ඊශ්‍රායලය සමග රාජ්‍යතාන්ත්‍රික සබඳතා පටන් ගත්තේ රනිල්ගේ මාමා ජේ.ආර්.ය. රනිල් සහ ඊශ්‍රායලය අතර සබඳතා රනිල් සහ මැදපෙරදිග සබඳතාවලට වඩා බලවත්ය.

# මේ මොන කුණුහරුපයක්ද?

**ශ්‍රී ලංකාව කිහිප වතාවක්ම ගූගල් අන්තර්ජාල සෙවුම හරහා ලෝකයේ SEX වචනය වැඩිම පිරිසක් සොයාබැලූ රට බවට පත්විය. ලිංගිකත්වය පිළිබඳ කතාකිරීම තවමත් මෙරට තුළ රහසක් සේ පවතින අතර ලිංගික අධ්‍යාපනය පාසල් විෂය මාලාවට එක් කිරීමට ගත් උත්සාහයන්ට ආගමික සංස්ථා ඇතුළුව සමාජයේ ඇතිවූ විරෝධය මැද හකුළා ගන්නට සිදුවිය.**

වත්මන් රජය මාර්ගගත සුරක්ෂිතභාවය පිළිබඳ වූ පනත ගෙන එන අවස්ථාවේදී ප්‍රකාශ කළ එක් ප්‍රධාන හේතුවක් ලෙස සඳහන් කළේ දරුවන්ට හා කාන්තාවන්ට අන්තර්ජාලය හරහා වන අපරාධ වැළැක්වීමය. එවන් පසුබිමක් තුළ මාර්ගගත ක්‍රම හරහා දරුවන් සම්බන්ධ ප්‍රකාශන හෙවත් ළමුන්ගේ අසභ්‍ය ඡායාරූප හා වීඩියෝ සම්බන්ධව ලැබෙන පැමිණිලි වැඩිවී ඇතැයි අපට අනාවරණ කරගැනීමට හැකි විය.

ලැබී තිබේ.

'සයිබර් ටිප් එකක් විදියට තමයි අපිට මේක එන්නේ. එතකොට කවුරු හරි මේ සයිට් එකකට වැරදිලා ගියත් ඒකත් ටිප් එකක් විදියට එනවා. ඒ විදියට ලක්ෂ ගානක් එනවා. 2022 ලක්ෂ ගානක් තියෙනවා. 2023ත් ලක්ෂයකට ආසන්න ගානක් තියෙනවා. ඒවායින් ප්‍රමුඛතාවය දීලා එවලා තියෙනවා. ඒවා තමයි අපි දැන් කරගෙන යන්නේ.' යැයි නියෝජ්‍ය පොලිස්පතිනිය පැවැසුවාය.

මෙම වාර්තාවේ දත්ත එකින් එක



## එක සැරයක් sex බලල 01 වැනි තැන ගත්තා...

ළමුන් සම්බන්ධ අසභ්‍ය පළකිරීම් 10ක් සම්බන්ධව මේ වසරේ මුල් මාස තුනේ දී පමණක් වාර්තා වී ඇති බව පොලිස් ළමා හා කාන්තා අපයෝජන නිවාරණ කාර්යාංශය අනාවරණ කළේය. මෙවැනි සිදුවීම් සම්බන්ධව පසුගිය වසර දෙකකට සාපේක්ෂව මේ වසරේ පැමිණිලි ලැබීම ඉහළ ගොස් ඇති අතර එම කාර්යංශයේ දත්තවලට අනුව 2022 වසරේ පැමිණිලි 13ක් සහ 2023 වසරේ දී පැමිණිලි 12ක් ලැබී තිබේ.

**ළමුන්ගේ අසභ්‍ය ප්‍රකාශන සම්බන්ධ ලක්ෂයකට වැඩි වාර්තා**

මීට අමතරව International Centre for Missing & Exploited Children සංවිධානයේ NCMEC දත්ත පද්ධතිය හරහා ළමුන් සම්බන්ධ අසභ්‍ය ප්‍රකාශන සම්බන්ධ ලක්ෂයකට වැඩි වාර්තා තමන් වෙත ලැබෙන බව බීබීසී සිංහල සේවය හා සම්බන්ධ වූ ළමා හා කාන්තා අපයෝජන නිවාරණ කාර්යාංශය භාර නියෝජ්‍ය පොලිස්පතිනි රේණුකා ජයසුන්දර කියා සිටියාය.

සියලු සමාජ මාධ්‍යවල හෝ සයිබර් අවකාශයට ළමයකුගේ නිරුවත් ඡායාරූප, වීඩියෝ දර්ශන යම් පුද්ගලයෙකු විසින් මුදාහරින්නේ නම්, සමාජ මාධ්‍ය තුළ බෙදාහරින්නේ නම් හෝ එවැනි වීඩියෝ නිතර නිතර නරඹනවා නම් එම තොරතුරු අදාළ සමාජ මාධ්‍ය තුළින් සහ සයිබර් අවකාශයේ අනෙකුත් සේවා සපයන ආයතන විසින් NCMEC දත්ත පද්ධතිය වෙත යොමු කෙරේ.

පසුව එම දත්ත පද්ධතිය විසින් එම තොරතුරු අදාළ අපරාධකරුවන් සහ වින්දිත දරුවන් සිටින රටවල්වලට යොමුකරනු ලබන අතර, ශ්‍රී ලංකා පොලිසියේ ළමා හා කාන්තා අපයෝජන නිවාරණ කාර්යාංශය ද එම දත්ත පද්ධතිය සමග සමීපව කටයුතු කරනු ලබයි. මෙම දත්ත පද්ධතිය හරහා 2022 වසරට අදාළව 146,000ක තොරතුරු ලැබී ඇති අතර, 2023 වසරට අදාළව 98,000කට වැඩි වාර්තා ළමා හා කාන්තා අපයෝජන නිවාරණ කාර්යාංශය වෙත සොයාබලා නිවැරදි ලෙස මෙම අපරාධවලට සම්බන්ධ පුද්ගලයන් සොයාගැනීම කළ යුතු අතර, ඇතැම් වාර්තා ප්‍රමුඛතා ලෙස දත්ත පද්ධතිය මගින් නම්කර එවනු ලබයි.

**අපරාධය වළක්වාගෙන වින්දිතයා ගලවා ගැනීමේ හැකියාව**

මෙය මෙරටට තවමත් ආගන්තුක ක්‍රමයක් වන අතර, තාක්ෂණික දුර්වලතා මෙන්ම අඩු පහසුකම් මැද මෙය ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලද්දේ මීට මාස 5කට පමණ පෙර බව ඇය සඳහන් කළාය.

'අපි හැම වෙලාවෙම මිනිස්සුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන්නත් ඕනේ. ටිප් එකක් ආපු ගමන් ගිහිල්ලා මිනිස්සුන්ව ඇරෙස්ට් කරන්න බැනේ. අපි ඒකට හොඳ ඉන්වෙස්ටිගේෂන් එකක් කරන්න ඕනේ, ඉන්වෙස්ටිගේෂන් එකකින් අපිට දෙන තොරතුරු සත්‍ය බවට පැහැදිලි වෙන්න ඕනේ. ඒ විදියට විමර්ශනවලින් එයා ළමයින්ගේ පොනෝග්‍රැෆි නිර්මාණය කරලා තියෙනවා කියලා තහවුරු වුණාට පස්සේ අපි ඇරෙස්ට් එක කරනවා. අපි ඒ වගේ කේසස් තුනක් ඉවර කරා.'

ඒ සිද්ධි තුනට සම්බන්ධ වින්දිතයන්ගෙන් දෙදෙනකු වයස අවුරුදු 10ක දරුවන් වන අතර එක් දරුවකුගේ වයස අවුරුදු 8කි.

මෙම දත්ත පද්ධතිය හරහා වින්දිතයා නොදැනුවත්ව හෝ පැමිණිල්ලක් නොමැතිව වුවද ළමුන්ට එරෙහි මාර්ගගත ක්‍රම ඔස්සේ සිදුවන අපරාධ හඳුනාගෙන එම අපරාධ වළක්වා ගෙන ඉක්මනින්ම වින්දිතයා ඉන් ගලවා ගැනීමට හැකියාව ලැබෙන බව නියෝජ්‍ය පොලිස්පතිනිය සඳහන් කළාය.

ගැහැනු දරුවන් මෙන්ම පිරිමි ළමුන් ද මෙහි ගොදුරක්වන මුත් ගැහැනු ළමුන් වින්දිතයන් වන අවස්ථා වැඩි බව ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සභාපතිවරයා මෙන්ම ළමා හා කාන්තා අපයෝජන නිවාරණ කාර්යාංශයේ නියෝජ්‍ය පොලිස්පතිනිය ද පැවැසුවාය.

**'ලිංගිකත්ව අධ්‍යාපනයෙන් ලිංගිකව හැසිරෙන හැටි කියා දෙන්නේ නැහැ'**

ලිංගිකත්ව අධ්‍යාපනය ලබාදීම හරහා දරුවන් මෙවැනි අපරාධවල ගොදුරක් වීම වළක්වා ගැනීමේ හැකියාවක් තිබේදැයි ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සභාපතිවරයාගෙන් අප විමසනු ලැබීය.

'ලිංගිකත්ව අධ්‍යාපනය ලබාදීම තුළින් ලිංගික අපයෝජන වළක්වා ගැනීම කියන එක තමයි අපේ ප්ලෑන් එක. අපි පාර්ලිමේන්තුවේ ළමයින් හා කාන්තාවන් සම්බන්ධ පාර්ලිමේන්තු සංසදය, ආංශික අධීක්ෂණ කමිටු කිහිපයක්ම ඒ වෙනුවෙන් වැඩ කළා. සෞඛ්‍ය අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය, කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය වගේ ආයතන එකට එකතු වෙලා මැටීරියල් ගණනාවක් හැදුවා අන්තර්ජාලයට ඒවා මුදාහැරලා ඒ හරහා යම් දැනුවත් කිරීමක් කරන්න කියලා. දෙවැනි අදියර යටතේ අපි හිතනවා ලංකාවේ අධ්‍යාපන ක්‍රමය තුළ පාසල් අධ්‍යාපනය තුළට ලිංගිකත්ව අධ්‍යාපනය ගැන අවදානයක් දෙන ක්‍රමවේදයක් හදන්න.'

ජීව විද්‍යාත්මක වශයෙන් කායික වෙනස්කම් සිදුවන නව යොවුන් වයසේ දරුවන් වැඩි වශයෙන් ලිංගික අපයෝජනවල ගොදුරක් වන බව කී ආචාර්ය උදයකුමාර අමරසිංහ, ලිංගිකත්ව අධ්‍යාපනය හරහා සිදුවන්නේ දරුවන්ට ලිංගිකව හැසිරෙන ආකාරය කියාදීම නොව එහි බරපතළකම, අවදානම සහ වගකීම ගැන දැනුමක් ලබාදීම බව කියා සිටියේය.

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සභාපති ආචාර්ය උදයකුමාර අමරසිංහ පෙන්වා දෙන්නේ කුඩා කල සිටම අදියර වශයෙන් දරුවන්ට එම දැනුම ලබාදිය හැකි බවය.

'අපි පොඩි කාලේ ළමයින්ට කියලා දෙනවා පාරේ යන්න ඕනේ මොන පැත්තෙන් ද කියලා, කලර් ලයිට්ස් තියෙනවා නම් අපි කියලා දෙනවා රතු ලයිට් තියෙනවා නම් යන්න එපා, කොළ ලයිට් තියෙනවා නම් යන්න කියලා. පාරේ දකුණු පැත්තෙන් යන්න ඕනේ කියලා දෙනවා. එතකොට ඒක ජීවිතේ හැබිට් එකක් වෙනවානේ. එතකොට මේක වුණත් ළමයින්ගේ සේෆ්ටි කියන එක පොඩි කාලේ ඉඳලාම කියලා දෙන්න පුළුවන්.'

**ළමා වින්දිතයන්ට නීතියෙන් ලැබී ඇති සුවිශේෂ අවස්ථාව**

වින්දිත දරුවන්ගේ අනන්‍යතාවය හෙළි නොවන ආකාරයට පුද්ගලිකත්වය ආරක්ෂා කරගනිමින් නීතිමය කටයුතු කරන ආකාරය ද ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සභාපති ආචාර්ය උදයකුමාර අමරසිංහ විස්තර කළේය.

'ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ තියෙනවා වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ මධ්‍යස්ථානයක්. ඒක දැනට ප්‍රධාන කාර්යාලයේ තියෙනවා, රාගම වෛද්‍ය පීඨයේ එකක් තියෙනවා, ලංකාව පුරා පළාත් කාර්යලවල පටන් ගන්න අදහස් කරගෙන ඉන්නවා. එතැනදී වීඩියෝ කැමරාවක් ඉදිරි සාක්ෂි දෙන්න පුළුවන්. පුහුණු කරපු කවුන්සලස්ලා, පුහුණු කරපු පොලිස් නිලධාරීන් තමයි ඒ සාක්ෂි ටික ගන්නේ. ඒක ස්වාධීන, අපක්ෂපාතී සාක්ෂියක්. ඒක අපි සම්පූර්ණයෙන්ම ටයිප් කරලා ඩොකියුමන්ට් එකකටත් ගන්නවා. ඒක අපි අධිකරණයට සහ නීතිපතිවරයාට ඉදිරිපත් කරනවා. වරින් වර සාක්ෂි ගන්නත් නීතිපතිවරයාට හා නීතිඥයින්ට මේ හරහා පුළුවන්. ඒක ළමා වින්දතයින්ට ලැබෙන සුවිශේෂ අවස්ථාවක්.'

ඊට අමතරව අධිකරණයට නොපැමිණ දුරස්ථ ස්ථානයක සිට වීඩියෝ තාක්ෂණය ඔස්සේ සාක්ෂි ලබාදීමේ හැකියාව ද පවතී. එම අවස්ථාවේ දී අදාළ සිද්ධියේ සැකකරුවාට දරුවා නොපෙනන ලෙස එම කටයුතු සිදුකෙරේ.

පිටරටක සිටින වින්දිතයකුට වුවද මෙම ක්‍රමය ඔස්සේ සාක්ෂි ලබාදෙමින් නීතිමය කටයුතු කිරීමේ ප්‍රතිපාදන ඇති බව ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සභාපතිවරයා සඳහන් කළේය.

**දරුවන් ගොදුරක් වෙන්නේ කොහොමද?**

'ගොඩක් වෙලාවට මෑතකාලීනව දැකපු තත්ත්වයක් තමයි සෝෂල් මීඩියා හරහා ඇති කරගත්ත හිතවත්කම් මත පස්සේ ප්‍රේම සම්බන්ධතා ඇති කරගෙන මේ ළමයින්ව සෙක්ෂුවලි ඇබියුස් කරපු එහෙම සැලකිය යුතු මට්ටමකින් මීඩියාවල රිපෝර්ට් කරනවා අපි දැකලා තියෙනවා. හැබැයි ඒ රිපෝර්ට් වෙන ප්‍රමාණයට වඩා විශාල වශයෙන් රිපෝර්ට් නොවන ප්‍රමාණයක් තියෙනවා.' යැයි ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සභාපති ආචාර්ය උදයකුමාර අමරසිංහ දරුවන් අශ්ලීල ප්‍රකාශනවලට ගොදුරුවන ප්‍රධානතම ආකාරය විස්තර කළේය.

සභාපතිවරයා පවසන පරිදි ඔවුන් වෙත වාර්තාවන බොහෝ සිදුවීම්වල වින්දිතයන්ට නීති ක්‍රියාත්මක කරවා ගැනීමට වඩා අවශ්‍ය වන්නේ ඔවුන්ගේ වීඩියෝ හෝ ඡායාරූප අන්තර්ජාලයෙන් ඉවත් කරගැනීමය.

## ඒ පාර දරුවන්ගෙ නිරුවත් Photo දාලා වාර්තාවක් තියලා...

'මේ දරුවෝ තමන්ගේ හොඳ පොටෝ සෝෂල් මීඩියා දානවානේ ඒවා අරගෙන නියුඩ් ෆොටෝ එකකට ඔළුව බද්ධ කරලා ඒ වගේ ෆොටෝ හදලා අප්ලෝඩ් කරළා ළමයින්ව බ්ලැක් මේල් කරපු පැමිණිලිත් ලැබෙනවා. හොරෙන් වීඩියෝ කරනවා නානකොට හරි, ඇඳුම් මාරු කරනකොට හරි ඒවාගේ ඒවා. ඊළඟට ළමයි ළමයි වීඩියෝ කෝල් ගන්නවා ඒවා ස්ක්‍රීන් රෙකෝඩ් කරගන්නවා, ඒ ස්ක්‍රීන් රෙකෝඩ් කරගෙන ඒවා යූස් කරනවා. ළමයි යාළුවෙලා ඉන්න කාලේ නිරුවත් ෆෝටෝ යවලා පස්සේ ඒවා ෂෙයාර් කරගෙන. ඒවා තමයි එන්නේ වැඩිපුර.' යැයි ලැබෙන පැමිණිලි ගැන නියෝජ්‍ය පොලිස්පති රේණුකා ජයසුන්දර කියා සිටියාය.

**පැමිණිලි කළ හැක්කේ කෙසේද?**

මාර්ගගත ළමා ලිංගික අපයෝජන සම්බන්ධව https://report.iwf.org.uk/lk_en වෙත පිවිස හෝ පැය 24 පුරා ක්‍රියාත්මක 1929 ක්ෂණික දුරකතන අංකය ඔස්සේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියට පැමිණිලි කිරීමේ හැකියාව පවතී.

ඊට අමතරව පැය 24 පුරා ක්‍රියාත්මක 109 ක්ෂණික ඇමතුම් අංකයට ඇමතුමක් ලබාදීමෙන් හෝ 071 8595843 වට්ස්ඇප් අංකය ඔස්සේ මෙන්ම cwb.online@police.gov.lk දරන විද්‍යුත් ලිපිනය හරහා ළමා අපයෝජන සම්බන්ධව පොලිස් ළමා හා කාන්තා අපයෝජන නිවාරණ කාර්යාංශය වෙත පැමිණිලි කළ හැකිය.

බීබීසී සිංහල වෙබ් අඩවියෙනි.

## හත් දෙනෙක්...

PAGE - 09

අපි දන්නේ නෑ ඒක කොහොමද සිද්ධ වුණේ කියලා.

ඔහු එක වාහනයක් බේරන්න අනෙක් පැත්තට වාහනය ගත්තද කියන්න අපි දන්නේ නෑ, නරඹන්නන් දෙසට වාහනයක් ගමන් කිරීම සිදුවිය නොහැකියි. පළපුරුදු ධාවකයෙක් වාහනය ධාවනය කරද්දී. නරඹන්නන් කරපු වැරැද්ද තමයි ඔවුන් අනවශ්‍ය ලෙස ඉදිරියට පැමිණීම. කුඩා දරුවෙකුත් අරගෙන ඉදිරියට පැමිණීම. මේ වගේ කාරණාවලට සමහර වෙලාවට වන්දි ගෙවන්න සිදුවෙන්නේ මරණයෙන්. නැත්නම් ජීවිතයෙන්. ඒ නිසා එහෙම වැරැදි නොකර සිටිය යුතු බව අපිට මේක දකිද්දී තේරෙන කනගාටුදායක තත්ත්වයක්. ඉතාම කනගාටුදායකයි. අපි දැක්කා කවුදෝ කියනවා මෝටර් රථ ධාවන තරගයකදී සිදුවෙච්ච පළමු මරණ කීපය කියලා. අපි දන්නවා ගාල්ලේ සහ මීගමුවේදී මීට කලින් වින්ච් එකක් පදින්න ගිහිල්ලා තරුණයන් දෙදෙනෙක් ඒ ස්ථානයේදීම මියයනවා. ගාල්ලේ සිද්ධ වෙන්නේ වෙන සිද්ධියක්.

අපි කලින් කිව්වා වගේ දිල්ෂාන් බණ්ඩාරනායක ෆොක්ස්හිල් ට්‍රැක් එකේදී මියයනවා. ඒ වගේම ආනන්ද වෙඩිසිංහගේ රිය අනතුර සිදුවෙනවා. ඒ රිය අනතුරුවලදී කවුද වැරැදි කවුද හරි කියන එක අපි දන්නේ නෑ. අපි දන්නවා මෝටර් රථ ධාවන තරග සහ යතුරුපැදි ධාවන තරග කියන්නේ අති ධාවනකාරී සහ ඉතා භයානක තරග ඉසව්. ඒවායේදී අනතුරු සිදුවිය හැකි බව සත්‍යයක්. නමුත් අනතුරු සිද්ධ නොවිය යුතු පසුබිමක අනතුරුවලින් විශාල පිරිසක් මියයනවා නම් තවදුරටත් තරග පැවැත්වීම සම්බන්ධයෙන් පවා හිතා බලන්න සිද්ධ වෙනවා. නිසි ප්‍රමිතියෙන් යමක් කරන්නේ නැත්නම්, ප්‍රමිතිය පිළිබඳ හොයා බලන්න නිලධාරීන් පත්කරන්න බැරි නම්, තරගාවලියක තරගකරුවන් හෝ තරගාවලියේ ඉන්න සංවිධායකයන් ආණ්ඩුවට නීතියට පොලිසියට වඩා ලොකුයි වගේ දැනෙනවා නම්, ඒ අයට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කරන්න, ඒ අයට විරුද්ධව නීතිරීති පනවන්න ආණ්ඩුවට හරි පොලිසියට හරි බෑ වගේ කියලා හිතෙනවා නම් මේ තරග ඉසව් හැකි ඉක්මනින් නවත්වා දැමිය යුතුයි. ජාත්‍යන්තර මට්ටමේ තරග පැවැත්වෙන නිසා හෝ ලෝකය පිළිගත්ත ස්ථානවල මේ වගේ තරග පැවැත්වෙන නිසා හෝ මේ තරග පැවැත්විය යුතු නෑ. ඒක තමයි යථාර්ථය. මොකද අපිට බැරි නම් ස්ටැන්ඩර්ඩ් එකට මේවා කරන්න. හරියට මැක්ඩොනල්ඩ් අවන්හල් ලංකාවෙන් ගලවාගෙන ගියා වගේ මෝටර් රේසිනුත් ලංකාවේ නැවැත්විය යුතුයි. මොකද අපි දන්නවා දැන් ෆොක්ස්හිල් ධාවන පථය ඉතා වේගවත් කරලා තියෙන්නේ. පැවිල්ලත් එක්ක තරග පැවැත්වෙන ස්ථානවල දූවිලි ඇවිස්සෙනවා කියන එක දෙකේ පන්තියේ ළමයෙකුට වුණත් තේරෙන දෙයක්. දූවිලි ඇවිස්සුණාට පස්සේ ට්‍රැක් එකේ වාහනවලට ඉදිරිය පේන්නේ නෑ කියන එක ඕනෑම බබෙකුට තේරෙන දෙයක්. එහෙම වෙලාවට වතුර ඉහින්න ඕනේ කියන එක මේ තරගයේ සංවිධායකයන්ට නොතේරෙනවා විය නොහැකි වගේම මීට කලින් අවුරුදුවල මේගොල්ලෝ කළේ වතුර ඉහින එක.

නොසැලකිලිමත් වීම කියන එකට කිසිසේත්ම කිසිම ආකාරයකින් සමාවක් දිය යුතු නෑ. මේ මරණ 7ට වගකිව යුත්තේ තරග සංවිධායකයන්. ඒ වගේම ඩී.ජේ. දාලා නටන එවුන් ගැනත් හොයලා බලන්න ඕනේ.



# මෙන්න අලුත්ම ගැහිල්ල



## චාමර ඔයා ලෑස්තිවෙලා ඉන්න



**ඔබ හැමෝම දන්නවා අපේ රටට ආයෝජකයෝ එන්නේ නෑ. අපේ රටේ සමහර කර්මාන්ත වැහෙමින් තිබෙනවා. සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත 40%ක් වැහිලා. ලයිට් බිල් වැඩියි, ගාස්තු වැඩියි, ප්‍රවාහන වියදම් වැඩියි, තෙල් මිල වැඩියි. ඒ නිසා යම් කෙනෙක් ආයෝජනයක් ගේනවා නම් ඒ ආයෝජනය කරන්න ලංකාවේ ඉන්න ආයෝජකයෙක් එක්ක එකතු වෙනවා. මා ඔබට මේ කියන්න යන්නේ අපේ රටේ සුප්‍රසිද්ධ සමාගමක් දේශීය සමාගමක් විදෙස්වල ගනුදෙනු කරන සමාගමක්. මේ සමාගම ලංකාවේ පුත්තලමේ තිබෙනවා සිමෙන්ති සඳහා හුණුගල් කඩන ප්‍රදේශයක් අරුවක්කාරුව කියලා.**

මේ පොළොව හාරලා ගන්නකොට උඩ තියෙනවා පස් තට්ටුව. ඒ පස් තට්ටුවට යටින් තියෙන්නේ හුණු ගල්. ඒ නිසා සිමෙන්ති සඳහා හුණුගල් කඩලා ගත්තාම ඉතුරු පස් ටික පුරවලා ඒ වළවල් වහන්න ඕනේ. දැනට ඒ කටයුතු ඒ සමාගම් කරමින් යනවා. ඒ සමාගම් ඒ කටයුතු කරමින් යද්දී මේ වහන පස් තට්ටුවේ තියෙන ඛනිජ වැලි සම්බන්ධයෙන් පහුගිය අවුරුදු 5ක් තුළ සමීක්ෂණ කරනවා. කවුද මේ සමාගම් දෙක? ඩිල්මා සමාගම තමයි දේශීය නියෝජිතයා. ඔස්ට්‍රේලියානු සමාගමක් තමයි විදේශීය නියෝජිතයා. ඩොලර් මිලියන 120යි මේ ව්‍යාපෘතියේ ආයෝජනය. පුරවන පස්වලින් 8%ක ඛනිජ විශේෂයක් ඔවුන් සොයාගෙන තිබෙනවා. ඒ නිසා ඒ ඛනිජ විශේෂය වැලිච් ඇඩිෂන් එකක් ලෙස පස් ලෙස පුරවන ඒ පස්වලින් ඉතිරි 8%ත් අරගෙන ඒවා විදෙස්වලට විකුණන්න පුළුවන්කම තියෙනවා. ඒ නිසා ඔස්ට්‍රේලියානු සමාගමත් ලංකාවේ ඩිල්මා සමාගමත් ඒකාබද්ධව මේ රිසර්ච් එක කරලා අවුරුදු 5ක් තිස්සේ ඩොලර් මිලියන 20කට ආසන්න මුදලක් වියදම් කරලා. දැන් තියෙන්නේ මේ නිෂ්පාදනය කරගෙන යෑමට අවශ්‍ය ඉඩම් ටික ලබාගෙන කර්මාන්ත ශාලාව පටන් අරගෙන රැකියා ටික දීලා මේ ඩොලර් මිලියන 100ක විතර ආයෝජනය රට ඇතුළට ගේන්න.

ඊට අමතරව භාණ්ඩ විකුණපුවාම ඩොලර් එනවා. මේ පස් හැටියට යන එකෙන් තව 8%ක් ඛනිජ සම්පත් තියෙනවා. ඒ ඛනිජ නිෂ්පාදනය අරගෙන ඒක විකුණලා තව ඩොලර් ගේන්න පුළුවන්කම තියෙනවා. අපේ රටට විදෙස් ආයෝජකයෝ එන එකට අපේ රටේ දේශපාලනඥයන්ගේ පගා, කොමිස් කුට්ටි තමයි බාධාව කියලා අපි දිගටම කිව්වා. මේ තියෙන්නේ තවත් එවැනි වැඩක්. මේ ලංකාවේ තේ වෙළෙඳපළේ ඉන්න විශේෂ සමාගමක්. ඩිල්මා සමාගමත් සමග ඒකාබද්ධ අයෝජනයක් කරනවා ඔස්ට්‍රේලියානු සමාගම. පුත්තලම ඉල්මනයිට් ලිමිටඩ් කියලා ඒගොල්ලෝ සමාගමක් හදලා තමයි මේක කරන්නේ. ඒ නිසා මේ සමාගම මේ සමීක්ෂණ ඔක්කොම කරලා ඔවුන්ගේ සමීක්ෂණ වාර්තා අනුව භූ තලයේ තියෙන හුණුගල්, ඊට උඩින් තියෙන පස් තට්ටුව, පස් තට්ටුවල තියෙන ඛනිජ තමයි නිස්සාරණය කරලා ඒගොල්ලෝ ගන්නේ. ඒ කියන්නේ ටොන් 100ක් ගත්තොත් ටොන් 8යි එන්නේ. 8%ක තමයි මේ ප්‍රමාණය තියෙන්නේ. එතකොට මේ ව්‍යාපෘතිය වැලිව් එඩිෂන් එකක්. පසේ තියෙන ඛනිජ තෝරා බේරා අරගෙන අපනයනය සඳහා සූදානම් කරන එකක්. තව ඉදිරි වැඩිදියුණු කිරීම්වලට යන්න පුළුවන්. මේ සමාගම මේ කටයුතු සියල්ල කරලා ඔවුන්ට කැබිනට් අනුමැතිය ලැබිලා තියෙනවා මේවට. ඒ සියල්ල ඇතුළේ නීත්‍යානුකූලව කටයුතු කරගෙන යනවා. දැන් කර්මාන්ත ශාලාව පටන්ගන්න ඔවුන්ට දෙන්න ඕනේ අක්කර 30ක විතර ඉඩමක් ඒ ප්‍රදේශයෙන්. ඒ ඉඩම අයිති සිමෙන්ති සංස්ථාවට. ඒ ඉඩම් ටික ඉන්සී සමාගමට බදු දීලා තියෙන්නේ සිමෙන්ති සංස්ථාව. ඒ නිසා දැන් රජය ඩොලර් මිලියන 120ක විතර විදේශ ආයෝජනය ගෙන්වා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කරන්න ඕනේ.

දැන් මේ සියල්ල ඉවර වුණාට පස්සේ අපූරු වැඩක් වෙනවා. මේ සියල්ල ඉවර වුණාට පස්සේ මේ නිෂ්පාදන කටයුතු කරගෙන යෑම වෙනුවට මේ සමාගමට අවසර දෙන එක වෙනුවට රත්නපුරේ ඉඳන් ත්‍රිකුණාමලයට ගිහිල්ලා දේශපාලනය කරන දේශපාලනඥයකුගේ මස්සිනාගේ නමට කොම්පැනියක් පටන් අරගෙන තියෙනවා. මේ කොම්පැනිය ලංකාවේ ඉල්මනයිට් නිස්සාරණය කරන අදාළ පුත්තලම ප්‍රදේශයේ කිසිදු සමීක්ෂණයක් කරලා නෑ. එතකොට මේ සමාගමට අර ඉඩම් අයිතිය දීලා. එතකොට දැන් මොකද කියන්නේ අර ඔස්ට්‍රේලියානු සමාගම මේ ආයෝජනය ගෙනල්ලා මෙහෙ ආයෝජනය කරන්න හදන සමාගමයි, ඩිල්මා ඒකාබද්ධ ආයෝජනය ගේන්න යන සමාගමට කියනවා ඔයගොල්ලන්නට ඉඩම දෙන්න බෑ, ඔයගොල්ලෝ අර කොම්පැනිය සල්ලි දීලා ගන්න කියලා. අලුත්ම ගරානා ක්‍රමය. කොම්පැනියට ඉඩම දෙන්න, සල්ලි දෙන්න බෑ කියලා ඒ කොම්පැනියත්, දේශීය සමාගමුත් කියනකොට අපේ රටේ දේශපාලනඥයෝ කරන්නේ මොකක්ද? තමන්ගේ ඥාතීන් දාලා කොම්පැනියක් හදනවා. හදලා ඒ කොම්පැනියට අර ඉඩම් ටික දෙනවා. ඉඩම් ටික දීලා දැන් කියනවා අර ඔස්ට්‍රේලියානු ශ්‍රී ලංකා ඒකාබද්ධ ව්‍යාපෘතියට ඔයගොල්ලෝ වැඩේ කරන්න ඕනේ නම් මේ කොම්පැනිය සල්ලි දීලා ගන්න කියලා. කොම්පැනිය හදන්න යන්නේ පොඩි ගානයි. එතකොට කොම්පැනිය සල්ලි දීලා ගත්තාම ඒ කොම්පැනියට අයිති ඉඩම් තියෙනවා. එතකොට මේ සමාගමට ඒ වැඩටික කරගෙන යන්න පුළුවන්. කොහොමද සැලසුම? කොහොමද ගැහිල්ල? මේක බාරව ඉන්න ඇමැතිවරු ඉදිරියේදී මේවට උත්තර දෙන්න ඕනේ.

චාමර සම්පත් ඇමැතිවරයා තමයි රාජ්‍ය ඇමැතිවරයා හැටියට ඉන්නේ. පොස්ෆේට් සමාගමේ පහුගිය කාලේ පොස්ෆේට් 28000 එක 23000ට අඩුකරලා වැට් එක සමාගමෙන් ගෙවන්න සැලසුම් කරමින් හිටියේ ඔහු ඇතුළු මේ කණ්ඩායම. සාමාන්‍යාධිකාරිවරයා කිසිදු අනුමැතියකින් තොරව වැට් එක රාජ්‍ය සමාගමක් හැටියට පොස්ෆේට් සමාගමෙන් ගෙවන්න සැලසුම් සකස් කරමින් තිබෙනවා. 28000ට විකුණන ටොන් එක 23000ට අඩුකරනවා කිසිදු යෝජනාවක් නැතුව. එළියේ ගොවියා ගන්න ගියත් ටොන් එකකට අදාළ මිලක් තියෙනවා. එතකොට ගොවියත් වැට් එක ගෙවන්න ඕනේ. එහෙම තියෙද්දී එහෙම වැඩ කරපු අය අලුත්ම ගරානා ක්‍රම තමයි මේ හොයාගෙන යන්නේ. ඒ නිසා අපි අහනවා දැන් දේශීය සමාගමක් විදේශීය ආයෝජකයෙක් සමග ඒකාබද්ධව රටේ ඛනිජ සම්පත් ගවේෂණය කරලා මේ මහ පොළොවට පස් ලෙස යටකරමින් වහමින් තියෙන මේ පස්වල තියෙන ඉල්මනයිට් නිස්සාරණය කරලා අරගන්න ඔවුන් සූදානම් වෙලා තියෙනවා. ඒ සඳහා ඔවුන් සමාගමක් හදලා පරීක්ෂණ කරලා ඩොලර් මිලියන 20ක් විතර වියදම් කරලා තියෙනවා. ඒ වියදම් කරපු සමාගමට ඒ වැලිව් ඇඩිෂන් එක, අගය එකතු කිරීම සහිත ඒ නිස්සාරණ කටයුත්ත කරලා ඒ ඉල්මනයිට් අපනයනයට අවශ්‍ය කරන, එහෙම නැත්නම් ඒ ඉල්මනයිට් විදෙස් රටවලට විකුණන්න අවශ්‍ය කරන ඩොලර් මිලියන 100ක කර්මාන්තය පටන්ගන්න ඉඩ නොදී, අපි අහනවා කොහොමද කැබිනට් මණ්ඩලයේ අනුමත කරන්නේ මේ මොකක්වත් නොකරපු දේශපාලන හිතවත්කම්වලින් පටන්ගත්ත කොම්පැනියකට මේක දෙන්නේ? අපි ළඟ තියෙනවා කොම්පැනියේ නමත්. මේ කොම්පැනිය තමයි මේක දීලා තියෙන්නේ.

ඒ නිසා දැන් මේ සමාගම් මේ ක්‍රියාවලීන් සියල්ල සිදුවෙමින් යනවා. ඒ නිසා මේ සියල්ල සිදුවෙමින් යනකොට මේ කටයුත්ත සම්පූර්ණම නොමග යවලා සිමෙන්ති සංස්ථාව මේ කටයුත්ත සඳහා ඉඩම් ලබාදුන් ලියවිලි අපි ගාව තියෙනවා. අපි අහනවා විදේශ ආයෝජකයෝ අපේ රටට එයිද මේ වගේ වැඩ කරපුවාම? විදේශ ආයෝජන ගේන්න, විදේශ ආයෝජන කරන්න කිව්වාම ඔන්න රනිල් රාජපක්ෂලාගේ ආණ්ඩුව අද විදේශ ආයෝජකයෝ දේශීය ආයෝජකයන් සමග යම් කිසි විශ්වාසයක් හදාගෙන ලංකාවට ඇවිල්ලා ඉන්න ආයෝජකයන්ට අද ආයෝජනය කරන්න ඉඩ දෙනවද? අද ඔවුන්ට ලංකාවට ඩොලර් ගේන්න දෙනවද? නෑ. කොමිස් ගහන්න ගිහිල්ලා බැරි වුණාම අවසානයේ සමාගම් හදලා කියනවා ඔයගොල්ලෝ වැඩේ කරන්න ඕනේ නම්, ඒ සමාගම මිලදී ගන්න, සමාගම සතු ඉඩම් තියෙනවා, අන්න එතකොට ඕගොල්ලන්ට වැඩේ කරන්න පුළුවන් කියලා.

අපි මේ පිළිබඳ දූෂණ විරෝධී හඬ සංවිධානය ලෙස සිමෙන්ති සංස්ථාව කොහොමද මේ කිසිදු නිෂ්කාශනයක් නොකරපු සමාගම්වලට මේ ඉඩම් දුන්නේ කියලා අපි අහනවා. අපි ළඟ තියෙනවා ඒ සමාගමේ සමාගම් රෙජිස්ටර් වෙලා තියෙන විස්තරේ. අධ්‍යක්ෂවරු කවුද කියලා අපි ළඟ තියෙනවා. අපි ඉදිරියට තවදුරටත් මේ කරුණු හෙළිදරව් කරනවා. අපි කියනවා සිමෙන්ති සංස්ථාව අර පරීක්ෂණ කරපු අදාළ ඉල්මනයිට් නිෂ්පාදනයට අවශ්‍ය කරන සියලු කැණීම් නිෂ්කාශන සියල්ල කරපු සමාගම්වලට මේක දෙන්නේ නැතුව කොහොමද ඒ මොකක්වත් නොකරපු සමාගමකට මේ ඉඩම බදු දෙන්නේ? ඒ දෙන එක ඇතුළේ තියෙන අරමුණ තමයි ඉඩම සහිත කොම්පැනිය අර සමාගමට විකිණීම හරහා මුදල් ඉපයීම. ඒ නිසා අපි අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවට මේ පිළිබඳ පැමිණිලි කරනවා. ඒ පැමිණිල්ල හරහා අපි පරීක්ෂණයක් බලාපොරොත්තු වෙනවා. විදේශ ආයෝජන ගෙන්වීම වළක්වන්න කටයුතු කරන නිලධාරීන්ට අදාළවත් මේ ජාවාරම්වලින් අපේ රටට එන්න තියෙන විදේශ ආයෝජන නවත්වන්නටත් කටයුතු කරන මේ නිලධාරීන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කරන්නටත්, මේ පිටිපස්සේ ඉන්න දේශපාලනඥයන් හෙළිදරව් කරන්නටත් කටයුතු කරනවා කියන එක දූෂණ විරෝධී හඬ සංවිධානය කටයුතු කරනවා කියන එකත් අපි අවධාරණය කරලා කියනවා. අපි මේ නිලධාරීන්ට කියනවා මේ රට මෙතැනට වට්ටපු දූෂිත දේශපාලනඥයෝ තවදුරටත් මේ රට අපකීර්තියට සහ රට ඉස්සරහට කළු පැල්ලම් එකතු කරද්දී ඒවාට දායක වෙන්න එපා කියලා. මේ රට තවදුරටත් වට්ටන්න ලෑස්ති වෙන්න එපා කියන කාරණයත් දූෂණ විරෝධී හඬ සංවිධානය ලෙස අපි අවධාරණය කරලා කියනවා.

The News Reporter යූටියුබ් නාලිකාවෙනි

# යූටියුබ්කාරයෝ උඩ දාලා ගැහුවා පත්තරකාරයෝ කැත විදිහට ගැහුවා

## දමිතට ඇප දෙමින් මෙන්න විනිසුරුවරයා දීපු තීන්දුව



- **ආගාමික විගාමික පනත යටතේ නඩුව පවත්වාගෙන යන්න බෑ**
- **මේ පනත යොදාගෙන තියෙන්නේ සැකකරුවන්ට ඇප දීම අවහිර වෙන විදිහට**
- **විමර්ශනවල සැලකිය යුතු ප්‍රගතියක් පෙනෙන්නේ නෑ**

**නීත්‍යනුකූල විදේශ රැකියා නියෝජිත ආයතනයක් නොමැතිව කොරියාවේ රැකියා අවස්ථා ලබාදෙන බව පවසා මුදල් වංචා කළේ යැයි කියන රංගන ශිල්පිනී දමිතා අබේරත්න හා ඇගේ සැමියාට එරෙහිව ආගාමික විගාමික පනත යටතේ මෙම නඩුව පවරා පවත්වාගෙන යෑමට හැකියාවක් නැතැයි කොටුව මහෙස්ත්‍රාත් කෝසල සේනාධීර මහතා විවෘත අධිකරණයේදී පසුගිය 24 වැනිදා පැවැසීය.**

මෙම වංචා සිද්ධියට රහස් පොලිසිය ආගාමික විගාමික පනත යොදාගෙන ඇත්තේ සැකකරුවන්ට ඇප දීමට උසාවියට ඇති හැකියාව අවහිර වන අන්දමට බව පෙනෙන්නට ඇතැයිද මෝසමක් මාර්ග යෙන් අධිකරණයට භාරවීමට උත්සාහ කළ අයකු අධිකරණය මගහරිමින් විමර්ශන කටයුතුවලට බාධා කරනු ඇතැයි විශ්වාස කළ නොහැකි යැයිද සඳහන් කළ මහෙස්ත්‍රාත්වරයා සිද්ධියට අදාළව දින 18ක කාලයක් රිමාන්ඩ් භාරයේ රඳවා සිටි රංගන ශිල්පිනී දමිතා අබේරත්න හා ඇගේ සැමියා වන ලෙන්ලි ජොන්සන් කොන්දේසි සහිත ඇප මත මුදාහළේය.

රුපියල් ලක්ෂ පනහ බැගින් වටිනා ඇපකරුවන් දෙදෙනකුගේ ශරීර ඇප මත සැකකරුවන් මුදාහැරීමට නියම කළ මහෙස්ත්‍රාත්වරයා ඇප තැබීමෙන් අනතුරුව සෑම මසකම අවසන් ඉරිදා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව හමුවේ පෙනී සිටීමේ ඇප කොන්දේසියක්ද පැනවීය.

කොරියාවේ රැකියා ලබාදෙන බවට පවසා රුපියල් ලක්ෂ 30ක වංචාවක් කළේ යැයි කියන සිද්ධියට අදාළ පැමිණිල්ල කැඳවූ අවස්ථාවේදී සිද්ධියට අදාළව රිමාන්ඩ් භාරයට පත්කර සිටින දමිතා අබේරත්න සහ ඇගේ සැමියා වන ලෙන්ලි ජොන්සන් නමැත්තා බන්ධනාගාර නිලධාරීහු විසින් අධිකරණයට ඉදිරිපත් කරනු ලැබූහ.

පැමිණිල්ල කැඳවූ අවස්ථාවේදී සිද්ධියට අදාළව කෙරුණු විමර්ශනවල ප්‍රගතිය දැක්වෙන වැඩිදුර වාර්තාවක් ඉදිරිපත් කළ රහස් පොලිස් නිලධාරීහු ආගාමික විගාමික පනතේ 45 ඇ 1 වගන්තිය යටතේ සැකකරුවන්ට එරෙහිව ආරම්භ කළ විමර්ශන තවදුරටත් පවත්වාගෙන යන්නේ යැයි කීහ.

සැකකරුවන් අධිකරණයට ඉදිරිපත් කර ඇති ආගාමික විගාමික පනත අනුව සැකකරුවන්ට ඇප නියම කිරීමට මෙම අධිකරණයට බලයක් නැතැයිද, ඔවුන්ගේ ඇප ඉල්ලීම මහාධිකරණයට ඉදිරිපත් කළ යුතු යැයිද කී රහස් පොලිස් නිලධාරීහු ඔවුන් තවදුරටත් රිමාන්ඩ් කරන්නැයිද ඉල්ලා සිටියහ.

සැකකරුවන් වෙනුවෙන් පෙනීසිටි නීතිඥ අජිත් පතිරණ මහතා කරුණු දක්වමින් තම සේවාදායකයන්ගේ පෞද්ගලික නිදහසේ අයිතිය තහවුරු කිරීමට අධිකරණය බැඳී සිටින්නේ යැයි කීය.

ආගාමික විගාමික පනත යටතේ තම සේවාදායකයන්ට එරෙහිව විමර්ශන නිලධාරීන් අධිකරණය සෑහීමකට පත්වන ආකාරයේ සාක්ෂි ඉදිරිපත් කළ යුතු වුවත්, මෙතෙක් විමර්ශන නිලධාරීන් තම සේවාදායකයන්ට එරෙහිව අධිකරණය සෑහීමකට පත්වන ආකාරයේ සාක්ෂි ඉදිරිපත් කර නැතැයි නීතිඥ අජිත් පතිරණ මහතා කීය.

ඒ අනුව වංචා විමර්ශන ඒකකය යටතේ තම සේවාදායකයන්ට එරෙහිව තිබූ මෙම පැමිණිල්ලේ කිසිදු අන්තර්ජාල වරදක් වී නැතත්, පොලිස්පතිවරයාගේ වුවමනාවට රහස් පොලිසියේ පරිගණක අපරාධ විමර්ශන ඒකකයට යොමුකර ඇතැයිද කීය.

තම සේවාදායකයන් වාහන ගනුදෙනුවක් සඳහා මුදල් හුවමාරු කරගෙන ඇතත් විදේශ රැකියා සඳහා මුදල් ලබාගෙන නැතැයි කී නීතිඥ අජිත් පතිරණ මහතා මෙම පැමිණිල්ල ආගාමික විගාමික පනතේ වගන්ති 18න් එක් වගන්තියක් යටතට හෝ වැටෙන්නේ නැති හෙයින් තම සේවාදායකයන්ට ඇප නියම කරන්නැයි ඉල්ලා සිටියේය.

දෙපාර්ශ්වයේ කරුණු සලකා බැලීමෙන් අනතුරුව මෙම පැමිණිල්ල ආගාමික විගාමික පනත යටතේ පවරා පවත්වාගෙන යෑමට හැකියාවක් නැතැයි පෙන්වා දුන් මහෙස්ත්‍රාත්වරයා මේ තත්ත්වය යටතේ සැකකරුවන්ට ඇප දීමේ බලය තම අධිකරණයට ඇතැයි සඳහන් කළේය.

සැකකරුවන් රක්ෂිත බන්ධනාගාරගත කර විමර්ශන සඳහා සෑහෙන කාලයක් විමර්ශකයන්ට ලැබී තිබුණත් විමර්ශනවල සැලකිය යුතු ප්‍රගතියක් තම අධිකරණයට නිරීක්ෂණය නොවන බව පෙන්වා දුන් මහෙස්ත්‍රාත්වරයා, මේ තත්ත්වය යටතේ සැකකරුවන්ට ඇප දීමට තීරණය කරමින් කොන්දේසි සහිත ඇප මත සැකකරුවන් මුදාහැරීමට නියම කළේය. මෙම පැමිණිල්ල යළි කැඳවන ලබන මස 29 වැනිදා අධිකරණයේ පෙනී සිටින ලෙස සැකකරුවන්ට නියම කළේය.

සැකකරුවන් වෙනුවෙන් නීතිඥවරුන් වන තරිඳු වික්‍රමනායක, හරිත් හෙට්ටිආරච්චි, බුද්ධික කරුණානන්ද සහ ගයාන් කලටුවාව සමග නීතිඥ අජිත් පතිරණ මහතා පෙනී සිටියේය.



# තමන්ගේ සින්දුවක් අනුන්ට කියන්න නොදී නඩු දාන.. තහනම් නියෝග ගන්න.. වන්දි ඉල්ලන මහ ලොකු කලාකරුවනේ



## ඉරේෂා හේමමාලිගෙන් රවී රොයිස්ටර්ගෙන් පාඩමක් ඉගෙන ගනිල්ලා

යුතුකම් පැහැර හැරීම බරපතළ පාපයකි. යුතුකමක් කියන්නේ යම් කිසිවකු වෙනුවෙන් තවත් කිසිවකු කරන්නට නියම වූ කිසියම් මෙහෙවරකි. නිදසුනක් විදියට ගත්තොත් තමන්ව මෙලොවට බිහිකොට හදාවඩා, උස් මහත් කළ මවුපියන් මහලු වූ කල බලාකියා ගැනීම යුතුමක් විදියට ගත හැකිය. අන්න ඒ වාගේ යුතුකමක් පැහැර හැරීම දෙවියන් හමුවේ දඬුවම් ලැබිය හැකි අපරාධයකි. බෞද්ධ දර්ශනයට අනුවද එවැනි යුතුකමක් පැහැර හැරීම දිට්ඨ ධම්මවේදනීය කර්මයට අනුවද පෙරළා විපාක ලැබෙන පාපයකි. ඒ පාපය කොයි මට්ටමින් සිදුවුවද එවැනි යුතුකමක් පැහැර හැරීම වෙනුවෙන් නඩුවක් ගොනුකරන අවස්ථාවන් හෝ නඩු කියන අවස්ථාවන් දකින්නට නැත. නඩු ගොනුවන්නේ සහ දිගින් දිගට නඩු කියැවෙන්නේ වගකීම් හෝ වගවීම් පැහැර හැරිය අයටය. වගකීමක් සේම වගවීමක් පැහැර හැරීම යුතුමක් පැහැර හරිනවාට වඩා බරපතළම කාරණයකි. යුතුකම් පැහැර හැරිය අයට දඬුවම් ලැබෙන්නේ ස්වභාව ධර්මයෙන් වුවද වගකීම් සහ වගවීම් පැහැර හරින්නන්ට දඬුවම් කරන්නේ අධිකරණයෙනි.

කලා ක්ෂේත්‍රය තුළ නිර්මාණකරණයේදී ගෙවියයුතු කර්තෘභාගය නොගෙවා සිටීමද වගකීම් සහ වගවීම් පැහැර හැරීමකි. ඒවාට නඩු ගොනුවුවහොත් දඬුවම් ලැබීම ඒකාන්තය. ශ්‍රී ලාංකේය සංගීත කලාවේ එවැනි සංසිද්ධීන් කිහිපයක්ම සිදුවිය. ප්‍රවීණ ගායක සහ සංගීත ශිල්පී ක්ලැරන්ස් විජේවර්ධනගේ බිරිය තම සැමියාගේ ගීත පරිහරණය කරන්නන් ඒවාට හිමිවිය යුතු කර්තෘභාග නොගෙවන බවත්, එය තමාට ලැබෙන්නට සලස්වන ලෙසත් ඉල්ලමින් සිය කන්නලව්ව ශ්‍රේෂ්ඨාධිකරණයට යොමුකොට තිබිණි. එසේම ප්‍රවීණ කලා ශිල්පී විජේරත්න වරකාගොඩ තමා ගැයූ 'රඟහල දැන් ඇත අඩ අඳුරේ' නම් ගීතය ජනප්‍රිය සංගීත ශිල්පී සංගීත් විජේසූරිය විසින් රීමික්ස් කර තම අවසරයකින් නැතිව හිතුමතේට ගායනා කරන බවට නඩු දමා ලක්ෂ විස්සක වන්දියක් ලබාගත්තේ දශක කිහිපයකට පමණ පෙරය. කර්තෘ භාග ගැන අලුත්ම කතන්දරය වන්නේ තරුණ තරුණියන්ගේ වාගෙම වැඩිහිටි සිත්සතන් තුළද විශාල උන්මාදයක් ඇතිකළ ප්‍රවීණ සංගීත ශිල්පී සේනක බටගොඩ හේතුවෙන් අසාධාරණයට ලක්වූ බව කියන ප්‍රවීණ සංගීත ශිල්පී ජනිත් කුලතිලකගේ සිදුවීමය. ඒ කර්තෘභාගය සහ වගකීම් වගවීම් පැහැර හැරීම නිසා බටගෙ ාඩට සිදුවූයේ ලක්ෂ ගණනක් මුදලින් ගෙවනවාට වැඩිය ලොකු පාඩුවකි. බටගෙ ාඩ වැඩිපුරම ප්‍රිය කරන, බටගොඩගේ හඬට උමතු වී සිටින සංගීත ලෝලීන් වැඩිපුරම ප්‍රිය කරන ලස්සනම සින්දු 7ක් ගායනා කිරීමේ අයිතිය ඔහුට අහිමිව ගියේය. දඬුවම ඉතා දරුණු වුවද ඒ දඬුවම ඔහුට ලැබුණේ සිය වගකීම් සහ වගවීම් පැහැර හැරිය නිසාය. කොයික කෙසේ වුවද ගෞරවනීය අධිකරණ තීන්දුවලට අප හිස නැමිය යුතුය. ඒ හින්දා ඒ කතාව පැත්තකින් තියමු.

ඒ කතාව වෙනුවට තව කතාවක් අද කියන්නට ලියන්නට තියෙනවාය. ඉහත කියාපු කතාව මේ කතාවට ඈඳා ගත්තේ හිතට තදින් දැනෙන ආරම්භයක් ගැනීමටය. ඒ ආරම්භය එහෙම හෙව්වේ ඒ කතාවට මේ කියන්නට යන කතාව වක්‍රව සම්බන්ධ වන නිසාය. හැබැයි ඒ කතාවේ තිබුණු කර්තෘභාග හබ, නඩුහබ සහ චෝදනා මේ කතාවේ කොහෙත්ම නැත. කෙටියෙන් කියනවා නම් මෙය මානුෂීය වූ සංවේදී කතාවකි. කතාව සෝෂල් මීඩියාවල සහ අනෙකුත් මාධ්‍යවල දිගට හරහට ප්‍රසිද්ධ වෙන්න ගත්තේ හදිසියේ යන්න ගිය හිටපු නියෝජ්‍ය අමාත්‍ය පාලිත තෙවරප්පෙරුම මහතාගේ අකල් මරණයත් සමගය.

වැඩිහරියක් දෙනා මරණය කියන වචනයට මඳක් තිගැස්සුණද ලොකුවට බය වුවද පාලිත තෙවරප්පෙරුම තම මරණය ගැන සහ මරණයෙන් පසුව කළ යුතු දේ ගැනද සිනාමුසුව කතා කළේය. තම දේහය කනත්තට ගෙන යන විට කිවයුතු සින්දුවක් ගැනද ඔහු තමා අසල සිටින පවුලේ උදවියව දැනුවත් කර තිබිණි. මාධ්‍ය හරහාද එය කිහිප වතාවක්ම කීවේය. ඒ සින්දුවට නම තැබුණේ 'හමාර බණවර' කියාය. ගීතයක අයිතිය තියෙන්නේ පදවැල සහ තනුව නිර්මාණය කළ නිර්මාණකරුවන්ටය. හමාර බණවර සින්දුවේ සංවේදී වචන එකතුව අපූරුවට රචනා කළේ ප්‍රවීණ සංගීත ශිල්පිනී ඉරේෂා හේමමාලිය. ඒ පදවැල් ගෙතීම හරහා ගැඹුරු හඬින් එය ගායනා කිරීමේ අයිතිය තිබුණේ රවී රොයිස්ටර් නම් තරුණ සංගීත ශිල්පියාටය. පාලිත තෙවරප්පෙරුම 'හමාර බණවර' සින්දුවට තදින්ම ඇලුම් කළේය. විශේෂයෙන් ලොකු පුතාගේ කම්පාසහගත අකල් මරණයෙන් පස්සේ පාලිත ඒ සින්දුවට වෙනදාටත් වැඩිය සමීප විය. කොයි තරම් සමීප වුණාද කියනවා නම් එහි පදවැල් වෙනස් කර තමාට ඕනෑ හැටියට හදාගෙන තම මරණයේ ගායනය එය යැයි කියන හැඟීම මත ඔහු එම ගීතය ගැන නිතර කතා කළේය. රූපවාහිනී වැඩසටහන්වලට වගේම ගුවන්විදුලි වැඩසටහන්වලටද ආවාම මුළු රටටම ඇහෙන්න,

'මේ හමාර බණවර සින්දුවට මගේ හිතේ තියෙන්නේ පුදුම ආසාවක්. කවදා හරි මේ සින්දුව මම මැරුණු දවසක මගේ අවමඟුල් පෙරහැරේදී ගැයෙන්න ඕනෑ. හැබැයි මම මේක මට ඕනෑ තාලෙට වෙන වෙන වචන දාලා හැදුවා. ඔන්න අහගන්න. මම ඒක කියනවා හැමෝටම ඇහෙන්න. මගේ අවමඟුල් පෙරහැරේදී කියන්න ඕනෙත් මට වුවමනා විදියට වචන වෙනස් කරපු මේ සින්දුව තමයි. අයිති කට්ටියගෙන් නම් අවසර ගත්තේ නැහැ. ඒකට අමනාප වෙන්න එපා, කියනවා ඕං...'

පෞද්ගලික රූපවාහිනී සේවාවකට තම දේශපාලන මිතුරකු සමග පැමිණි පාලිත ප්‍රසිද්ධියේම එහෙම කිව්වේ හැමෝටම ඇහෙන්නට ඉතාම මෑතකදීය. ඒ කියමනෙන් පසු ඔහු තමා මනාප විදියට හදාගත්ත හමාර බණවර ගීතය ගායනා කළේය. කිහිප වතාවක්ම තව තව රූපවාහිනී වැඩසටහන්වලද ගැයුවේය. යූටියුබ් ප්‍රෝග්‍රෑම්වලද ගැයුවේය. හැබැයි ඒ ගායනය ඒ පද රචනය වෙනස් කළාට එයට අවසර ගත්තේ නැතුව ගියාට පාලිත තෙවරප්පෙරුමට නඩු වැටුණේ නැත. චෝදනා කළේ නැත. ඉරේෂා හේමමාලිවත් රවී රොයිස්ටර්වත් කිසිම තැනක ඒ ගැන අවලාදයක් කීවේ නැත. සින්දුවක වචනයක් වැරැදුණත් සෝෂල් මීඩියාවලට ඇවිදින් ඒ වරද කළ අයට රටේ නැති නීතිත් පෙන්නලා කෑකෝ ගහන අය ඉන්න රටට ඉරේෂලා, රොයිස්ටර්ලා අපට දුන්න ආදර්ශය මොන තරම් වටිනවද?

ගරු කළ යුතුම තවත් කාරණයක් වේ. ඒ, රවී රොයිස්ටර් විසින් පාලිත තෙවරප්පෙරුමගේ අවමඟුල් පෙරහැර දින හමාර බණවර ගීතය ඉතා හැඟීම්බරව ගායනා කිරීම ගැනය. කාගෙත් හදවතේ ගැස්ම මොහොතකට නතර කර දැමූ ඒ හමාර බණවර ගීතයේ වූයේ පාලිත විසින් හිතුමතේට සකස් කළ ඔහුගේ හිතේ දුකට සමහර තැන් වෙනස් කර ලියූ පද රචනයය. ඉරේෂා හේමමාලිගෙන්වත් ඒ සංවේදී මෙහෙවර වෙනුවෙන් කිසිම ඇටැක් එකක් ආවේද නැත. මුහුණු පොත පුරාම ඒ වෙනුවෙන් ඉරේෂාටත් රොයිස්ටර්ටත් බොහෝ ගුණ ගයන පෝස්ට් මුදාහැර තිබිණි. විශේෂයෙන් ඉරේෂා හේමමාලි ගැන එහි වර්ණනාත්මකව වැඩියෙන් ලියැවී තිබුණේය.

'නිර්මාණ කියන්නේ නිර්මාණකරුවන්ට තමන්ගේ දරුවන් වාගේ දෙයක්. ඉතින් තමාගේ රසිකයෙක් තමන් ලියපු හමාර බණවර ගීතයේ වචන වෙනස් කරලා ගත්ත එකට. ඒ වගේම මුල් ගායකයා ලව්වා එය නැවත ගායනා කරවීම ගැන නිර්ලෝභීව එකඟතාව පළකිරීම ගැන එය රචනා කළ ඉරේෂා හේමමාලිට බොහොම ස්තුතියි. කාටවත් මහ ලොකුවට නොපෙනුණාට ඒක අද වාගේ සමාජයක සිදුවූ ගෞරවනීය පරිත්‍යාගයක්....'

මුහුණු පොතේ තැනුණු එක් පෝස්ටුවක හමාර බණවර සින්දුවේ වෙනස් කිරීම ගැන සහ එයට විරුද්ධ නොවීම ගැන එහෙම ලියැවී තිබිණි. ඒ පාමුල කමෙන්ට්ස් බොහොමයක් විය. ඒ එක් කමෙන්ටුවක මෙලෙස විය.

'අපි හැමෝම මැරෙන බවත්, හැම දේම අනියත ලෝකේ මරණය විතරක් නියත බවත් ඇය තේරුම් අරගෙන ඇති. ඇත්තටම යථාර්ථය එයම නොවේද?'

කිව්වත් වාගේ ඒ පුංචි කමෙන්ටුව හරි වටින්නේය. ඉරේෂා හේමමාලි පාලිත තෙවරප්පෙරුමට දුන් ගෞරවය ඊට වඩා වටින්නේය.

ඉරේෂා හේමමාලි ඔබට ස්තුතියි. රොයිස්ටර් ඔබටත් එක්ක දෙන්නටම ස්තුතියි. 'මව්රට' අපේ ආචාරයත් පිළිගන්න.

දමයන්ති රේණුකා ප්‍රනාන්දු

# චීන ෂැංග්‍රිලාවට අභියෝග කරමින් ගාලුමුවදොරට ආ ඉන්දීය දැවැන්තයා

මේ අපූරු සුන්දර අතීතය මට තවම හොඳින් මතකය. එනම් මෙම කාලවකවානුව වසර 50කට පෙර අතීතයක් කරා දිවයයි. හරියටම කිවහොත් එම කාලය 70 දශකය ලෙසින් හැඳින්විය හැකිය. හැටේ දශකයේ අවසානයේත්, හැත්තෑව දශකයේ ආරම්භයේදීත් ශ්‍රී ලංකාවේ තිබුණු එක්තරා ගොඩනැගිල්ලක කතාව මෙම අපූරු රසබර පුවත විය. එම සුවිශේෂ කතාන්දරය නම් එකල මෙරට තිබුණු උසම ගොඩනැගිල්ලේ පුවතයි. එනම් මෙයට හරියටම දශක 5කට (වසර 50ක්) පෙර මෙරට තිබුණු උසම ගොඩනැගිල්ල වූයේ කොළඹ කොටුවේ පිහිටා තිබෙන සෙලින්කෝ ගොඩනැගිල්ලයි. එවිට එහි උස ප්‍රමාණය තට්ටු 12ක් විය. එකල ජනතාව මෙම ගොඩනැගිල්ල දුටු විට තම දෙනෙත් විස්මයෙන් හා අදහාගත නොහැකි ආකාරයෙන් බලා සිටියේය. වසරේ දින දෙකක් රාත්‍රියේදී මෙම සෙලින්කෝ ගොඩනැගිල්ල තුළට පොදු ජනතාවට පිවිසීමට අවස්ථාව ලබාදී තිබිණි. එම විශේෂිත දින දෙක නම් වාර්ෂික වෙසක් උත්සවයට අදාළ වන දින දෙක වෙයි. එම දින දෙකේදී මෙම ගොඩනැගිල්ල අසල යුද පිටියක ස්වරූපයක් ගත්තේය.

මෙම කියන කාලයේදී මම වයස අවුරුදු 12-15ක පමණ පාසල් සිසුවකුව සිටියෙමි. එකල සෑම වසරකදීම වෙසක් උත්සව දින දෙකේදී සෙලින්කෝ ගොඩනැගිල්ලේ ඉහළම 12 වැනි තට්ටුවට නැගීමට එම ව්‍යාපාර පාලනාධිකාරිය විසින් පොදු ජනතාවට අවසර ලබාදුන්නේය. එකල සිටි ජනහිතකාමී වෙළෙඳ ව්‍යාපාරිකයකු වූ ජස්ටින් කොතලාවල මහතා මෙම ගොඩනැගිල්ලේ අයිතිකරුවා විය. ඔහු දේශමාන්‍ය ලලිත් කොතලාවල මහතාගේ පියා විය. වෙසක් දින දෙකේදී සෙලින්කෝ ගොඩනැගිල්ල නැරඹීමට එන ජනතාව සවස් යාමය වන විටදී එම ගොඩනැගිල්ල ඉදිරියේ පිළිවෙළට පෝලිම් ගැසී සිටිය යුතුය. මෙම අපූරු අවස්ථාව උදාකර ගැනීමට මටද හැකි විය. එනම් මාගේ පියා විසින් මමත් මාගේ නංගී සහ මල්ලීත් මෙම ගොඩනැගිල්ල නැරඹීමට එක් වෙසක් දිනයක රැගෙන ගියේය. අපද ගොඩනැගිල්ල ඉදිරිපිට පෝලිමේ රැඳී සිටිමින් එම අවස්ථාව ලබාගත්තේය. එකල පවා මෙම ගොඩනැගිල්ල තුළ විදුලි සෝපානයන් සහ විදුලි තරප්පු පේළිද සවිකර තිබුණේය. ඉහළම 12 වැනි තට්ටුවේ විවෘත වූ විශාල සඳලුතලයකින් යුක්ත මහලක් විය. ජනතාව එය මතට පැමිණ වෙසක් දිනයේ විවිධ විදුලි බුබුළුවලින් සැරසී තිබෙන කොළඹ නගරයේ සිරි නරඹන්නට විය. වසර 50කට පෙර මම ලැබූ මෙම අත්දැකීම තවද මාගේ මනසින් නොමැකී පවතී.

අද ඔබට මෙවැනි සුන්දර අතීතයක වගතුග කියමින් මෙම කතාව ලියා තැබුවේ ඇයි? එයට හේතුවූයේ මෙයට දින කිහිපයකට පෙර වාර්තා වූ පුවතකි. පසුගියදා කොළඹ කොටුව ප්‍රදේශයේදී විවෘත කෙරුණු අතිසුඛෝපභෝගී දැවැන්ත සංචාරක හෝටලයක කතාන්දරය එය විය. එදා වසර 50කට පෙර තට්ටු 12ක ගොඩනැගිල්ල මෙරට තිබුණු උසම ගොඩනැගිල්ල වූවා සේම අද මෙරට තුළදී නව ගොඩනැගිලි අහස් කුස කරා යන්නේ දෙනෙත් අදහාගත නොහැකි ආකාරයෙනි. මෙලෙස තට්ටු පිට තට්ටු ගොඩනැගුණු සුවිශාල සුපිරි ගොඩනැගිලි රාශියක්ම අද ශ්‍රී ලංකාව තුළ දක්නට හැකිය. මේ ආකාරයේ අතිශය සුඛෝපභෝගී ගොඩනැගිල්ලක් මෙයට දින කිහිපයකට පෙරදීද විවෘත විය. මෙය සංචාරක හෝටල් සහ සුපිරි නිවස්න ගොඩනැගිල්ලකි. මෙම කතාව අප සොයා බලමු.



ප්‍රියන්ත හෙට්ටිගේ

මෙයට දින කිහිපයකට ඉහතදී ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා අතින් විවෘත කෙරුණු මෙම සුපිරි හෝටල් සංකීර්ණයේ නාමය වන්නේ 'අයි.ටී.සී. රත්නදීප' (ITC Ratnadipa) යන්නය. 2014 වසරේදී ඉදිකිරීම ආරම්භ කරන ලද මෙම ගොඩනැගිල්ල වසර 10ක ඉදිකිරීමකින් පසුව දැන් ජනතාවගේ අයිතියට පවරා ඇත. තට්ටු 33කින් සමන්විත මෙම සුඛෝපභෝගී හෝටල් සංකීර්ණයේ උස මීටර් 140ක් (අඩි 460) බව ප්‍රකාශ වෙයි. මෙහි හෝටල් කාමර 352කින් සමන්විත ඉහත මීටර් 140 ගොඩනැගිල්ලට අමතරව එයට අනුබද්ධිතව තවත් මීටර් 224කින් (අඩි 735) උසකින් යුක්ත නිවාස සංකීර්ණ ගොඩනැගිල්ලක්ද වෙයි. මෙම අපූරු ගොඩනැගිලි නිර්මාණයෙහි අතිශය සුවිශේෂත්වය වන්නේ මෙම ගොඩනැගිලි දෙකම මීටර් 55ක් දිග (අඩි 180) අහස් පාලමකින් එකිනෙකට සම්බන්ධ වීමය. මෙම සුපිරි පාලම අවට පරිසරය පෙනෙන සේ වීදුරුවලින් නිර්මාණය වී තිබේ. මෙය 'අහස වන්' (Ahasa One) යන නාමයෙන් හඳුන්වා දී ඇත. මෙම සුවිශාල නවීන ගොඩනැගිල්ල පිහිටා තිබෙන්නේ කොළඹ කොටුව ප්‍රදේශයේ ගාලු මුවදොර පිටියට මුහුණපාමිනි. එනම් ගාලුමුවදොර මහා සාගරය ඉදිරිපස ඇති බිම්කඩකය. මෙහි එක් කුලුනක ඇති හෝටල් සංකීර්ණය තුළ කාමර 352ක් ඇති අතර, නවීන ආපනශාලා 12කින්ද සමන්විත වෙයි. දැන් එසේ නම් මෙම හෝටල් සංකීර්ණයේ අයිතිකරුවා කවරෙක්ද?

ඇමෙරිකානු ඩොලර් මිලියන 400ක වියදමින් ඉදිකළ අයි.ටී.සී. රත්නදීප (ITC Ratnadipa) හෝටල් සහ නිවාස සංකීර්ණයේ අයිතිකරුවා වන්නේ ඉන්දියානු සමාගමකි. එනම් එය අයි.ටී.සී. හොටෙල්ස් (ITC Hotels) නමින් සඳහන් වන සමාගමකි. මෙහි අයි.ටී.සී. යනුවෙන් අර්ථවත් වන්නේ ඉන්දියා ටුබැකෝ කම්පනි (ඉන්දියානු දුම්කොළ සමාගම - Indian Tobacco Company) යන අර්ථයයි. ඉන්දියාවේ දුම්කොළ කර්මාන්තයට අනුබද්ධිතව කටයුතු කළ එම සමාගම එරට වසර 113ක් පැරණි සමාගමකි. එනම් එය ආරම්භ කර ඇත්තේ 1910 අගෝස්තු 24 දාය. එකල මෙම සමාගම ඉන්දියාව තුළ ආරම්භ කර ඇත්තේ මෙතෙක් ලොව ඇති පැරණිතම දුම්කොළ නිෂ්පාදන සමාගම ලෙස සැලකෙන එංගලන්තයේ පිහිටි W.D. & H.O. Wills නමැති දැවැන්ත සමාගම විසිනි. මෙම බ්‍රිතාන්‍ය සමාගම දැනට වසර 238ක් පැරණි අතර, එය ආරම්භ කර ඇත්තේ 1786 වසරේදීය. ඉන්දියාව යනු දශක ගණනාවක් පුරා බ්‍රිතාන්‍ය යටත්විජිත පාලනය යටතේ පැවැති රටකි. එහෙයින් එකල යටත්විජිත සමයේදී බ්‍රිතාන්‍ය ජාතිකයන් විසින් ඉන්දියාව තුළ ඉන්දීය දුම්කොළ සමාගම ආරම්භ කර ඇත. ඒ ආකාරයට ඉන්දියාව තුළ ව්‍යාප්තවූ මෙම සමාගම පසුව දුම්කොළ ව්‍යාපාරය පමණක් නොව තවත් විවිධ වෙළෙඳ ක්ෂේත්‍ර වෙත තම ව්‍යාපාරය පුළුල් කරනු ලැබුවේය. ITC Hotels නමැති සමාගම බිහිවන්නේද ඒ අනුවය. කෙසේ හෝ මෙලෙස මෙම සමාගම ඉන්දියාව තුළ ආරම්භ වන්නේ 1975 වසරේදී වන අතර, එනම් දැනට එම සමාගම වසර 49ක් පැරණිය. මෙම සමාගම මේ වනවිට ලෝකයේ රටවල් 70ක හෝටල් 100කට අධික ප්‍රමාණයක් ගොඩනගා පවත්වාගෙන යයි. අපගේ ශ්‍රී ලංකාවද ඉන් එක් රටක් වන අතර, රත්නදීප හෝටලය ඒ අනුව පසුගියදා විවෘත කෙරිණි. මෙම ඉන්දීය හෝටල් සමාගමෙහි 2023 දී පූර්ණ වත්කම් ඉන්දීය රුපියල් කෝටි 7,896ක් යැයි ප්‍රකාශ වෙයි.

ITC හෝටල් සංකීර්ණවල ඇති සුඛෝපභෝගී තත්ත්වය නිසා ලොව සිටින ඉහළම රාජ්‍ය නායකයන් සහ ධනකුවේරයන්ද මෙම හෝටල්වල ලැගුම් ගනිති. ඉන්දියාවේ කල්කටාහි තිබෙන ITC Royal හෝටලයෙහි එකල ඉන්දියාවට පැමිණි ඇමෙරිකානු ජනාධිපතිවරුන් වන ජෝර්ජ් බුෂ්, බැරැක් ඔබාමා, ඩොනල්ඩ් ට්‍රම්ප් යන අය මෙන්ම රුසියානු වත්මන් ජනාධිපති ව්ලැදිමීර් පුටින් පවා නවාතැන් ගෙන ඇත. මේ තත්ත්වය එම හෝටල් සඳහා ලැබෙන සුවිශේෂ වරප්‍රසාදයකි. මෙම අති සුපිරි ITC Hotels සමාගමේ සභාපතිවරයා සහ ප්‍රධාන විධායක නිලධාරියා ලෙස කටයුතු කරන්නේ ඉන්දියානු ජාතික සන්ජීව් පුරි (Sanjiv Puri, Chairman and CEO of ITC Hotels) වන අතර, ඔහු අතිදක්ෂ හෝටල් පරිපාලකයකු ලෙස ප්‍රකටය.

පසුගියදා මෙසේ විවෘත කෙරුණු සුපිරි ගොඩනැගිලි සංකීර්ණය මෙරට තිබෙන විශාලතම ගොඩනැගීම නොවේ. එනම් දැනට වාර්තා වන ලෙස මෙරට තිබෙන උසම ගොඩනැගිල්ල ලෙස සැලකෙන්නේ 'ලෝටස් ටවර්' නොහොත් 'නෙලුම් කුලුන' වෙයි. එය මීටර් 350ක උසකින් යුක්තය. එහෙත් එය හෝටල් සංකීර්ණයක් ලෙස සැලකෙන්නේ නැත. මෙරට තිබෙන විශාලතම හෝටල් සහ නිවාස සංකීර්ණය ලෙස සැලකෙන්නේ මීටර් 240ක උසින් සහ තට්ටු 68ක ප්‍රමාණයකින් යුත් 'අල්ටයර්' සුපිරි සංකීර්ණයයි. 'අල්ටයර්' (Altair) සංකීර්ණය තට්ටු 68 සහ තට්ටු 64 කුලුනු දෙකකින් සමන්විත වෙයි. පසුගියදා විවෘත කෙරුණු නවතම සුපිරි 'රත්නදීප' හෝටලයට යාබදව ඇත්තේ 'ෂැංග්‍රිලා' හෝටල් සංකීර්ණයයි. එය චීන ජාතික ව්‍යාපෘතියක් වන අතර, 'රත්නදීප' ඉන්දීය ව්‍යාපෘතියකි. කෙසේ හෝ චීනයත්, ඉන්දියාවත් එකිනෙකට එරෙහි මතවාද ඇති විරුද්ධවාදී රටවල් දෙකකි. එහෙත් අද යාබද වතු දෙකක හෝටල් සාදාගෙන ඇත.

ITC HOTEL
RESPONSIBLE LUXURY
ITC RATNADIPA
COLOMBO





# තෝදෙය්‍යනං බ්‍රාහ්මණය හිටු කුක්කා හිටු





චන්ද්‍රසේන මාරසිංහ

**මා නමසිය හැත්තෑවේදී විගණකාධිපති දෙපාර්තමේන්තුවේ රාජකාරියට ආවේ ඉංගිරිසි ගුරුවරයකු වශයෙන් වසරකට ආසන්න කාලයක් සේවය කිරීමෙනි. ප්‍රධාන කාර්යාලයේම රාජකාරී පැවරුණු බැවින් මගේ තාවකාලික නවාතැන වූයේ පාසලේ එකම පංතියේ සිටම මගේ යහළුවා වූ ගුණසේනගේ නිවසේය. ඔහු විවාහ වී සිටියේද එකටම ඉගෙනගත් සිසුවියක (සීතා) හා බැවින් ඇයද මගේ යෙහෙළියක් වූවාය.**

"මාරෙ අයියෙ ඔයා කොහේවත් නවතින්ඩ බෑ. අපි දෙන්නත් එක්ක එකට නවතින්න ඕනෑ. අපට තනිවටත් එක්ක. අපේ තාත්ත කීවෙ ඔයා කියන කතා අහඅහ අපට හිනාවෙවී මැරෙන්ඩ පුළුවං කියල"

"ඒ වුණාට අම්ම කීවෙ දහ රුපියලට වියදං කරන බෑනණ්ඩියත් එක්ක එකතු වුණාම කොහෙං නතර වෙයිද දන්නෙ නෑ කියල"

"නෑ නෑ රිමෝට් එක තියෙන්නෙ මං ළඟ"

"ආන්න ඒ බයට තමයි කොච්චර නාහෙං ඇඬුවත් ඔයාගෙ යාළුව තවම එක්ක ආවෙ නැත්තෙ"

"ඉන්ඩ, ඉන්ඩ, මම ස්වර්ණට කියල යවන්නං"

(ඒ කාලයේ ජංගම දුරකතන තබා ස්ථාවර දුරකතන (Land Phone) හෝ තිබුණේ ද කලාතුරකිනි) සීතා ජාඇළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේය. ඇයගේ පියා (හලාවත) කෝටිපති මත්ස්‍ය ව්‍යාපාරිකයකුය. ඔහුට දරුවන්ට හිටියේත් එකම එක ඒ දුව පමණක් බැවින් බඳින්න ඔන්න මෙන්න කියා සිටිද්දී බෑනටයි දුවටයි දෙදෙනාට ජාඇළ පැත්තෙන් මහ "හෙම්බඩං" (විශාල) ගෙයක් ඇත්න (අරං) දී තිබුණේය. ඔවුන් දෙදෙනාට උයන්න පිහන්න සහ ගේදොර බලාගැනීමට මධ්‍යම වයස ඉක්මවූ අවිවාහක නැන්දණියක්ද (සීතාගේ පියාගේ ඥතිවරියක්) පවුලේ බූදලයක් වශයෙන් (පෙර පිනට) ලැබී සිටියාය.

"ගෙදර එළවළු ඉවරයි කියල නැන්ද කීවා. ඔය දෙන්න එනකොට ජාඇළින් ටිකක් ගේනවද? අද හැන්දෑවෙ අම්මයි තාත්තයිත් එනව කීව. මම බයිට් එක හදල තියන්නං." ඇතැම් දිනෙක ඕ කීවාය.

ඒ අපේ සාමාන්‍ය ජීවිතය වූයේය. ඔය අතරේදී දකුණු පළාතේ තරුණ මහත්තයෙක්ද විභාගය සමත්වී දෙපාර්තමේන්තුවට ආවේය. ඔහු වැටුණේද අපේ ශාඛාවටමය. යහළුවකුගේ කාමරයක වදෙන් පොරෙන් (බිම නිදගනිමින්) දින දෙකක් තුනක් නවාතැන් ගෙන සිටි බව කන්තෝරුවට පයගැහූ දිනයේ පටන්ම නාහෙන් අඬමින් කී හෙතෙම කොහේ හෝ නවතින්න තැනක් හොයන බව ඒ කතාවෙන් බහෙන් කීවේය.

මාත් ගුණේත් කොතැනත් "නැව ගිලුණත් බෑංචුං එකේ ඉන්න ජාතියේ බඩු වශයෙන් හැසිරුණු නිසා එවැනි ප්‍රශ්න අපට ඉදිරිපත් කරන්න කිසිවෙක් නො ආවේය.

බෝඩිං සොයා දෙන්නත් දෙතුන් දෙනකුම උදව්වට ඉදිරිපත් වූවත් ඒවාට මිනිහගේ කැමැත්තක් තිබුණු පාටක් පේන්න තිබුණේද නැත.

"ඒයි ගුණේ කිරිපණු ගායට අහවල් දිහැ දුංකොළ නැට්ටක් ගහ ගත්තු එකා වාගෙ අරූගෙ මූණත් තහඩුව හදන (හදගෙන) මනෝ ගහල ඉන්නව. කොළඹට අලුතෙන් ආපු එකෙක් නිසා. මොකක් හරි ප්‍රශ්නයක් නං පොඩි සපෝට් එකක් දෙමුද?

"පූස්පාට් එකෙන් හිටියට කට්ටයෙක් වාගේ. කැන්ටිමට යනකොට එක්ක යමු. උඹ word එක දපං, මම අහං ඉන්නං" ගුණේගෙ චරියාව එහෙමය. පැනලා දෙන්නෙක් නොව රහසේ උදව් කරන්නෙකි. හේතුව පවුලේ සල්ලි බාගෙ තියෙන නිසා වැඩිදෙනා එන්නේ ගරානාවටය.

මෑන් මාතර පැත්තේය. උගන්නමින් සිටි උසස් පාසලක උසස්පෙළ පංතියේ කෙල්ලක් මාට්ටු කරගෙන තිබේ. දෙපැත්තෙන්ම මාර "ගුස්පිය" නිසා හොරෙන්ම විවාහයද ලියාපදිංචි කරගෙනය. මිනිහට කෙල්ල උස්සන්ඩ ඕනෑය. දූන් කල් අරින්ඩත් බැරිය. ඒ පළාතට යන්ඩත් බැරිය. හොයන්නේ අප්‍රසිද්ධ තැනක අඩු කුලියකට ගෙයක්ය. මෑන් මා සමග ඒ කතා වත්ථුව විදරණය කරද්දී "ගුණේ"ගොනා සහ තණකොළ සේ කිසිවක් නොකියා සිකරට් එකක් ඇද්දේය. මට කිසිවක් කළ නොහැකිය. ගුණේ මා දිහා බැලුවේය. නැගිට්ටේය.

"සීතා, ඔයාලගෙ ඩොටී ඇන්ටිගෙ ගෙදර ඇනෙක්ස් එක හිස් නේද?" වයසක ඩොටී ඇන්ටිත් අංකලුත් තනිපංගලමේ හිටියේ අල්ලපු වත්තේය. (ඔවුන් සීතාගේ බොක්කය). ඇනෙක්ස් එක කුලියට දීම ඔවුන්ගේ ආර්ථිකයට විශාල රුකුලකි. (ආධාරකයකි). එදින රාත්‍රී කෑම මේසයේදී ගුණේ සීතාගෙන් එසේ ඇසුවේය.

"ඔව් අනේ, මට කීප සැරයක්ම කීව කවුරු හරි විශ්වාසවන්ත කෙනෙකු ඉන්නවානං කියන්න කියල. ආර්ථිකෙත් හොඳටම බැහැලලු"

ඉස්කෝලෙ මහත්තයා අපත් සමග ඩොටී ඇන්ටි හමුවූ දෙදිනකට පසුව නිවාඩු ගියේය. පසුවද ඒ නිවෙසේ පදංචි වූවේය. ඒ මියෙම්වා, රැකෙම්වා යන අධිෂ්ඨානයෙන් ප්ලෑන් එකක් ගසා "අරක" පන්නා ගෙන ඒමත් සමගය. එද රාත්‍රී මංගල භෝජන මේසය සීතාගෙනි. ඊට ගෙනා විස්කි බෝතලය ගුණේගෙනි. මම එය මනාලයාට දිගු කෙළෙමි.

"මම බොන්නෙ නෑ"

"අද පොඩ්ඩක් ගත්තට කමක් නෑ" ඒ සීතාය.

මනාලයා මනාලිය දෙස බැලුවේය. ඒ හික්මී බැල්මෙනි. "ඕව පුරුදු කරන්න හොඳ නෑ"

දවල්ට කෑම එක ඔතාන එන කිසිම දවසක කැන්ටිමෙන් ප්ලේන්ටියක් හෝ නොගසන මෙතුමා සාක්කුවෙන් ඇද බස්ගාස්තු සත පහ (ඒ කාලයේ හැතැප්මකට බස් ගාස්තුව සත පහකි) දෙන්නේ ද කාසියේ හය පැත්තම තුන්වරක් හොඳට පරීක්ෂා කර බැලීමෙන් බව ශාඛාවේ "එක්ස්පයරි ඩේට්" (කල් ඉකුත් වීමේ කාලය) පනින්න ඕංමේ ගානේ සිටි මෙනෙවියක් කීවාය.

(ඒ අපේ එකෙකු ඇයට ඔහු හා ඉක්මන් කර යාළුවෙන්නට කී විටදීය)

නිවෙසට අවශ්‍ය බඩු එළවළු ආදිය ගන්නට අප ඔහු කැටුව ජාඇළ නගරයේ අස්සක් මුල්ලක් නෑර ගොස් කඩවල් පෙන්නා දුනිමු. එළවුළු මස්මාංශ ආදිය පහසු මිලට සැපයෙන පේමන්ට් බ්‍රදර්ස්ලා සහ සිස්ටර්ලා සිටින තැන්ද පෙන්වා දුනිමු.

මනුස්සයා තමාට අවශ්‍ය පලාමිටියක් වුවත් ගන්නේ සෑමතැනම රවුම් දෙක තුනක් ගොස් දහදෙළොස් පොළකින් විමසා බැලීමෙන් බව අපි ටික දිනකින්ම පසක් කර ගතිමු. ඒ නිසා නෝණ්ඩි වෙන්නට බැරි හෙයින් අප දෙදෙනා මෑන් බඩු ඇරගෙන එනතුරු එක තැනකට වී බලා සිටියෙමු.

විශේෂයෙන් කියන්න ඇති දේ මනුස්සයා සූකරමද්දව (Pork)වලට ඉතා ගිජුය. ඒ බව ඒවා අලෙවි කළ වෙළෙන්දියෝ පවා දවස් දෙක තුන යනවිට හොඳින් දැන සිටියෝය. පළමුවෙන් ඔහු රවුම් දෙක තුනක් ගොස් හොඳ බඩු ඇත්තේ කොතැන දැයි තෝරා බලයි. දෙවනුව මිල ගණන් විමසමින් යයි. තුන් වැනුව තෝරාගත් තැනින් රාත්තල් භාගයක් (ඒකාලයේ තිබුණේ කාල් භාග රාත්තල්ය) ඉල්ලයි. ඊළඟට සූකරමද්දව ගන්න ගොස් පේමන්ට් සිස්ටර්ලා සමග සණ්ඩුව පටන් ගනියි. ඒ කටු කෑලි තෙල් කෑලි දමන බව කියමිනි.

උදේ සිට විට හපේ ගසන බැවින් හැන්දෑවේ ඔය වෙලාව වෙනවිට කට කුණු ලේ පැහැය කරගනිමින් සහ දහඩිය දෙකාංශයෙන් පෙරමින්, හිස මුදුනට වෙන්නට හිරකර බැඳගත් කොණ්ඩයද අවුල්වැ, කර පළල් හැට්ටයක් ඇඳීමෙන් " මිච්ලින්" ටයරයකට නොදෙවැනි අන්දමට දැල (ඉළ) සහ උදරයෙන් පිටතට පනින ආකාරයට නෙරූ මාංශ චක්‍රයක් (රවුමක) ප්‍රදර්ශනය කරමින් සහ අතේ ඇති තියුණු පිහිය ද දෑතේ මැණික්කටු ආසන්නයේ සිටම ලේ තවරාගෙන කෙළොම්බු කොටයක් වැනි ලීකොට කැල්ලක් උඩ ඉඳගත් සාමාන්‍ය තක්සේරුවට අනුව බර හොණ්ඩර දෙකකට ආසන්න ඇති නැති තරමේ සයිස් එකේ පෙනුමැති බජාර් එක රන් කරන වෙළෙඳ සහෝදරියන්ට මේ මහත්තයා හොඳටම නෝට්ය.

දවසක්ද අප දෙදෙනා බලා සිටියදී ඒ අන්දමට තෝරාගත් මස් කැල්ලක් නිර්දේශ කළ බජට්කාරයා එය කපනතුරු දෑස් දල්වා බලා සිටියේය. ඇය කීවාක්ම කරන්නට වූවාය.

"ලොකු කට්ටක් නේද?" මහත්තයා ඇස් ලොකු කරගෙන ඇසුවේය. ඇය මුනිවත රැකගෙන කට්ට කැපීම සඳහා තදින් පහරක් ගැසීමට උරහිස් මට්ටමෙනුත් ටිකක් ඉහළට වෙන්නට පිහිය එසෙව්වාය. (මට පසුව කල්පනා වූ ආකාරයට ඇය එසේ කළේ හිතාමතාමය) ඒ හාම කර පළල් හැට්ටෙන් "දබස්" ගා ඒ පැත්තේ අහවල් එක එළියට පැන්නේය. මහත්තයා හිටගෙනය. ඇය ඉඳගෙනය. ඒ කාරණාව එසේ එළියේ තියෙද්දී ඇය ඉස්සූ අත පහත් කර දෑත දෙස බැලුවාය. පිහියේත් ලේය. එය තිබුණු දකුණු අතේත් ලේය. ඕ වමත දෙස බැලුවාය. ඒ අතේත් ලේය. අහල පහළ වූවෝ මේ පුදුමය දිහා තුෂ්ණිම්භූතව බලාගෙනය.

කිච්චට වස් නැත. (එළියට පැන්න ඒක රයිට් සහෝදරයන් පළමු ගුවන් යානය නිර්මාණය කිරීමට පෙර අත්හද බැලීමේදී ගුවන්ගත කළ බැලූමට ටිකක් කුඩා තරමේය). අනතුරුව ඇය ඔහු දිහා බැලුවාය.

ඔහුගේ දතකට පූට්ටුව තිබුණේය. නාඩි වැටෙන ශබ්දය අපටත් ඇහුණේය.

"මහත්තය දනවකො ඕයි ඕං ඔක ඇතුළට" ඇය ඔහු දෙස බලා කාරුණිකව ඉල්ලා සිටියාය.

එවේලේ අපට ඇතිවූ හිනාවට අපේ ඉළ ඇට නොකැඩුණේ පූරුවේ පිනකට නිසා විය යුතුය.

"දුව කීව ඔය දෙන්නා යාළුවෙකුට මඟුලක් කරල දුන්න කියල. මනාල මහත්තයටත් පොඩ්ඩක් එන්ඩ කියමුකො" එද හැන්දෑවේ පැමිණ සිටි සීතාගේ තාත්තා (ඔහුගේ නම ජුවන්ය. එහෙත් භාවිතය ජෝන් ලෙසිනි) කෑමට පෙර මේසයේදී අප දෙස බලා කීවේය.

"වැඩක් නෑ තාත්තෙ එයා නොබොන කෙනෙක්. නෝනා කැමැතිත් නෑ" සීතා උත්තර බැන්දය.

අප දෙදෙනාගේ අලුත් වූ හිනාව විනාඩි කීපයක්ම පැවැත්තේය.

"මේ දෙන්න හිනාවෙන්නෙ මොකද?" ජෝන් අංකල් ඇසුවේය.

"අද පොළේදි (ජාඇළ) බඩු හෙට්ටු කරන ලෝබයකුට වෙච්චි ඇබැද්දියක් මතක් වෙච්චි නිසා" අපි බොරුවක් කීවෙමු.

"එහෙම කුණු ලෝබ ගෑනුත් මිනිස්සුත් දෙගොල්ලොම ඉන්නව තුට්ටු දෙකට බඩු ගන්ඩ හදන. මටත් පේන්න බෑ. මම කවදත් කීවෙ කන්නෙ බොන්නෙ නැති මිනිහෙකුට දරුවෙක් දෙන්ඩ එපා කියල. ඒ වාගෙ කුණෙකුට දුන්නොත් දරුවො දුක් විඳිනව. ඇයි මසුරුකං කරන උන් හරියට කනවයැ" ඔහු සිනාවෙමින් කීවේය.

"සමහරු නොකා නොබී ලෝබකමට තණ්හාවෙන් සල්ලි පොදි ගහනව යනකොට ගෙනියන්නද?කොහෙද?"ඒ සීතාගේ මවය.

"සමහරු මැරෙන්ඩ ඉස්සර මැරිමැරී ඉන්නව. අපි මැරෙනව අපි මැරෙනව කිය කියා. මරණානුස්සති භාවනාව කරකර ඊළඟ ආත්මෙ දිව්‍යලෝකෙ ඉපදෙන්න.

ඒ වුණාට කාටවත් සත පහක් දෙන්නෑ පට්ට කුණෝ "

"අම්මේ ඔව්,ඒ වාගෙ අය අපේ කංතෝරුවෙත් ඉන්නව අනුන්ට බණ කිය කියා" සීතා කීවාය.

"දූන්ම තියා, තව්තිසාවෙ, නඳුන්වනේ ළඟ පර්චස් දහය පහළොව වෙන්කර ගන්න කල්පනාව" ඒ සීතාගේ තාත්තාය.

ඔහු උපතින් ක්‍රිස්තු භක්තිකයකු වුවත් බෞද්ධයකුටත් වඩා බුද්ධාගම දන්නේය. ඒ නිසා ඔහුට කොයි ආගමත් එකය. ගමේ දුප්පත් කෙනකු මියගිය විට මළගමේ සම්පූර්ණ කටයුතු ඔහුගෙනි. කියන්න වුවමනාවක් නැත. ගෙදරට ආ කෙනකු හිස් අතින් ඇරියේද නැත.

සීතාගේ මව උපතින් බුද්ධාගමේය. ඇය පන්සල් යන්නීය. ඈ සමග ඇගේ සැමියාත් පන්සල් යයි. සීතාගේ මවත් ඔහු හා නොවැරදීම පල්ලියට යයි. (ඇය ගුරුවරියකි. බැන්දට පසු ගෙදර නැවතුණාය.

"ආගම දහම කරේ තියාගෙන ඉන්න අයගෙ තමයි තණ්නාසෙ වැඩි. මැරුණහම ඉපදෙන්නෙ දේපොළවලටම ආශාවෙ පෙරේතයො බල්ලො බළල්ලු වෙලා" සීතාගේ තාත්තා අප දෙස බලාගෙන කීවේය.

"පරම්පරාවෙන් අසූ කෙළක් (කෝටියක්) ධනය තිබුණු තෝදෙයිය කියල (නමින්) සිටුවරයෙක් බුදුන් වහන්සේ ජීවමානව වැඩසිටි කාලෙ හිටිය." අපි සියල්ලෝම සීතාගේ මව දිහා බැලුවෙමු. ඇය කතාවක් කියන්න ගත්තාය.

"කාලෙකින් දරුවන්ගෙ ගෙදරට මව්පියො ගියොත් හරි, මහ ගෙදරට (මාපියන්ගෙ ගෙදරට) දරුවන් ආවොත් හරි ඒ ගෙදර එදට අහල පහළ අයටත් එක්ක මඟුල් ගෙයක් වෙන්න ඕනෑ. ඒකටයි, හම්බ කරන්නෙ. ඒක තමයි සංතෝසෙ කියන්නෙ. ජීවත් වෙනව කියන්නෙ. පෙරේතකමිං පොදිගහන එක නෙමෙයි. බුදුහාමුදුරුවො නොකා නොබී මරණය ගැන හිත හිතා ඉන්න කීවෙ නෑ" ඔය සීතාගේ තාත්තගේ "ජීවන" දර්ශනය වෛරසයක් වූයේය. එය පවුලේ කාටත් උග්‍ර අන්දමට බෝවී තිබුණේය.

"ඉතින්, ඔය සිටුවරයගෙ ගෙදර හිටිය සද්දන්ත බල්ලෙක්. ඌ ගෙදරට කාටවත් එන්න දුන්නෙත් නෑ. ආපු කෙනෙකුට බඩුවක් අල්ලන්න තියා ඉඳගන්නවත් දෙන්නෑ. බුරාන හපාකන්ඩම පනිනවා. මේක ගෙදර අයට මහ හිරිහැරයක්. ඒත් කරන්ඩ දෙයක් නෑ ඉවසාගෙන හිටියා. දවසක් බුදුන් වහන්සෙ ඒ ගෙදරට වැඩියට පස්සෙත් මේ බල්ලගෙ කරදරේ ඇති වුණා. ඊට පස්සෙ ගෙදර අයිති තෝදෙයිය සිටුවරයා මේ සතාගෙන් සිද්ධවෙන හිරිහැරය ගැන බුදුන් වහන්සේට කීවා. උන්වහන්සේ ඒ සතා දමනය කරන මංතරයක් කියල දුන්නා. මොකක්ද දන්නවද මංතරේ?".

"නෑ" ගෙදර ඉහුම් පිහුම්කරන නැන්දණිය කීවාය. ඒ බව අනුමත කරමින් සීතාගේ මවට අනුබලදෙන නියායෙන් අපි හිස් වැනුවෙමු.

"තෝදෙයිය නම් බ්‍රාහ්මණය හිටු කුක්ක හිටු කියන එක තමයි ඒ මන්තරේ"

"ඒක අහපු ගමන්ම අර සුනකයා මුල්ලකට වෙලා කවදවත් නැතිවිදිහට කකුල් හතර අකුළාගෙන වකුටුවෙලා දුකෙන් වාගෙ හිටියා. තමන්ගෙම නම කියාපු එක ගැන මවිත වුණු තෝදෙයිය සිටුවරයා ඒ ගැන විමසූ විට බුදුහාමුදුරුවො මෙහෙම කීවා."

"මේ සතා වෙලා ඉපදිලා ඉන්නෙ මීට ටික කලකට පෙර මියගිය ඔබේ පියතුමා වූ තෝදෙයිය නම් මහ සිටුවරයා. මේ ධනස්කන්දෙට තිබුණු ආශාව උපාදනය (වස්තු තණ්හාව) කරගෙන තමයි එයා මියගියේ. ඒ මැරෙන මොහොතේ හිතේ ඇතිවුණ හිතිවිල්ලට (අවසාන චුති චිත්තය) අනුව වස්තුව රකින සුනඛයා වෙලා ඉපදිලා ඉන්නෙ කියල තේරුම් කළා" කී ඇය ඒක තමයි අද හුඟාක් දෙනකුට වෙලා තියෙන්නෙ. කිසි දෙයක් හිතෙන් අත් ඇරලද ගන්න බෑ. අතහරින්නත් බෑ තණ්හාවෙන් බරිතවෙලා " සබ්බං පහාය ගමනීයං" (සියල් හැරදමා යා යුතුයි) ඒත් ඒක කරන්නෙ නෑ. කරන්නත් බෑ" ඉස්කෝල හාමිනේ සුසුමක් හෙළා දරුවන් සියල්ලන් දෙස බලා කීවාය.

"අපට නං ඒක ඒ තරං අමාරු නෑ. දූන් බලමු අපේ දේශපාලකයො කියලා වැඩක් නෑ, මළ පෙරේතයෝ වාගෙ. පොදි ගහනව හත්මුතු පරම්පරාවට නෙමෙයි ලෝක විනාශය දක්වාම ඇතිවෙන්න හම්බ කරගෙන ඉන්නැද්දිත්. පැන්සොං ගියත් ආයෙ ඇවිත් එල්ලිලා ඉන්නව. නැගිටින්නවත් බෑ. දහදෙළොස් දෙනෙක් දෙපැත්තෙන් වත්තං කරන්න ඕනෑ නැගිටින්න. සෑහෙන මීහරකෙක් විතර ඇතිනෙ සයිස් එකත්. දරුවො ඉස්සරහ කියන්ඩ හොඳ වචනයක් නෙමෙයි. ඒත් කියන්ඩ තියෙන්නෙ "නොදකිං" කියල තමයි" සීතාගෙ තාත්තා කියාගෙන ගියේය.

හැළියෙ තියෙන දේ තමයි හැන්දට එන්නෙ (හැළියකට හැන්ද දමාගත් කල හැන්දට එන්නේ හැලියේ ඇති දේ) කියන ගැමි උපහැරණයක් තිබේ. එහි අදහස හිතේ ඇතිදේ වචනයෙන් පිටතට පැමිණේ යන්නය. සීතාගේ පියා ද ඒ ජාතියේ කෙනෙකි.

මූඩිය පෑගුණු විට (පොඩි අඩියක් ගැසූවිට) හෙතෙම කියන්නේ ඔය වගේ දේවල්ය. පදම වැඩිවූ විට කාලකණ්ණින් රට කන බව කියයි. රටේ මිනිස්සුන්ඩ, දරුවන්ඩ කන්ඩ නැති එක ගැන බැණවදියි. පරම්පරාව රකින්න කරන නොපනත්කම් ගැන අහස් යාත්‍රාවලින් පිට රටට සල්ලි ඇද්ද හැටි ගැන කෝපයෙන් කතාකරයි.

මේවා නවත්වන්නෙ නැතිව සජිත්ලා, අනුරලා බයිලා ගහන බව කියයි. තමා මාළු ව්‍යාපාරය කරන්නේ පූරුවේ අකුසලයක් නිසා බව කියමින් ඊළඟට අඬන්න පටන්ග නියි.

එසේ අඬා හෙම්බත් වූවිට පුටුවේම ඉඳගෙන ඉකිගැසීමට පටන්ගනියි. එසේ ඉකිබිඳින්නත් නොහැකි වූ තැන හෙතෙම හූල්ලන්නට (සුසුම් හෙළන්නට) පටන් ගනියි. ඒ ඔහු ඇඳට ගෙන යායුතු මොහොත බව සීතාත් ඉස්කෝලෙ හාමිනේත් අත්දැකීමෙන් අවබෝධ කරගෙන ඇත්තාහ.

ඊට පෙර ඔහු වැළැක්වීමට කිසිම රුසියෙකුට (ඍෂිවරයකු) බැරිය. එසේ කිරීමට ගියහොත් තුන් වැනි ලෝක යුද්ධය එතැනය. හූල්ලන්නට පටන්ගත් විට "යමු අනේ දූන් ඇති අපටත් මහන්සියි" යන ලෙස ඉස්කෝලෙ හාමිනේගේ හෝ "තාත්තෙ දූන් නිදගන්ඩ යමු නේද? අපටත් නිදිමතයි" යන සීතාගේ වාක්‍ය හෝ ඇසුණු කල හෙතෙම කුඩා දරුවකු සේ කීකරු වෙයි. එහෙත් ඒ කිසිවක් ඔහුට පසුද උදේට මතක නැත. අද ඔහු බෝතලයේ මූඩිය ඇරියා (ගැලෙව්වා) පමණි.

"මංත්‍රීවරු ගැන එපා. අපේ ජනාධිපතිවරු කියල අට දෙනෙක් හිටියා" කී හෙතෙම ජේ.ආර්. ලොක්කා, ප්‍රේමදාස මහත්තයා, ඊට පස්සෙ ඩී.බී. විජේතුංග සුදුසීයා, චන්ද්‍රිකා, මහින්ද ලොක්කා, මෛත්‍රී ග්‍රාමසේවක උන්නැහේ, (දිමි) ගෝඨා, දූන් අපේ රනිල්තුමා. වමතේ ඇඟිලි දිග හැර දකුණතේ දබරැඟිල්ලෙන් ඇන ඇන ගැන්නේය.

ජේ.ආර්. තමන්නෙ ආණ්ඩුව කාලෙ බලු වැඩ කෙරුව තමයි. බාල වයස්කාර දරුවකුට කරදර කෙරුව කියල අවුරුදු දෙළහකටද දසයකටද හිරේට ගිය ගෝනවල සුනිල්ට සමාව දීලා එළියට අරගෙන මහාචාර්ය එදිරිසිංහ මැතිතුමා වාගෙ අයට ගස්සෝල පාරදිගේ ඇදගෙන ගියා. කළු ලකීල සමරකෝන් වාගෙ නඩුකාරතුමන්ලගෙ ගෙවල් ඉස්සරහ හූ කියෙව්ව. ගැටඹෙ පන්සල වටේට කටු කම්බි වැටවල් ගහල මාදුළුවාවෙ හාමුදුරුවන්ඩ හිරිහැර කළා තමයි, ඒව කැත වැඩ. ඒත් මිනිහ පැන්සොං ගියාට පස්සෙ ආයෙ බලේට එන්න කුමංත්‍රණ කෙරුවෙ නෑ. මට රකින්න කුමාරයොත් පරපුරකුත් නෑ කීව. තමන්නෙ පාඩුවෙ ඉඳල මැරුණ.



## රඹුක්කන ප්‍රා.ලේ. කාර්යාලයේ බක්මහ උළෙල



චන්ද්‍රසේන මාරසිංහ

රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයීය නිලධාරීන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ බක්මහ උළෙල රඹුක්කන අශෝකා මහා විද්‍යාලයීය ක්‍රීඩාංගණයේදී පසුගියද පැවැත්විණි.

කෑගල්ල දිස්ත්‍රික් අතිරේක ලේකම් කේ.ජී.එස්. නිශාන්ත මහතා ප්‍රධාන අමුත්තා වශයෙන් සහභාගි වූ උත්සවය ලේකම් කාර්යාලයීය සංස්කෘතික සහ සුබසාධන අංශය විසින් සංවිධාන කරනු ලැබිණි.

රඹුක්කන සහකාර ප්‍රාදේශීය ලේකම් හසාරා සේනානායක මහත්මිය පොල්අතු විවීමේ තරග ඉසව්ව නිරීක්ෂණය කරන අන්දම ඡායරූපයේ දක්වේ.

## රාමසාන් විශේෂ ඓතිහාසික උත්සවය රඹුක්කන හුරීමළුවේදී 30ද

චන්ද්‍රසේන මාරසිංහ

රඹුක්කන මුස්ලිම් ආගමික වියත් සභාව සහ රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයීය සංස්කෘතික බලමණ්ඩලය ඒකාබද්ධව සංවිධාන කළ වාර්ෂික රාමසාන් උත්සවය පිළිබඳ විශේෂ වැඩසටහන කුජද (30) පෙරවරු 9.00 සිට මධ්‍යාහ්න 12.00 දක්වා රඹුක්කන හුරීමළුව (සූරියමළුව) "මස්ජිදුල් දිලාල්" මුස්ලිම් ආගමික සිද්ධස්ථානයේදී පැවැත්වේ.

රඹුක්කන ආගමික සිද්ධස්ථානවල එතෙක් මෙතෙක් පැවැති උත්සව අතුරින් මේ උත්සවය ඓතිහාසික වශයෙන් වැදගත් වන්නේ සංහිඳියාවේ නව මං විවර කරමින් සැලකිය යුතු අන්දමින් ප්‍රථම වතාවට සිංහල ස්ත්‍රී පුරුෂ යන දෙපාර්ශ්වයේම විශාල සිංහල සංඛ්‍යාවකගේ සහභාගිත්වයෙන් උත්සවය මුස්ලිම් සිද්ධස්ථානයේ පැවැත්වීමය.

# මහජන බැංකුව අවුරුදු සමයේදී බිලියන 568කට අධික වටිනාකමකින් යුත් මිලියන 17කට අධික ගනුදෙනු ප්‍රමාණයක් වාර්තා කරයි



ශ්‍රී ලංකාවේ විශාලතම ගනුදෙනුකරුවන් සංඛ්‍යාවක් හිමි ඩිජිටල් බැංකුකරණයේ ප්‍රමුඛයා වන මහජන බැංකුව, අප්‍රේල් මස 01 වැනිදා සිට 15 වැනිදා දක්වා වූ අලුත් අවුරුදු කාලසීමාව තුළ රුපියල් බිලියන 568කට අධික වටිනාකමකින් යුත් මිලියන 17කට අධික ගනුදෙනු ප්‍රමාණයක් වාර්තා කරමින් යළිත් වරක් සිය ඩිජිටල් බැංකුකරණයේ ශක්තිය පෙන්නුම් කර තිබේ.

මහජන බැංකුව, ශාඛා හා සේවා මධ්‍යස්ථාන 747කින් සහ ATM, CDM හා CRM යන්ත්‍ර 1,150කට අධික පුළුල් ජාලය ඔස්සේ සිය ගනුදෙනුකරුවන්ට අසමසම සේවාවක් පිරිනමයි. එමෙන්ම එහි People's Wave App, People's Wyn Apps සහ People's Pay Digital Wallet app යන යෙදවුම් ශ්‍රී ලංකාවේ ඩිජිටල් බැංකුකරණ ක්ෂේත්‍රය නව මානයක් කරා රැගෙන යාමට සමත් වී තිබේ. මේ වනවිට මිලියන දෙකකට වැඩි සක්‍රීය පරිශීලකයන් පිරිසක් People's Wave යෙදුම බාගත කර ඇති අතර, 50කට වැඩි විවිධ මූල්‍ය ගනුදෙනු සේවා ප්‍රමාණයක් සහ ගනුදෙනුකරුවන්ට පහසුවෙන් බැංකු සේවා ඉටු කරගැනීමට හැකියාව ලබාදෙන නවීන බැංකු පහසුකම් රැසක්ද මෙම සේවාවෙහි අන්තර්ගත වේ.

දිවයින පුරා පිහිටි ශාඛා සහ සේවා මධ්‍යස්ථාන 747කින් සමන්විත මහජන බැංකුව, මිලියන 14.7කට අධික ගනුදෙනුකරුවන්ගෙන් යුත් රුපියල් ට්‍රිලියන 3කට අධික ඒකාබද්ධ වත්කම් සහිත දිවයිනේ ප්‍රමුඛතම මූල්‍ය සේවා සපයන්නා වේ.

# HNB FINANCE PLC GREAT PLACE TO WORK සහතික ලත් සමාගම් අතරට




ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම මූල්‍ය සමාගමක් වන HNB FINANCE PLC සිය විශිෂ්ටත්වය සනාථ කරමින් සේවය කිරීමට සුදුසු විශිෂ්ටතම සමාගම් අතරට එක්වෙයි. ආයතනික ක්ෂේත්‍රයේ ප්‍රශස්ත සේවා පරිසරයක් සහිත ව්‍යාපාරයන් හඳුනාගනිමින් එම සමාගම් වාර්ෂිකව ඇගයීම Great Place To Work ශ්‍රේණිගත කිරීම මගින් සිදුකරන අතර 2024 වසර සඳහාද මෙම ගෞරවනීය පිළිගැනීම හිමිකර ගැනීමට HNB FINANCE සමාගමට හැකි විය.

ජාත්‍යන්තර පිළිගැනීමක් සහිත Great Place To Work හිදී ව්‍යාපාරික පරිසරය, සේවක අත්දැකීම්, ආයතනික නායකත්වයෙහි ඉදිරි දැක්ම යන සාධකයන් පිළිබඳ ආයතනික වශයෙන් සේව්‍ය සේවක දෙපාර්ශ්වය අතර වූ අන්‍යෝන්‍ය එකඟතාව හා විශ්වාසය තුළින් එම ව්‍යාපාරයන් අත්පත් කරගනු ලැබූ ප්‍රගතිය, සේවකයන් එම ව්‍යාපාරයන්හි රැඳී සිටීම සහ නවෝත්පාදන හැකියාවන් වර්ධනය සිදුවූ ආකාරය පිළිබඳ විශ්ලේෂණයකට ලක්කිරීම සිදුකෙරේ.

HNB FINANCE PLC ආයතනයේ සියලු සේවා පරිශ්‍රයන් වඩාත් ප්‍රසන්න සහ සේවකයන්ට සතුටින් සේවය කළ හැකි ස්ථානයක් බවට පත්කිරීම සඳහා විවිධ ක්‍රියාමාර්ග ගෙන ඇති අතර, ආයතනය විසින් ගනු ලැබූ එකී ක්‍රියාමාර්ගයන් මෙම සම්මානය තුළින් ඇගයීමට ලක්වී ඇත.

# NDB ලීසිං සමග විශ්වාසයෙන් පැදයන්න




NDB ලීසිං සිය නවතම ලීසිං ප්‍රවර්ධන වැඩසටහන වන 'NDB ඔටෝ කානිවල්' පළමු ප්‍රවර්ධන වැඩසටහන සාර්ථකව අවසන් කරන ලදී.

අප්‍රේල් 04 සිට අප්‍රේල් 05 දක්වා දඹුල්ල විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයේදී පවත්වන ලද මෙම ප්‍රවර්ධන වැඩසටහනේදී NDB බැංකුව පුළුල් පරාසයක ලීසිං විකල්පයන් හඳුන්වා දෙමින් සහභාගි වූවන්ට ප්‍රතිලාභ රැසක් ලබාදෙන ලදී.

මෙම ප්‍රවර්ධන ලීසිං වැඩසටහන අතරතුර, සිය පාරිභෝගිකයන්ට ඔවුන්ගේ මූල්‍ය අවශ්‍යතාවලට සරිලන පරිදි සකස් කරන ලද ආපසු ගෙවීමේ යෝජනා ක්‍රම පිළිබඳ වැඩිදුර තොරතුරු දැනගැනීමට අවස්ථාව සලසා තිබිණි. තවද, පාරිභෝගික ජනතාවට වාහනයක් සඳහා ලීසිං පහසුකම් ලබාගැනීමේදී දැරිය හැකි මාසික වාරිකයන් හඳුන්වාදෙමින්, ඇපකරුවන් නොමැතිව සහ අධික මූලික ගෙවීම් ඉවත්කරමින් අමතර ප්‍රතිලාභ රැසක් ද සමගින් වෙළෙඳපොළේ පවතින තරගකාරී අවම පොලී අනුපාත යටතේ, NDB ලීසිං පහසුකම් ලබාගැනීමට පහසුකම් සලසා තිබිණි.

මීට අමතරව NDB ලීසිං සේවාවේ ප්‍රවීණයන් මෙම අවස්ථාවට පැමිණ, සිය පාරිභෝගිකයන්ට තීරණ ගැනීම සඳහා ඔවුන්ගේ අවශ්‍යතාවලට ගැළපෙන දැනුවත් කිරීම් සහිත ලීසිං විශේෂඥ සේවාවන් ලබාදෙන ලදී. NDB ලීසිංහි ක්‍රමවත් ක්‍රියාවලිය සමගින්, පාරිභෝගිකයන්ට අනවශ්‍ය ප්‍රමාදයන් මඟහරවා ගනිමින් ඔවුන් තෝරාගත් වාහනය එදිනම රැගෙන යාමේ පහසුවද හිමිවිය.

# ලිට්‍රෝ ත්‍රිකුණාමලයේ පැවැති 2024 ජාත්‍යන්තර බාලදක්ෂ ජම්බෝරියට සහයෝගීතාව දක්වමින් ජවබල ගන්වයි




ත්‍රිකුණාමලයේදී පසුගියදා නිමාවට පත්වූ 10 වැනි ජාතික බාලදක්ෂ ජම්බෝරිය ජාත්‍යන්තර සුහදත්වය සැමරීම පමණක් නොව සභාපති මුදිත පීරිස් මහතාගේ දූරදර්ශී නායකත්වය යටතේ ලිට්‍රෝ හි වැදගත් කාර්යභාරය ද මැනවින් පෙන්නුම් කළේය. ආරක්ෂාව, තිරසාරභාවය සහ සහයෝගීතාව කෙරෙහි අවධානය යොමු කරමින්, ජාතික වශයෙන් පරිවර්තනය සඳහා ලිට්‍රෝහි කැපවීම මෙම උත්සවය පුරාම දැකගන්නට ලැබුණු අතර, රටවල් 28කින් පැමිණි බාලදක්ෂයන් 12,000කට කිසිදා අමතක නොවන මතක සටහනක් තැබීය. ලිට්‍රෝ මෙම ජම්බෝරියට සවිබලය ලබාදීම මගින් පරිසරයට, සමාජයට සහ ආර්ථිකයට යන කරුණු තුනට ප්‍රමුඛත්වය දෙමින් බලශක්ති තිරසාරත්වය සාක්ෂාත් කරගැනීම සඳහා වූ ආයතනයේ අරමුණ හා සමගාමී වේ. ඒ සම්බන්ධයෙන්, ලිට්‍රෝ පසුගිය වසර කිහිපය තුළ සිසුන් සමග සමීපව කටයුතු කර ඇති අතර, තිරසාර, ආරක්ෂිත බලශක්ති විකල්පයක් ලෙස LP ගෑස් භාවිතය පිළිබඳ දැනුවත් කරමින් ඒ වෙනුවෙන් පෙනී සිටියි.

# BT BUSINESS TALK

# අනාගත නායකයින් බිහිකරනු වස් කාන්තාවන් සවිබල ගැන්වීමට විද්වත් සාකච්ඡාවක් තුළින් අවධානය යොමු කරයි

## Lifebuoy Shampoo 100,000කට අධික ප්‍රතිඥා ලබාගනිමින් ඊට ශක්තිමත් සහයෝගයක් දක්වයි



රටේ අනාගතය භාර ගැනීමට සිටින තරුණ පරපුර සතු අභිලාෂයන් බොහෝය. අනාගතය වෙනුවෙන් සිහින දකින ඔවුන්ට වඩා හොඳ අනාගතයක් නිර්මාණය කිරීමේදී විවිධ ක්ෂේත්‍රයන් තුළින් සුවිශේෂ බලපෑම් ඇතිකිරීමට සමත් වූ කාන්තා චරිතයන්හි වැදගත්කම පිළිබඳ තීරණාත්මක සංවාදයක් ගෞරවනීය විද්වත් මඬුල්ලකගේ සහභාගීත්වයෙන් පවත්වනු ලැබීය. තමන් නියෝජනය කළ සෑම ක්ෂේත්‍රයකදීම මුහුණ දුන් අභියෝගයන් ජයගනිමින් ඉතිහාසය තුළ නොමැකෙන නමක් සනිටුහන් කළ ශ්‍රී ලාංකේය කාන්තාවන් වෙත නිරන්තර ගෞරවය පුද කිරීම රටේ අනාගත පරපුරෙහි විශ්වාසය හා ශක්තිය ඉහළ නැංවීමේ වැදගත් පියවරකි. එවන් ශ්‍රී ලාංකේය දිරිය කාන්තාවන් රට, ජාතිය වෙනුවෙන් සිදුකළ කැපවීම වෙනුවෙන් නිසි ගරුත්වයක් ලබාදීමේ වැදගත්කම හා අවශ්‍යතාව පෙන්වා දුන් මෙම විද්වත් සාකච්ඡාව වත්මන් තාරුණ්‍යය දිරිගැන්වීමේ සුවිශේෂ පියවරක් ලෙසද සඳහන් කළ හැකිය.

# සියැට් කැළණි වෙතින් 'ඔරායන් බ්‍රාවෝ' පරාසයේ නව රේඩියල් ටයර් ප්‍රමාණ තුනක්



වාහන හිමියන් විශාල පිරිසකට සියැට් නිෂ්පාදන තෝරාගැනීමේ අවස්ථා පුළුල් කරමින් ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම වායුමය ටයර් නිෂ්පාදකයා වන සියැට් කැළණි සමාගම රේඩියල් ටයර ප්‍රමාණ තුනක් වෙළෙඳපොළට හඳුන්වාදී ඇත.

සියැට් හි 'ඔරායන් බ්‍රාවෝ' පරාසයට එක් කළ නව රේඩියල් ටයර් 155/65 R14, 165/70 R14 සහ 165 R13 යන ප්‍රමාණවලින් පවතී. මෙම පළමු වර්ග දෙක කුඩා මෝටර් රථවල ජනප්‍රිය මාදිලි සඳහා නිපදවා ඇති අතර, තෙවැනි වර්ගය මධ්‍යම ප්‍රමාණයේ වෑන් රථ සඳහා වන බව සමාගම පවසයි.

සියැට් ඔරායන් බ්‍රාවෝ 155/65 R14 සහ 165/70 R14 ටයර් වර්ග දෙකම සුවිශේෂ කට්ට රටාවකින් සමන්විත වන සේ නිර්මාණය කර ඇති බැවින් මෙම ටයරවල ආයුකාලය වැඩි වන අතර, ටයරයට ඇති විය හැකි බාහිර හානිවලට ඉහළ ප්‍රතිරෝධයක් දක්වයි.

මේ අතර, සියැට් ඔරායන් බ්‍රාවෝ 165 R13 වෑන්රථ රේඩියල් ටයරය ද සුවිශේෂ කට්ට රටාවකින් සමන්විත වීම තුළින් ටයරයේ කල් පැවැත්ම, වැඩි ආයු කාලයක් සහිත කට්ට රටාව, සහ බාහිර හානිවලට ඉහළ ප්‍රතිරෝධයක් හා වැඩි බරක් දරාගැනීමේ හැකියාවක් ද පවතී.

# ALIPAY QR ගෙවීම් සක්‍රිය කරමින් කොමර්ෂල් බැංකුවෙන් ව්‍යාපාරික ප්‍රජාවට නව මාවතක්




ඒකාබද්ධ ලංකා QR යටතේ Alipay QR කේත ගෙවීමේ ක්‍රමය සක්‍රීය කළ ශ්‍රී ලංකාවේ පළමු බැංකුව වෙමින් කොමර්ෂල් බැංකුව දේශීය ව්‍යාපාර සඳහා නව අවස්ථාවන් විවර කරදීමට සමත් වී ඇත.

මෙම ගෙවීමේ ක්‍රමය හඳුන්වා දීමේ ප්‍රතිඵලයක් ලෙස බිලියනයකට අධික Alipay e-wallet හිමියන්ට, ලංකාවේ ව්‍යාපාරික ප්‍රජාවට නිකුත් කර ඇති කොමර්ෂල් බැංකුවේ ලංකාපේ ඒකාබද්ධ QR කේතය ස්කෑන් කිරීම මඟින් ලෝකයේ ඕනෑම ස්ථානයක සිට තම ගනුදෙනු සිදුකිරීමේ හැකියාව උදාවී ඇත.

බැංකුව සිය සමස්ත ජාලයට නව QR යෙදවුම ලබාදීම සම්පූර්ණ කරන විට ව්‍යාපාරිකයන් 50,000කට අධික පිරිසකට Alipay QR ගෙවීම් ලබාගැනීමේ හැකියාව ලැබෙන බව බැංකුව පවසයි. එමෙන්ම POS උපාංග හිමි 28,000 පමණ වූ ව්‍යාපාරික ප්‍රජාවට දැනටමත් බැංකුව ඇමතීමෙන් Alipay QR ගෙවීම් සක්‍රිය කරගැනීමට හැකියාව ඇත.

# SLT-MOBITEL වෙතින් 'CAPITAL HEIGHTS' නිවාස ව්‍යාපෘතියට අධිවේගී FIBRE සම්බන්ධතා පහසුකම්




ජාතික තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විසඳුම් සම්පාදක වන SLT-MOBITEL, රාජගිරිය 'Capital Heights' නිවාස ව්‍යාපෘතියට අධිවේගී සම්බන්ධතා පහසුකම් පිරිනැමීම සඳහා Blue Star Realties (පුද්.) සමාගම සමග පසුගියදා ගිවිසුම්ගත විය.

Blue Star Realties (පුද්.) සමාගම මෙරට සිවිල් ඉංජිනේරු සහ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ප්‍රමුඛතම සමාගමක් ලෙස සැලකේ. එවකට SLT සමාගමේ සාමාන්‍යාධිකාරී (පාරිභෝගික ව්‍යාපාර සහය) ලෙස කටයුතු කළ, වර්තමාන විශ්‍රාමික පුෂ්පකුමාර සමරසිංහ මහතා සහ Blue Star Realties (පුද්.) සමාගමේ ප්‍රධාන මෙහෙයුම් නිලධාරී/ විධායක අධ්‍යක්ෂ මෝසන් ඩේගන් මහතා විසින් ගිවිසුමට අත්සන් තබන ලදී.

මෙම එකඟතාව යටතේ 'Capital Heights' නිවාස ව්‍යාපෘතියේ පදිංචිකරුවන්ට අධිවේගී ෆයිබර් සබන්ධතා සමග, නවීන ලෝකයේ ජීවන රටා අවශ්‍යතා සඳහා ගැළපෙන සේවා රාශියක් හිමි වේ.

# DFCC බැංකුව 2024 WCIC කාන්තා ප්‍රතිභාභිෂේක සම්මාන උළෙල බලගන්වයි



කාන්තාවන් වෙත මූල්‍ය සේවාවන් සැපයීම තුළින් ඔවුන් සවිබල ගැන්වීමට කැපීපෙනෙන මෙහෙවරක් ඉටුකරමින් සිටින DFCC බැංකුව 2024 WCIC ප්‍රතිභාභිෂේක සම්මාන උළෙලේ ප්‍රධාන අනුග්‍රාහකයා (**Diamond Sponsor**) සහ බැංකුකරණ හවුල්කරු ලෙස කටයුතු කළේය. මෙය ශ්‍රී ලංකාවේ නවෝත්පාදන සහ ව්‍යවසායකත්වය ශක්තිමත් කරන අතරම රටේ ආර්ථිකය තුළ කාන්තාවන් ඉටුකරන භූමිකාව අගය කිරීම සඳහා DFCC බැංකුව දරන නිරන්තර උත්සාහයේ තවත් ප්‍රතිඵලයකි. උත්කර්ෂවත් අන්දමින් පැවැති මම සම්මාන උළෙලේදී ශ්‍රී ලංකාවේ සහ සාක් කලාපයේ විශිෂ්ට තම ව්‍යවසායිකාවෝ රැසක් ඇගයීමට ලක්වූහ.

මෙරට ව්‍යවසායකත්ව, ව්‍යාපාරික සහ වෘත්තීය කාන්තාවන් නියෝජනය කරන ප්‍රමුඛතම සංවිධානය වන කාන්තා කර්මාන්ත හා වාණිජ මණ්ඩලය (**Women's Chamber of Industry and Commerce - WCIC)** විසින් මෙම සම්මාන උළෙල සංවිධාන කරන ලදී. මෙහි බැංකුකරණ හවුල්කරු ලෙස DFCC 'ආලෝකා' කටයුතු කිරීම, සම්මානවලට නිර්දේශ වූ කාන්තාවන්ට සහ ජයග්‍රාහිකාවන්ට ශක්තියක් වීමට අමතර සම්මාන උළෙලේ පිළිගැනීම තවදුරටත් වර්ධනය කළ සාධකයක් විය. සම්මාන උළෙලට අත්වැලක් වීමට අමතරව, කාන්තාවන්ට මූල්‍යමය කටයුතු සම්බන්ධ මගපෙන්වීම් හා සේවාවන් ලබාදීමටද DFCC බැංකුව මෙහිදී කටයුතු කළේය. මෙය එම කාන්තාවන්ට තම ක්ෂේත්‍රයන්හි සෙසු සාමාජික සාමාජිකාවන් සමග සම්බන්ධතා ගොඩනංවා ගනිමින්, තම ව්‍යාපාර සහ වෘත්තීය කටයුතු දියුණු කරගැනීම සඳහා ලැබුණු අගනා අවස්ථාවක් විය. මෙවැනි පියවර ඔස්සේ රටේ ආර්ථික සංවර්ධනයට හා සමෘද්ධියට දායක වීම DFCC බැංකුවේ අරමුණ වී තිබේ.

# 'දිසි රැළ' ඒකාබද්ධ සමුද්‍ර ආරක්ෂක මෙහෙයුම තුළින් ඔස්ට්‍රේලියාව සහ ශ්‍රී ලංකාව අතර සමුද්‍රීය ආරක්ෂක මෙහෙයුම් තවදුරටත් ශක්තිමත් වේ




පසුගිය දා කොළඹදී දියත් කරන ලද නව ඒකාබද්ධ සමුද්‍ර ආරක්ෂක මෙහෙයුම තුළින් දෙරටේ සමුද්‍රීය ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ඔස්ට්‍රේලියාව සහ ශ්‍රී ලංකාව දක්වන කැපවීම මැනවින් ප්‍රදර්ශනය විය.

'දිසි රැළ' ලෙස නම්කර ඇති මෙම ඒකාබද්ධ මෙහෙයුමේ මූලික අරමුණ වන්නේ අන්තර් සමුද්‍රීය කලාපය පිළිබඳ විමසිලිමත් බව තවදුරටත් ඉහළ නැංවීම වේ. මෙම වැඩසටහන යටතේ ඔස්ට්‍රේලියානු දේශසීමා බලකාය (ABF) සහ ශ්‍රී ලංකා වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුව (SLCG) විසින් දික්ඔවිට ප්‍රදේශයේ සිට හලාවත ප්‍රදේශය දක්වා සතියක තියමු වැඩපිළිවෙළක් දියත් කොට එය ඉදිරියට බලාත්මක කිරීමට අපේක්ෂා කරයි.

# CERTIS LANKA සිය සන්නාමය නව්‍යකරණය කරමින් SITREK GROUP ලෙස එළිදක්වයි



මෙරට ආරක්ෂක සේවාවන්හි පුරෝගාමී ආයතනයක් වන Certis Lanka සමූහ ව්‍යාපාරය සිය 46 වසරක විශිෂ්ට ගමනේ සුවිසල් සංධිස්ථානයක් සනිටුහන් කිරීමට පසුගියදා සමත් විය. ඒ සිය සන්නාමය නව්‍යකරණය කරමින් SITREK Group ලෙස එළිදැක්වීමයි. පසුගියදා කොළඹ සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේදී පැවැත්වුණු විශේෂ උත්සවකදී මෙම නව සන්නාමය එළිදැක්වීම සිදුවූ අතර, එම අවස්ථාව සඳහා ගෞරවනීය අමුත්තන්, පාර්ශ්වකරුවන් සහ මාධ්‍යවේදීන් රැසක් සහභාගි විය.

# ඇසට්ලයින් ෆිනෑන්ස් 56 වැනි ශාඛාව පානදුර විවෘත කෙරේ



ඩේවිඩ් පීරිස් සමූහ ව්‍යාපාරයේ මූල්‍ය සේවා අංශය වන ඇසට්ලයින් ෆිනෑන්ස් ලිමිටඩ්හි 56 වැනි ශාඛාව අංක 519, ගාලු පාර, පානදුර යන ස්ථානයේදී පසුගියදා විවෘත විය. සමාගමේ ශාඛා ජාලය වැඩිදියුණු කිරීමේ වැඩසටහනේ තවත් එක් සංධිස්ථානයක් සනිටුහන් කිරීමට නව ශාඛාව සමත් විය.

පානදුර මහා පරිමාණ මෙන්ම කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් රැසක් සමග සීඝ්‍රයෙන් දියුණු වන නගරයක් වීම හේතු කොටගෙන උපාය මාර්ගික ශාඛා ජාලය පුළුල් කිරීමේදී ඇසට්ලයින් නව ශාඛාවක් ස්ථාපිත කිරීමට හේතු විය. ඇසට්ලයින් ෆිනෑන්ස් සමාගමේ නම්‍යශීලී, වෘත්තීයමය මෙන්ම ගනුදෙනුකරුගේ අවශ්‍යතාව සඳහාම වෙන්වූ සේවා දැන් පානදුර ප්‍රදේශයේ පදිංචිකරුවන්ට විවර කර ඇත. නව ශාඛාවෙන් වාහන ලීසිං, වාහන ණය, කාරක ප්‍රාග්ධන ණය, ස්ථාවර තැන්පතු ඇතුළු තවත් මූල්‍ය විසඳුම් රැසක් පානදුර ශාඛාවෙන් ලබාගත හැකිය.

මෙරට ශ්‍රම බළකායේ ප්‍රධානතම කොටසක් වන කාන්තාවන් සවිබලගැන්වීම සඳහා සුවිශේෂ ලිය දිරිය ණය ප්‍රදානය කිරීමද නව ශාඛාව හරහා සිදු කෙරේ. මෙම ණය යෝජනා ක්‍රමය යටතේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල නිරත වන කාන්තාවන්ගේ ප්‍රවාහන කටයුතුවලට අතහිත දීම සිදුකෙරේ.

# සනත් නිශාන්තට එහෙමයි තෙවරප්පෙරුමට මෙහෙමයි

**මරණයක් යනු දුකට කාරණයකි. සතෙක් සිවුපාවෙක් වාහනයකට යටවී මැරුණත් අපි 'අනේ අපොයි' කියන්නේද ඒකය. පරණ කාලේ මිනිස්සු කතාවට කියන්නේ 'මඟුල් ගෙදරකට ආරාධනා කරන කල් හිටියත් මළ ගෙදරක් හොයාගෙන යායුතුය' කියාය.**

හතුරෙකුටවත් මරණය ප්‍රාර්ථනා කරන්න එපා කියාද කතාවක් වේ. ඔය කොයි දෙයිනුත් කියන්නේ මරණය කටුකය කියාය. මරණය ශෝකාන්තයක් කියාය.

එහෙත්, 2024 ජනවාරි 25 වැනිදා හදිසි අනතුරකින් මියගිය පාර්ලිමේන්තු මන්ත්‍රී සහ රාජ්‍ය අමාත්‍යවරයකු වූ සනත් නිශාන්තට මුහුණු පොතේ පළව තිබුණු ප්‍රතිචාර ඊට වැඩිය වෙනස් විය. සනත් නිශාන්ත වෙනුවෙන් නිර්මාණය වී තිබුණු පෝස්ට්වලද වූයේ උපහාසමය සහ වෛරය කැටිවූ අදහස්ය.

'දිට්ඨ ධම්මවේදනීය කර්මයට පිටුපා යෑමට මොනම කෙරුම්කාරයකුටවත් නොහැකි බව සනත් නිශාන්ත පසක් කළේය...'

'දේව අධිකරණයට තරාතිරම් නැත. සනත් නිශාන්තගේ අකල් මරණය අප හැමෝටම පාඩමකි...'

'සොබාදහම නියම කරන සාධාරණ තීන්දුවලට රැයක් දවාලක් තැනක් නොතැනක් හෝ උස් පහත් භේදයක් නැත. වෙලාව පැමිණි කල එය කාටත් එකය...'

**'මැරුණට පස්සේ සනත් නිශාන්තට ලැබුණු අපහාස සහ උපහාසත් තෙවරප්පෙරුමට ලැබුණු ආදරණීය ගරුබුහුමනුත් අපේ දේශපාලකයන්ට හොඳ පාඩමකි.'**

**අප්‍රේල් 24 වැනිදා මුහුණු පොතේ එහෙම සටහනක් දමා තිබුණේ සනත් නිශාන්තගේ සහ තෙවරප්පෙරුමගේ සේයාරූද සමගය.**

**'නරුම දේශපාලකයනි, සනත් නිශාන්තගේ මැර බලය නොව තෙවරප්පෙරුමගේ මනුස්සකම ආදර්ශයට ගනිල්ලා. හැදෙනවා නම් හැදෙන්න ඒ ටිකම හොඳටම ඇති නුඹලාට...'**





## දෙවියනේ එහෙම වුණේ ඇයි?

සනත් නිශාන්ත ජැංඩි පහට ඇඳගත් ලස්සන ෆොටෝ දමමින් මුහුණු පොතේ පළවෙන්නට ගත්ත පෝස්ට් බොහොමයක වූයේ ඉහත සඳහන් උපහැරණය. ඒ ඒ පෝස්ට්වලට යටින් දිගින් දිගටම සටහන් වූ කමෙන්ට්ස්වල වැඩිහරියක්ම වූයේ,

'අපාගත වේවා...' කියන වචන පෙළය. හතුරකුගේ හෝ අකල් මරණයකදී 'අපාගත වේවා' යන ප්‍රාර්ථනය කිසිවකුට කළ හැකිද? යන සිතුවිල්ල තුළ සමහරු මෙතැනදී සිටින්නට ඇත. සත්තකින්ම එහෙම හිතන එක සමහර විටෙක සාධාරණය. නමුත් මරණයකදී අකාලේ මියගිය ඒ අය ගැන 'මකබෑවියන්' හෝ 'අපායටම පලයන්' කියා හිතන තාලෙට මිනිසුන් දරුණු වන්නේ ඇයිද කියන එක ගැනත් මෙතැනදී මඳකට හිතිය යුතුය. ඇත්තටම පක්ෂ පාට භේදයක් නැතිව ජාති ආගම් භේදයක් නැතිව සනත් නිශාන්තට රටේ මිනිසුන් එහෙම ශාප කළේ ඇයි? එයට හේතුව ඔහු දේශපාලනඥයකු වීමද? නැතිනම් පොහොට්ටුව සමග වීසූ රාජපක්ෂලාගේ අනුගාමිකයකු වීමද? එහෙම හිතන්නටත් බැරිය. එහෙම හිතනවා නම් හිටපු නියෝජ්‍ය අමාත්‍ය පාලිත තෙවරප්පෙරුමටත් එය එලෙස වෙන්නට තිබුණේය. ඔහුද සනත් නිශාන්ත වගේම දේශපාලකයෙකි. පොහොට්ටුව සමග හිටපු රාජපක්ෂලාගේ හිතවතෙකි. කවුරුවත් කැමැති නැති දේශපාලන චරිතයක් වූ මර්වින් සිල්වාගේ ගජ මිත්‍රයෙකි. නමුත් විදුලි සර වැදී අකල් මරණයකින් හදිසියේම යන්නට ගිය පාලිත ගැන මුහුණු පොතේ නිර්මාණය වූ පෝස්ට් සනත් නිශාන්තගේ පෝස්ට්වලට වැඩිය ගොඩක් වෙනස්ය. මොනම පක්ෂයකටවත් නැති මිනිසුන් වගේම පොහොට්ටුව ලකුණ මෙන්ම රාජපක්ෂලාව දිරවන්නේ නැති අනෙකුත් පක්ෂවල පිරිසද තෙවරප්පෙරුමගේ අකල් මරණය වෙනුවෙන් අවංකවම දුක් වුණෝය. මාධ්‍ය හරහා තම ශෝකය පළ කළහ. මුහුණු පොත හරහා දවස් ගණනක් පුරා ඔහු වෙනුවෙන් දිගු කතන්දර සටහන් විය. ලොකු පොඩි කවුරුත්, තරුණ වැඩිහිටි බාල මහලු කවුරුත් ඔහුගේ යහපත් ගති පැවැතුම් ගැන ගුණ වැයූහ. මෙය ලියන මොහොතේ ඔහුගේ මරණයට දවස් දහයකට කිට්ටු වුවද අදටත් තවමත් මුහුණු පොත තුළ තෙවරප්පෙරුම ගැන සංවේදී වැකි සටහන් වේ.

සනත් නිශාන්තව 'මකබෑවියන්' සහ 'අපාගත වේවා' යැයි කියා කමෙන්ට්ස් දමන්නටත්, තෙවරප්පෙරුමට 'ආදරණීය චණ්ඩි මාමේ ඔබට සුබ ගමන්' කියා සෙනෙහෙවන්ත අකුරු සටහන් කරන්නටත් මේ රටේ මිනිසුන් පෙලඹුණේ කුමන හේතුවක් නිසාද? ස්මාර්ට් එකට ඇන්දෙත් සනත් නිශාන්තය. පිරිස් බලය තිබුණෙත් ඉහළ බලවතුන් හා සමීපව සිටියෙත් පොහොට්ටුවේ බලය ඕනෑවට වැඩිය තිබුණෙත් සනත් නිශාන්තටය. එහෙම බලනකොට තෙවරප්පෙරුම බොහොම සාමාන්‍ය මිනිසෙකි. ජැන්ඩි පහට අඳින වුවමනාවවත් බලය පතුරුවන හෝ බලය අල්ලන උමතුවවත් ඔහුට තිබුණේ නැත. එහෙනම් සනත් නිශාන්තට වැඩිය ජනතා ආකර්ෂණයක් මිනිසුන් අතර ආදරයක් සහ සමීප බවක් තෙවරප්පෙරුමට අවසාන මොහොතේ ලැබුණේ කොහොමද? අපේ රටේ දේශපාලකයන් හිතට ගතයුත්තේ අන්න ඒ ටිකය.

'මැරුණට පස්සෙ සනත් නිශාන්තට ලැබුණු අපහාස සහ උපහාසත් තෙවරප්පෙරුමට ලැබුණු ආදරණීය ගරුබුහුමනුත් අපේ දේශපාලකයන්ට හොඳ පාඩමකි.'

අප්‍රේල් 24 වැනිදා මුහුණු පොතේ එහෙම සටහනක් දමා තිබුණේ සනත් නිශාන්තගේ සහ තෙවරප්පෙරුමගේ සේයාරූද සමගය.

'නරුම දේශපාලකයනි, සනත් නිශාන්තගේ මැර බලය නොව තෙවරප්පෙරුමගේ මනුස්සකම ආදර්ශයට ගනිල්ලා. හැදෙනවා නම් හැදෙන්න ඒ ටිකම හොඳටම ඇති නුඹලාට...'

තෙවරප්පෙරුමගේ දේහයේ අවසන් කටයුතු සිදුකරන මොහොතේ ඔහු වෙනුවෙන් 'හමාර බණවර' සින්දුව අලුතින්ම කියන රවී රොයිස්ටර්ගේ පින්තූරයක් සමග මුහුණු පොතේ එකී පෝස්ටුව සටහන්ව තිබිණි.

එහි සටහන් වූ ලෙසටම අපේ රටේ දේශපාලකයන් මේ පූර්වාදර්ශය සිතට ගනීවිද? නැත්නම් දවස් දෙකකින් මේ පාඩම අමතක කරලා දමාවිද? පාඩමක් ඉගෙනගන්නට හිතනවා නම් අවස්ථා දෙකක් හොඳටම සෑහේ. ඒ සනත් නිශාන්ත සිය බලයෙන් අරගලයට පහර දීමේ අමානුෂික සිදුවීම සහ තෙවරප්පෙරුම කොරෝනා කාලෙදී අසරණව හිටපු මිනිසුන්ගේ කුසගිනි නිවන්නට වෙහෙසවූ සිදුවීමය. සනත් නිශාන්ත සිය මැර දේශපාලනය ප්‍රදර්ශනය කළ තව අවස්ථා ඕනෑ තරම් තිබෙන අතර, තෙවරප්පෙරුම සිය මනුසත් බව රටේ අසරණ මිනිසුන් හමුවට ගෙන ගිය අවස්ථාද බොහොමයක් තිබෙනවාය. අපේ මිනිසුන්ට ගලේ කෙටුවා වාගේ මතක තිබුණේ ඒවා නොවේද?

අර කිව්වත් වාගේ අපේ දේශපාලකයන්ට හැදෙන්න ඒ ටික හොඳටම ඇතිය.

හැබැයි උන් දෙවියන්ට සහ සොබාදහමට ගරු කරන්නේ නැතිනම් දිට්ඨ ධම්මවේදනීය කර්මය අදහන්නේ නැතිනම් හොඳ නරක දෙක හඳුනන්නේ නැතිනම් කවදාවත් හැදෙන එකක් නැති බවද මෙහි අවසානයට සටහන් නොකර බැරිය.

දමයන්ති රේණුකා ප්‍රනාන්දු

## තෝදෙය්‍යනං බ්‍රාහ්මණය...

PAGE - 14

ප්‍රේමදස මහත්තයත් හොඳ මිනිහෙක් කියල මං කියන්නෙ නෑ. එයාටත් භාරගන්න උණේ දෙකොන පත්තුවෙන විලක්කුවක්. උතුරේ කොටි. මෙහෙ විමුක්තිකාර සහෝදරයො. විමුක්තිකාරයො එක්ක ඔට්ටු අල්ලල උන් මට්ටු කෙරුව. එහෙම මට්ටු නොකෙරුවා නං මිනිහෙකුට පාරෙ බැහැල යන්න පුළුවං වෙනවද? කුලී වැඩ කරන මිනිහෙකුට පනං හතරක් හොයාගන්න පුළුවං වුණාද? නැද්ද මං අහන්නෙ. කහ බළල්ලු බෝකෙරුව, ඒ කාලෙ ප්‍රා කියලත් කට්ටියක් හිටියලු. මං ඒක වැරදියි කියන්නෙත් නෑ. හරි කියන්නෙත් නෑ. එකක් කියනව එල්.ටී.ටී.ඊ කාරයොයි මුනුයි තමයි මේ රටේ මහජන දේපොළ විනාශ කෙරුවෙ. රට මේ තත්තෙට දැම්මෙ.

අපේ ලොකු අම්මගෙ දුවක් හිටියා. කසාද බැඳල දරු දෙන්නෙකුත් හිටියට යූ.ඇන්.පී. ශාඛා සමිතියෙ සභාපති. තුවක්කුකාරයො මහ රෑ ඇවිල්ල දරු දෙන්න විලාප තියද්දී ඇදගෙන ගිහිං බස් හෝල්ට් එකේ බැඳල වෙඩි තියල මැරුව. ඒ එක සිද්ධියක්. තවත් ඕනෑ තරං. දූං අනුර වැඳ වැඳ සමාව ඉල්ලුවට ඒ දූවට පණ එනවද? මොනවටද මං කියන්නෙ. ඕවට දෙන්ඩ හොඳ උත්තර නං කටට එනව.

"ඉතිං ඔයාට පුළුවංද ඔකුන්ඩ චංදයක් දෙන්න"

මම දෙපසට හිස වැනුවෙමි.

ඩී.බී. විජේතුංග ලොක්ක හිටියෙ පතෝල වාගෙ ඉඳල ගියා ගියාමයි. ආයෙ ඉන්නවද මැරුණද කියල හාවක් හූවක්වත් (ආරංචියක්) තිබුණෙ නෑ. මං මේ කියන්නෙ ඒ කාලෙ බලේ ඉන්නැද්දි කියපු කරපුව නෙමෙයි. රට කාලා කාලා මහජනයා විසින් පන්නල දැම්මට පස්සෙ ආයෙත් උප්පර වැට්ටි දම දමා එන්ඩ හදන එක ගැන. ඒත් එක්කම ආවෙ චන්ද්‍රිකා නෝනා. මැතිවරණ ඉතිහාසෙ ඉතාම නින්දිත චන්දෙ පැවැත්වුණේ එයාගෙ කාලෙ වයඹට. කියන්ඩ විලිලැජ්ජයි. ඒ මැතිවරණෙදි කාන්තාවක් නිරුවත් කරල මහ පාරෙ ඇවිද්දෙව්ව. වැඩි විස්තර අයිවන්ගෙ චෞර රැජිණ පොතේ තියෙනව. තවමත් බලේට එන්ඩ අල්ලන අඩව් කියල වැඩක් නෑ.

නර්ථන ශිල්පිනියන් උඩරට නැටුම් නටන්නෙ (අඩව් අල්ලන්නෙ) සේලෙ ඇඳල. කාන්තාවක් නිරුවත් කරවපු, කඩුලු හතම පැන්න මේ අම්මණ්ඩි ආයෙත් ඇවිල්ල සේලෙ නැතුවම අඩව් අල්ලන්ඩ බැරිකමක් නෑ.

මහින්ද ලොක්කා 2015 දී පන්නල දාපු වෙලාවෙ මිනිහට පිස්සු වැටුණ. මැදමුලනට ගිහිල්ල වවුලෙක් වාගෙ ජනෙල් පලුවෙ එල්ලිලා මොරදීපු හැටි චීක් විතරක්. බලේට තියෙන පෙරේතකම්, කෑදරකම. මේ එක්කෙනෙකුටවත් විලිලැජ්ජාව කියල දෙයක් නෑ. රෙදි අඳින්නෙ ලෝ සිරිතට. අනුන් අඳින හිංද. එහෙම කියන්නෙ ඇයි දන්නවද? මහින්ද ලොක්ක ආවනං මං අඩි හයක් යට කියල යූ.ඇන්.පී.කාරයන්ගෙ ඡංදෙන් ජනාධිපති වෙච්ච ග්‍රාමසේවක මහත්තය. ඒ මනුස්සයට ආයෙත් බලේ දෙන්න ගහපු ගේම. මම රනිල් හරි මිනිහෙක් හොඳ මිනිහෙක් කියන්නෙ නෑ. ඒත් එතෙන්දි මිනිහ හරි. ඕක තමයි කන්ඩ හිතිච්චාම කබරයා තලගොයා වෙනවා කියල.

"දරුවනේ, ඔය දෙන්න ගන්නෙ නැද්ද? මට තනියම බෝතලේ ගන්න බෑ" කී ඔහු ටිකක් වක්කරගෙන බෝතලය දිගු කෙළේය.

ජෝන් අංකල් කියන අන්දමට ඔහු ප්‍රජාතන්ත්‍රවාදී මිනිහෙකි. පවුලේ සියලු සාමාජිකත්වයටද ඒ නිදහස තිබේ. ඒ ප්‍රජාතන්ත්‍රවාදය දෙආකාරය. බීපු වෙලාවට සහ නොබිවූ වෙලාවට වශයෙන් ප්‍රභේද දෙකකි. ඔහු නොබී සිටින වෙලාවට කවුරුන් සමග හෝ පවත්වන සාකච්ඡාවකදී විරුද්ධ පාක්ෂිකයාට ඕනෑම තර්කයක් ඉදිරිපත් කළ හැකිය. ඒ සියල්ලටම සංසුන්ව සවන්දෙන ඔහු ඒවාට නොපැකිලවම පිළිතුරු දෙන්නේය.

එහෙත් බීපුවෙලාවට විරුද්ධවාදියාට ඇත්තේ ඔහු කියන දේ අසා සිටීමේ ප්‍රජාතන්ත්‍රවාදය පමණි. ඒ අවස්ථාවක ප්‍රතිවාදයාට වචනයක් කතා කරනවා තබා කට අරින්නටද බැරිය. අප පමණක් නොව අසල්වැසියෝ පවා ඔහුගේ ප්‍රජාතන්ත්‍රවාදය ගැන හොඳින් අවබෝධ කරගෙන උන්හ.

ඒ කාලෙ රනිල්ට මහින්ද ලොක්කා හොරා, හොරා කියල පාර්ලිමේන්තුවෙදි කෑගැහුවා. මහින්ද හොරා හොරා කියල රනිල කෑගැහුවා. අරගලේ කොල්ලො ටික රටේ වෙනසක් කෙරුවට පස්සෙ රාජ පස්ස පවුල නන්නත්තාර වුණා.

කල්ප තුනක් ඉස්සරහට පස්සට පේන මහින්ද ලොක්ක ඒක දැනගත්ත. මහින්ද ලොක්කා දෙසැරයක් ජනාධිපතිකමේ හිටිය නිසා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ආයෙ එන්න බැරි බවත් දන්නවා. පැනල ගිය ගෝඨාට ආයෙ එන්නත් බෑ. මොකක් හරි මඟුලක් වුනොත් පැනලා යන්ඩ තැනක් තියෙන්න ඕනෑ නිසා බැසිල්තුමා ඇමෙරිකාවෙ පුරවැසිකම අත්අරින්නෙත් නෑ. ඒ නිසා මෑන්ට ජනාධිපතිකමට ඉදිරිපත්වෙන්නත් බෑ. නාමල්ට තාම කාලෙ මදි. ඒ නිසා කොහොමද පුත්තදරස්ස සංඝ හෝ කියන බුද්ධ වචනය ආරක්ෂා කරගන්නෙ? එකෙක් පවුලේ බූදලය රැකගන්න විශ්වාසවන්ත බහිරවයෙකුට (බූදල් රකින මළ යක්ෂයා - පෙරේතයා - බහිරවයාය) පැවරිය යුතුය. මේ බහිරවයා තුන් ලෝකයේ කොතැනක ඇත්දැයි මහින්ද උන්නැහේ අහස පොළොව ගැටගහමින් දිවා රෑ කල්පනා කෙරුව.

හත් දෙයියනේ ආයෙ කොහෙන්වත් හොයන්න ඕනැයෑ. දෙයියො කකුල් දෙක ළඟටම ගෙනැත් දීල තියෙන්නෙ මරු බඩුව. කතපුඤ්ඤතාව (පෙර කළ පිං) කියන්නෙ ඕකටයි. තමන්නෙ වැඩේට ලෝකෙ ඉන්න ඉතාම සුදුස්සා. පරම්පරාවට දෙයි කියල බයවෙන්ඩ කාරණේකුත් නෑ. නන්නත්තාර වෙලා හිටිය අපේ ලොක්කට ධ්‍යානාන්තරේ ලැබුණෙ ඒ නිසයි.

කල්ප තුනක් ඉස්සරහට පස්සට පේන ඉසිවරයට ළඟ තියෙන ගොම තැම්බ පෑගෙනව වාගෙ තමන්ටත් වැරදුණාද කියල දැන් මහින්ද ලොක්කගෙ පපුව ගැහෙනව. ඇයි ? දූන් ලොක්ක රංගේලා, වජිරලා, ප්‍රසන්නලා, ඉස්සරහට දාගෙන තවත් රවුමක් පුටුවෙ ඉන්න වැඩ කරන නිසා. ඒත් රනිල් ආපුග මන් ජපානෙන් ඩොලර් බිලියන හතරක් ලැබෙනව කීවා. වෙනත් රටවලින් ලැබෙනව කීවා. ඒව නෑ. දූන් 2048 වෙනකං මැරෙන්නෙ නැතුව ඉන්න කියල හාල් කිලෝ කීයක්ද දෙනව. ඒ අතරෙ I.M.F දෙනවලු.

ජෝන් අන්කල් අඩන්න පටන් ගත්තේය. ගුණේ බෝතලේ උස්සා බැලුවේය. අඩියේ ටිකක් තිබිණි. ඔහු එය වීදුරු දෙකට වක්කර

"ඒයි අපේ බ්‍රාහ්මණ කුක්ක දමනය කරන්ඩ අර මංතරෙත් බැරිද?" මා දෙස බලා මිමුණුවේය.

"මංතර අහන්නෙ රජකුලේ නාගයින්ඩ මිසක් ගැරඬින්ඩ නෙමේ" මම කීවෙමි.

තවත් විනාඩි හත අටක් එසේම ගෙවී ගියේය.

"දූං යං අනේ අපටත් බඩගිනියි" ඉස්කෝල හාමිනේ නැගිට්ටාය. සීතාගේත් උදව්වෙන් ජෝන් අංකල් නිදගන්න යැව්වේය.

"මාරෙ අයියෙ මොකටද ඔය දෙන්න හිනාවුණේ" තාත්තා ඇඳට දමා ආ සීතා ඇසුවාය.

"මං දන්නෙ නෑ ඔයාම මහත්තයගෙන් අහගන්ඩ" අනතුරුව අපි නිදගන්ඩ ගියෙමු. ටික වෙලාවකින් ඇසුණු සීතාගේ හිනාව පාන්දර දෙක පමණ වනතුරුත් වරින් වර ඇසුණේය.

"මොකද යකෝ මටවත් නිදගන්න දෙන්නැද්ද?" මම බෙරිහං තැලුවෙමි.

"මාරෙ අයියෙ මෙයා මාව හිනස්සෝනව." ඇය හිනාව නිසා අමාරුවෙන් කියාගත්තාය.

"අර බුද්ධ මංතරේ කියහං තෝදෙයියනං බ්‍රාහ්මණ කැල්ල නැතුව හිටු කුක්ක හිටු කියල" සීතාගේ හිනාව ඩබල් වූවේය.




## යුනිලිවර් ශ්‍රී ලංකා සමාගම, මධ්‍යම පරිසර අධිකාරිය හා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය සමග එක්ව තිරසාර අනාගතයක් වෙනුවෙන් හවුල්කාරීත්වයකට එළඹෙයි

යුනිලිවර් ශ්‍රී ලංකා සමාගමේ පුළුල් තිරසාර න්‍යාය පත්‍රයේ කර්තව්‍යයක් ලෙස සිය සමාගමෙන් අලෙවි කරනු ලබන භාණ්ඩයන්ගේ ඇසුරුම්වල අඩංගු ප්ලාස්ටික් ප්‍රමාණයට සමාන ප්‍රමාණයක් නැවත එකතු කරගැනීමට ඔවුන් කැපවී සිටියි. මෙම වැඩසටහන්වල දිගුවක් ලෙස, මෙරට ජනතාවගෙන් මිලියන 04ක දෛනික පානීය ජල අවශ්‍යතාව සපුරාලනු ලබන කැලණි ගංගාවේ සෞඛ්‍යාරක්ෂිත බව ඉහළ නැංවීමට රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරීත්වය සවිබල ගන්වමින් යුනිලිවර් ශ්‍රී ලංකා සමාගම, මධ්‍යම පරිසර අධිකාරිය සහ සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය සමග අවබෝධතා ගිවිසුමකට අස්සන් තැබීම පසුගියදා සිදුවිය.











යුනිලිවර් ශ්‍රී ලංකා සමාගමේ සභාපති හා විධායක නිලධාරි අලි තාරික් මහතා මෙම අවස්ථාව පිළිබඳ මෙසේ සිය අදහස් දැක්වීය.

'ප්ලාස්ටික් සඳහා චක්‍ර ආර්ථිකයක් නිර්මාණය කිරීමේ අපගේ ප්‍රයත්නය තුළදී පසුගිය වසර 02 පුරාවට අප සමාගමෙන් අලෙවි කරනු ලබන භාණ්ඩයන්ගේ ඇසුරුම්වල අඩංගු ප්ලාස්ටික් ප්‍රමාණයට සමාන ප්‍රමාණයක් නැවත එකතු කරගැනීමට අපට හැකියාව ලැබී තිබෙනවා. මෙම හවුල්කාරීත්වය තුළින් ප්ලාස්ටික් නිෂ්පාදනයන් සඳහා වූ නිෂ්පාදකයාගේ වගකීම් ඉටුකිරීම පිළිබඳ ජාතික අරමුණට අපගේ දායකත්වය පෙන්නුම් කරනු ලබනවා. පිරිසිදු කැලණි ගඟක් තුළින් සුරක්ෂිත පානීය ජලය පමණක් නොව ධීවර හා සංචාරක ව්‍යාපාර සඳහා වඩා යහපත් පසුබිමක් ද සමාජය තුළ තිරසාර ජීවන රටාවක් බිහිවීමටද උපකාරී වෙනවා.'

මධ්‍යම පරිසර අධිකාරියේ සභාපති වෙනුර ප්‍රනාන්දු මහතා මෙසේ සිය අදහස් දැක්වීය.

'සහයෝගීතා හා හවුල්කාරීත්වයන් තුළින් නිෂ්පාදන වගකීම් ඉටුකිරීමට යුනිලිවර් ශ්‍රී ලංකා සමාගම පියවර ගැනීම දැකීමට ලැබීම ප්‍රශංසනීය කරුණකි. කැලණි ගඟ පිරිසිදු කිරීමේ ව්‍යාපෘතිය සඳහා යුනිලිවර් ශ්‍රී ලංකා සමාගමේ දායකත්වය එයට කදිම නිදසුනක්. මෙවැනි රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරීත්වයන් පාරිසරික අභියෝගයන්ට සාර්ථකව මුහුණ දීමේ තීරණාත්මක කාර්යභාරයක් ඉටුකරන අතරම, තිරසාර අනාගතයක් සඳහා මෙම හවුල්කාරීත්වය බෙහෙවින් ඉවහල් වනු ඇත.'

මෙම පස් අවුරුදු අවබෝධතා ගිවිසුම යටතේ කැලණි ගඟ දෙපස, වෙරළ හා මුහුදු පතුල පිරිසිදු කිරීමේ වැඩසටහන් ඇතුළු වැඩසටහන් රාශියක් අන්තර්ගත වේ. එසේම ප්‍රාදේශීය සභා සමග එක්ව පාසල් සිසුන් සහ නිවැසියන් අතර පාරිසරික දැනුවත්භාවය ඉහළ නැංවීම සඳහා ප්‍රජා සහභාගිත්ව වැඩසටහන්, පළාත් පාලන ආයතන සේවකයන් සඳහා පුළුල් පුහුණු වැඩසටහන්, ජල දූෂණය වැළැක්වීම සඳහා පාවෙන බාධක ස්ථාපනය කිරීම ඇතුළු ක්‍රියාකාරකම් රාශියක් ක්‍රියාත්මක වේ. මෙම ක්‍රියාකාරකම් මගින් ගං මෝය කෙරෙහි අවධානය යොමුකරමින් වෙරළබඩ පරිසර පද්ධතිවල සහ සාගර ජීවීන්ගේ සුරක්ෂිතභාවය ඉහළ නැංවීම මෙහිදී සිදුකරයි.

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ සභාපති අසේල රැකව මහතා මෙසේ සිය අදහස් දැක්වීය.

'මෙම ව්‍යාපෘතිය සඳහා සමුද්‍ර පරිසර ආරක්ෂණ අධිකාරිය සිය පූර්ණ සහයෝගීත්වය දක්වන අතර අපගේ වටිනා සාගර පරිසර පද්ධතිය ආරක්ෂා කරගැනීමේ වැදගත්කම අප හඳුනාගෙන තිබෙනවා. එසේම කැලණි ගඟ සෘජුවම සාගරයට ගමන් කරන අතර අපගේ සාගර සම්පත් ආරක්ෂා කරගැනීම සඳහා ඵලදායී ලෙස අපද්‍රව්‍ය කළමනාකරණය බෙහෙවින් වැදගත් වේ.'

මෙම ව්‍යාපෘතිය යුනිලිවර් ශ්‍රී ලංකා සමාගමේ පුළුල් තිරසාරමය න්‍යාය පත්‍රයට එක්වන තවත් වැදගත් කර්තව්‍යයක් ලෙස සැලකිය හැකිය. යුනිලිවර් ශ්‍රී ලංකා සමාගමේ මෙම කැපවීම පාරිසරික යහපැවැත්මෙන් ඔබ්බට යමින් දේශගුණික විපර්යාස විසඳීම, සොබාදහම ආරක්ෂා කිරීම, වගකිව යුතු ප්ලාස්ටික් භාවිතය ප්‍රවර්ධනය කිරීම සහ ජීවනෝපායන් නගාසිටුවීමට පරිසර හිතකාමී පද්ධතියක ඇති වටිනාකම හඳුනාගැනීම යන කර්තව්‍යයන් ඔස්සේ ක්‍රියාත්මක වේ.